# ශ්‍රී ලංකා
# දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම



2025-2029



# සුපිළිපන් ශ්‍රී ලංකාවක්

දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම 2025-2029

අංක 25/0482/801/008 හා 2025.03.24 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව
මෙම දූෂණ විරෝධි ජාතික ක්‍රියාකාරි සැලැස්ම 2025-2029 සඳහා
අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත.

දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම - 2025-2029 සඳහා
මාර්ගගතව ප්‍රවේශ වීමට QR කේතය ස්කෑන් කරන්න.

ISBN 978-624-5040-21-6

**ප්‍රකාශනය**

**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව**
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

36, මලලසේකර මාවත, කොළඹ 07, ශ්‍රී ලංකාව.
Tel: +94 112 596360 / 1954
Mob: +94 767011954
E-mail: ciaboc_gen@ciaboc.gov.lk

# සුපිළිපන් ශ්‍රී ලංකාවක්

## දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම
## 2025-2029

www.ciaboc.gov.lk


**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව**

இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களைப் புலனாய்வு செய்வதற்கான ஆணைக்குழு

COMMISSION TO INVESTIGATE ALLEGATIONS OF BRIBERY OR CORRUPTION

# පටුන


**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපතිතුමාගේ පණිවිඩය** 07

**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ කොමසාරිස්වරුන්ගේ පණිවිඩය** 09

**සංක්ෂිප්ත සහ කෙටි යෙදුම් ලැයිස්තුව** 11

**දැක්ම** 13

**පෙරවදන** 15

**01. හැඳින්වීම සහ පසුබිම** 17

**02. 2025-2029 දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේ ක්‍රියාවලිය** 21
- අ. සංවිධානගත ක්‍රියාවලිය සහ හිමිකම 21
- ආ. ක්‍රමවේද 21

**03. ශ්‍රී ලංකාවේ දූෂණ තත්ත්වය** 27
- අ. අංශමය අවදානම් 27
- ආ. දූෂණයේ ස්වභාවය, හේතු සහ බලපෑම් 31
- ඇ. දූෂණය පාලනය කිරීමේ ක්‍රියා මාර්ග 34

**04. 2019-2023 ශ්‍රී ලංකාව තුළින් අල්ලස් හා දූෂණය වැලැක්වීම සඳහා වන ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම පිළිබඳ සමාලෝචනය/ඇගයීම.** 37
- අ. ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය 37
- ආ. ප්‍රධාන ගැටලු සහ අභියෝග 38

**05. කාවයක සටහන්** 41

**06. ක්‍රියාකාරී සැලැස්ම - උපාය මාර්ගික ප්‍රමුඛතා ක්ෂේත්‍ර** 45
- අ. නිවාරණ කටයුතු 51
- ආ. අධ්‍යාපනය සහ ප්‍රජා සහභාගීත්වය 91
- ඇ. ආයතනික ශක්තිමත් කිරීම සහ ක්‍රියාත්මක කිරීම 117
- ඇ. නීතිය සහ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ 137

**07. දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය සහ ඇගයීම.** 147
- අ. අධීක්ෂණයේ සහ ඇගයීම්වල අරමුණු 147
- ආ. අධීක්ෂණ ව්‍යුහය සහ කණ්ඩායම 148
- ඇ. දර්ශක සහ වාර්තාකරණය 149
- ඇ. ක්‍රියාත්මක කිරීමෙන් පසු අධීක්ෂණය සහ ඇගයීම 149

**කෘතවේදීත්වය** 157

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපතිතුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකාවේ සමස්ත සමාජ දේහය පුරාම විසිර පවතින අල්ලස හා දූෂණය පිටුදැකීමටත්, දූෂණය පිළිබඳ දර්ශකයන්හි අප රටට හිමිව පැවති අයහපත් පරිසාධන මට්ටම් හේතුවෙන්, අහිමිව ගිය ආර්ථික අවස්ථා යළි ජනනය කර ගැනීම සඳහාත් අප රජය ගෙන යන මෙහෙවරට සවිමත් ප්‍රවේශයක් ලෙස දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම 2025-2029 එළිදැක්වීම සම්බන්ධව පණිවිඩයක් නිකුත් කිරීමට ලැබීම ඉතා සතුට දනවන්නකි.

නිදහසෙන් පසු දශක හතක් ගත වී තිබුණ ද  අප රට සංවර්ධිත රාජ්‍යයක් බවට පත් වීමට අසමත්ව ඇත. ශක්තිමත් නිෂ්පාදන ආර්ථිකයක් සහිත දියුණු නූතන ශ්‍රී ලාංකේය රාජ්‍යයක් තැනීමේ වගකීම භාර ගත් අප රජය, රට තුළ ඇති  දූෂණ ප්‍රභවයන් හඳුනා ගනිමින්, ඒවා මුලිනුපුටා දැමීමේ භාරදූර වගකීමට උර දෙමින් සිටී. සියලුදෙනාටම සාධාරණ හා සමාන ප්‍රවේශයක් සහිත අධිකරණ පද්ධතියක් ඇති කිරීමද, ස්වාධීනව හා කාර්යක්ෂමව යුක්තිය පසිඳලීමද, එම නෛතික ක්‍රියාවලිය පිළිබඳව ප්‍රජාවෙහි විශ්වාසය තහවුරු කිරීමද නීතියේ ආධිපත්‍යය ස්ථාපනයෙහි ලා අතිශයින් වැදගත් වේ. ඒ සඳහා සවිමත් මුල් පියවර තබමින් ඇති විටෙක, දූෂණය මර්දනය කිරීමෙහි පුරෝගාමී ආයතනය වන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් අත්කර ගනු ලබන කාර්යසාධනය සෘජුවම අල්ලස හා දූෂණය පිටුදැකීම පිළිබඳ රජය අපේක්ෂා කරන කාර්යසාධනය හා බැඳී පවතී.

''දැකුම්කලු දිවයිනක්, සොම්නසින් පිරි ජනතාවක්'' යන දැක්මෙන් යුතුව රජය ක්‍රියාත්මක කරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය  වැඩසටහනෙහි ''සදාචාරාත්මක පරමාර්ථ'' යථාර්ථයක් බවට පත්කිරීමේදී විනිවිදභාවය, වගකීම සහ වගවීම මූලික කර ගත් පුරවැසි ආචාරධාර්මික පැවැත්ම ප්‍රවර්ධනය කිරීම රජයේ අපේක්ෂාව වේ.  මෙම පරමාර්ථ ඉෂ්ට කර ගැනීමට නම් දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රධාන උපාය මාර්ග හතරෙහි (04) ඇතුළත් ආනුෂංගික ක්‍රියාකාරකම්වලට අදාළ ඉලක්ක නිසි පරිදි ළඟා කර ගැනීම අතිශයින් වැදගත්ය. මෙම ක්‍රියාකාරකම්වල වගකීම රේඛීය අමාත්‍යාංශවල සිට ප්‍රාදේශීය ආයතනික මට්ටම දක්වා ධුරාවලිය තුළ විහිදී ඇත. ක්‍රියාකාරී සැලැස්මෙහි මූලික කාර්යයන් ඉටු කිරීම, අධීක්ෂණය සහ ප්‍රගති සමාලෝචනය පිළිබඳ වගකීම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සතු වේ. මෙම භාරදූර වගකීම නොපිරිහෙළා ඉටුකිරීම තුළ දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්මේ සාර්ථකත්වය රඳා පවතී.  එහෙයින් ඒ ඒ ක්‍රියාකාරකම්හි වගකීම පැවරෙන අනෙකුත් ආයතන ද තම වගකීම ඉටුකිරීම අත්‍යවශ්‍ය කරුණකි.

මෙම සැලැස්ම සකස් කිරීමේ දී ආරම්භයේ සිට මේ දක්වා කටයුතු කළ සියලුම නිලධාරීන්ට ද, අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීමට තම දායකත්වය ලබා දුන් සියලුදෙනාට ද, මෙම වෑයම සඳහා අනුග්‍රහය ලබා දුන් විදේශීය නියෝජිතායතනවලට හා ඒවායේ නිලධාරීන්ට ද මාගේ ස්තුතිය හිමි වේ. මෙම ජාතික ක්‍රියාකාරී සැලැස්ම සාර්ථකව ක්‍රියාත්මක කිරීමෙන් ඉදිරි වසර කිහිපය තුළ ලෝකයේ රටවල් අතර අල්ලස හා දූෂණය තුරන් කිරීමේ දර්ශක අතර යහපත් ස්ථානයක් අත්කර ගැනීම අප සියලුදෙනාගේ අපේක්ෂාව විය යුතුය. ඈත ගම්දනව්වල  ඉතා දුෂ්කර දිවිපෙවෙතක් ගෙවමින් තමා උපයන සුළු මුදලින් වුව රාජ්‍ය ආදායමට දායක වන සුවහසක් ජනතාව ඇතුළුව සමස්ත ශ්‍රී ලාංකික ප්‍රජාවටම මෙම වෑයමේ ප්‍රතිඵල අත්කර දීම මෙහි අවසාන අභිප්‍රාය විය යුතුය.

**අනුර කුමාර දිසානායක**
**ජනාධිපති**
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
2025-03-28

# අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ කොමසාරිස්වරුන්ගේ පණිවිඩය

රටක ආර්ථික දියුණුව, සමාජ අභිවෘද්ධිය සහ දේශපාලන ප්‍රතිසංස්කරණ සඳහා තීරණාත්මක පදනමක් වන්නේ දූෂණය තුරන් කිරීමයි. රාජ්‍ය පාලන ප්‍රතිසංස්කරණ සහ දූෂණය වැළැක්වීම රජයේ ප්‍රමුඛතාවයක් වන අතර, ආර්ථික ස්ථාවරත්වය, වගවීම ගොඩනැගීම සහ රජය කෙරෙහි මහජන විශ්වාසය නැවත ඇති කිරීම සඳහා පිටුවහලක් ලෙස ශ්‍රී ලාංකික සමාජයේ සෑම ක්ෂේත්‍රයකම අල්ලස හා දූෂණයට එරෙහිව සටන් කිරීම සඳහා රජය විසින් පියවර ගනිමින් සිටී. අල්ලස හා දූෂණය වැළැක්වීම සඳහා ශ්‍රී ලංකාවේ නීති සහ රෙගුලාසි කිහිපයක් ඇති නමුත් ඒවා වඩාත් ඵලදායීව ක්‍රියාත්මකවීමට නම්, සියලුම රාජ්‍ය අංශයේ ආයතන හරහා ජාතික මට්ටමින් ක්‍රියාත්මකවන ප්‍රතිපතිරාමුවක් තිබීම අත්‍යවශ්‍ය වේ.

ශ්‍රී ලංකාව තුළින් දූෂණය නිවාරණය කිරීමේ ප්‍රමුඛ වගකීම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට පවරා ඇත. මේ අතර අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ කාර්යභාරය 2023 අංක 09 දරන දූෂණ විරෝධී පනත මඟින් වැඩි දියුණු කර ඇත. මෙමඟින් අල්ලස් හා දූෂණ සම්බන්ධ වැරදි විමර්ශනය කිරීමේ සහ නඩු පැවරීමේ සිට ශ්‍රී ලංකාව පුරා අල්ලස හා දූෂණ තුරන් කිරීම සඳහා දූෂණ විරෝධී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහ නියාමනය කිරීම දක්වා කොමිෂන් සභාවේ වගකීම් පුළුල් වී ඇත.

එමෙන්ම රජයේ "Clean Sri Lanka" වැඩසටහන යටතේ ශ්‍රී ලාංකික සමාජය ආර්ථික, සමාජීය සහ පාලනය යන අංශයන්හි තිරසරභාවය ඉහළ මට්ටමකට ඔසවා තැබීමට ද උත්සාහ කරන බැවින්, සියලු අංශ හරහා ක්‍රියාත්මක වන ශක්තිමත් ජාතික දූෂණ විරෝධී ප්‍රතිපත්තියක් සකස් කර ක්‍රියාත්මක කිරීම ඉතා වැදගත් වේ.

දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතියේ 5 වන වගන්තිය යටතේ ඇති බැඳීම්වලට අනුකූලව, 2019 - 2023 කාලය සඳහා සකසන ලද ශ්‍රී ලංකාව තුළින් අල්ලස හා දූෂණය වැළැක්වීම සඳහා වන ජාතික ක්‍රියාකාරී සැලැස්මේ කාලය ඉකුත්වීමත් සමඟ එම සැලැස්මේ දායකත්වයන් සහ සමාලෝචනවලින් උගත් අත්දැකීම් ද පදනම්කරගනිමින් ශ්‍රී ලංකාව පුරා සිදුකරන ලද සියලු පාර්ශ්වකරුවන්ගේ අදහස් හා යෝජනා ද සැලකිල්ලට ගනිමින්, 2025 සිට ශ්‍රී ලංකාවේ දූෂණ විරෝධී ප්‍රයත්නවල ඵලදායීතාවය ඉහළ නැංවීමේ අරමුණින් දේශීය හා ජාත්‍යන්තර පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වයෙන් 2025-2029 සඳහා දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඇත.

2025-2019 සඳහා වන දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම දූෂණ නිවාරණය, අධ්‍යාපනය සහ ප්‍රජා සහභාගිත්වය, දූෂණයට එරෙහිව කටයුතු කරන ආයතන ශක්තිමත් කිරීම හා නිතිය ක්‍රියාත්මක කිරීම, සහ නීතිය හා ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ යන ප්‍රධාන උපාය මාර්ගයන් හතරක් ඔස්සේ නිර්මාණය කර ඇත. එය අප රටේ සාර්ථකව ක්‍රියාත්මක කිරීමට නම් සියලුම අංශවල එනම් අමාත්‍යාංශ දෙපාර්තමේන්තුව ඇතුළු සියලු රාජ්‍ය අංශයේ, පෞද්ගලික අංශයේ, සිවිල් සමාජයේ සහ අනිකුත් සෑම ක්ෂේත්‍රයකම, සියලු පුරවැසියන්ගේ සහයෝගීතාවය අවශ්‍ය වේ

අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලත් මෙම දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කරමින්, දූෂණයට එරෙහිව සටන් කරන, දූෂණය පිටු දකින පුරවැසියන් පිරිසක්, දූෂණයට එරෙහිව සටන් කිරීමට සියලු ආකාරයෙන් සහාය දෙන දේශපාලන කැමැත්තක්, නිතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සියලු පසුතලයත් සහ සුපිළිපන්න රාජ්‍ය සේවයක් සමඟ සියලුම ක්ෂේත්‍රයන්හි සුපිළිපන්බව ඇතිකරමින්, අනාගත පරපුරට සුපිළිපන්න රටක් උදාකරදීමට ඔබ සියලු දෙනාගේම සහයෝගීතාවය ලැබෙනු ඇතැයි බලාපොරොත්තු වෙමු.

**විනිසුරු ඩබ්ලිව්.එම්.එන්.පී. ඉද්දවල, සභාපති**
**කේ.බී. රාජපක්ෂ, කොමසාරිස්**
**ජනාධිපති නීතිඥ චේතිය ගුණසේකර, කොමසාරිස්**
**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව**

# සංක්ෂිප්ත සහ කෙටි යෙදුම් ලැයිස්තුව

| | |
|---|---|
| AD | - වත්කම් ප්‍රකාශනය |
| BOI | - ආයෝජන මණ්ඩලය |
| CIABOC | - අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව |
| CID | - අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව |
| CIDA | - ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය |
| COPA | - රාජ්‍ය ගිණුම් කාරක සභාව |
| COPE | - පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව |
| CSR | - සමාජ සත්කාරක වගකීම් |
| CPI | - දූෂණ සංජානන දර්ශකය |
| CSO | - සිවිල් සමාජ සංවිධානය |
| DG | - අධ්‍යක්ෂ ජනරාල් |
| EFC | - ලංකා සේවායෝජකයන්ගේ සම්මේලනය |
| FIU | - මූල්‍ය බුද්ධි ඒකකය |
| FCID | - මූල්‍ය අපරාධ විමර්ශන අංශය |
| GOSL | - ශ්‍රී ලංකා රජය |
| GSP+ | - පොදු වර්ණීය ක්‍රමය |
| ICT | - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය |
| ICTA | - ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනය |
| LG | - පළාත් පාලන |
| MOU | - අවබෝධතා ගිවිසුම |
| NAO | - ජාතික විගණන කාර්යාලය |
| OECD | - ආර්ථික සහයෝගීතාවය සහ සංවර්ධනය සඳහා වූ සංවිධානය |
| OGP | - විවෘත රාජ්‍ය හවුල්කාරිත්වය |
| PA | - මහජන නිවේදන |
| PSC | - රාජ්‍ය සේවා කොමිෂන් සභාව |

**කෙටි යෙදුම් ලැයිස්තුව**

| | |
|---|---|
| MOFA | - විදේශ කටයුතු අමාත්‍යාංශය |
| MOPA | - රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය |
| MOLG&PC | - පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය |
| NAP | - අල්ලස හා දූෂණය වැළැක්වීම සඳහා වන ජාතික ක්‍රියාකාරී සැලැස්ම 2019-2023 |
| NIS | - ජාතික සුපිළිපන් අධ්‍යයනය 2014 |
| PEFA | - රාජ්‍ය වියදම් සහ මූල්‍ය වගවීම |
| POCA | - අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනත |
| SLIDA | - ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය |
| SLILG | - ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනය |
| SDG | - තිරසර සංවර්ධන අරමුණු |
| SEC | - සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව |
| SOP | - සම්මත මෙහෙයුම් පටිපාටිය |
| STAR | - රාජ්‍ය වත්කම් නැවත අයකර ගැනීම සඳහා වන විශේෂ ජනාධිපති කාර්ය සාධන බලකාය |
| TEC | - තාක්ෂණික ඇගයීම් කමිටුව |
| TOR | - යොමු කිරීමේ අනුදේශ |
| RTI | - තොරතුරු දැන ගැනීමේ අයිතිය |
| UNDP | - එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන |
| UNODC | - මත්ද්‍රව්‍ය හා අපරාධ සම්බන්ධයෙන් වෙන එක්සත් ජාතීන්ගේ කාර්යාලය |
| UNCAC | - දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය |

# දැක්ම

ශ්‍රී ලංකාව ලොව විශිෂ්ටතම දේශයක් බවට පත් කිරීම උදෙසා,
සුපිළිපන් හදැති අභිමානවත් ශ්‍රී ලාංකේය පරපුරක් බිහි කිරීම
පරමාදර්ශී අභිලාෂය හා දැක්ම වන්නේය.



# පෙරවදන

"සුපිළිපන්බව, විනිවිදභාවය සහ දූෂණයට එරෙහි සටන සංස්කෘතියේ කොටසක් විය යුතු ය. ඒවා මූලික වටිනාකම් ලෙස ඉගැන්විය යුතු ය"

ඒන්ජල් ගුරියා, මහලේකම්, ආර්ථික සහයෝගීතාව සහ සංවර්ධනය සඳහා වූ සංවිධානය (OECD).

ඉතිහාසයේ ඉතා දියුණු ශිෂ්ටචරයකින් හා සංස්කෘතියකින් පරිපූර්ණව සිටි ශ්‍රී ලංකාව අද පවතින තත්වයට පත්ව ඇත්තේ කුමන හේතු නිසා ද යන්න අමුතුවෙන් සඳහන් කිරීම අවශ්‍ය නො වේ. එම හේතු අතර අල්ලස හා දූෂණයට ලැබෙන්නේ ප්‍රමුඛ ස්ථානයකි. නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ජන සමාජය තුළ අල්ලස හා දූෂණය වැඩිමනත් වශයෙන් ව්‍යාප්ත වූ අතර ඒවා සමාජයේ අංගයන් ලෙස සැලකීමට තරම් සාමාන්‍යකරණය විය. ඒ අනුව ශ්‍රී ලංකාවේ පුරාණ ජන සමාජය සතුව පැවති වටිනාකම් හීන වෙමින් අල්ලස දූෂණය පෙරට පැමිණි බව ඉතිහාසය අධ්‍යයනය කිරීමේ දී පෙනී යයි. ලෝකයේ දියුණු රටවල් සුපිළිපන්බව, විනිවිද බව, වගවීම, දූෂණයට එරෙහිවීම සමාජයේ මූලික හරයන් ලෙස පිළිගැනීමට පෙර සිට පවා දියුණු සංස්කෘතියක් පැවති ශ්‍රී ලංකාවේ එම හරයන් ප්‍රමුඛස්ථානයේ ලා සලකා ඇති බව ඉතිහාසය අධ්‍යයනයේ දී පැහැදිලි වේ. ඒ අනුව එම හරයන් ශ්‍රී ලංකා සංස්කෘතියට ආගන්තුක හරයන් නො වේ. සිදු වී ඇත්තේ එම හරයන් අභිබවා අල්ලස හා දූෂණය සමාජගත වීමයි.

2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත, අන්තර්ජාතික උපමානයන් අනුව යමින් ඉහතින් දැක්වූ වටිනාකම් නැවත ශ්‍රී ලංකාවේ ස්ථාපිත කිරීම වෙනුවෙන් හැඳුවා දී ඇති පනතක් බව පැහැදිලිව පෙනී යයි. ඒ අනුව හුදෙක් අල්ලස් හෝ දූෂණ වැරදි සිදුකරනු ලබන පුද්ගලයන්ට එරෙහිව නඩු පවරා දඬුවම් ලබා දීමෙන් ඔබ්බට ගොස් ඉහතින් දක්වන ලද වටිනාකම් නැවත සමාජය තුළ ස්ථාපනය කිරීම තුළින් අල්ලස හා දූෂණයට එරෙහිව සමාජය විසින්ම නැගී සිටින තත්වයක් ඇති කිරීම පනතේ මුඛ්‍ය අරමුණ වන බව පැහැදිලිය. දූෂණ විරෝධී පනතේ පරමාර්ථයන් සලකා බැලීමේ දී අල්ලස හා



දූෂණය වැළැක්වීමේ වගකීම රාජ්‍යක් ලෙස සියලුදෙනාට පැවරෙන බව අවධාරණය කර ඇති බැවින් පනතේ පරමාර්ථයන් ඉටුකර ගැනීම රජයට හෝ එක ආයතනයකට සිදුකළ හැක්කක් නොවේ. ඒ සඳහා රටේ සියලුම පාර්ශවයන්ට වගකීමක් පවතින අතර එය ජාතික වගකීමකි.

දූෂණ විරෝධී පනතේ පරමාර්ථයන් සමග ඒකාත්මික වෙමින් පනතේ පරමාර්ථයන් සාක්ෂත් කර ගැනීම සඳහා සියලු පාර්ශ්වයන් දායක කර ගැනීම පිණිස ජාතික ක්‍රියාකාරී සැලැස්මක් තිබිය යුතු අතර ප්‍රතිපත්තිමය රාමුවක සිටිමින් සියලු දෙනා විසින් දූෂණ විරෝධී පනතේ පරමාර්ථයන් ලඟා කර ගැනීම ජාතික ක්‍රියාකාරී සැලැස්මේ අරමුණ යි.

2025-2029 පස් අවුරුදු ජාතික ක්‍රියාකාරී සැලැස්ම සැකැස්ම සකස් කිරීමේ දී කොමිෂන් සභාව, දූෂණ විරෝධී පනතින් එයට ලැබී ඇති බලතල අනුව ප්‍රමුඛස්ථානය ගත්තේ වුවද මෙම සැලැස්ම සමාජයේ සියලු ජන කොට්ඨාසයන්ගේ සහභාගිත්වයෙන් සකස්කරන ලද සැලැස්මකි. ඒ අනුව එම සැලැස්ම නිසි පරිදි ක්‍රියාවට නැංවීම සමාජයේ සියලු ජන කොට්ඨාසයන්ගේ වගකීමකි. 2025-2029 පස් අවුරුදු කාලසීමාව තුළ ක්‍රියාවට නැංවීමට අපේක්ෂිත මෙම ක්‍රියාකාරී සැලැස්ම තුළ ජන ප්‍රජාව අල්ලස හා දූෂණයට විරුද්ධවෙමින්, ඒවායින් ශ්‍රී ලංකාව මුදා ගැනීම පිණිස පෙරට එනු ලබන පිරිසක් බවට පත් කිරීම මෙන්ම එක් එක් පුද්ගලයාගේ පෞද්ගලික හරයන් ශක්තිමත් කිරීම තුළින් සුපිළිපන්නභාවයෙන් පිරිපුන් මිනිසුන් සිටින සමාජයක් ඇති කිරීම මෙම ක්‍රියාකාරී සැලැස්ම තුළින් බලාපොරොත්තු වේ.

එසේම තවදුරටත් සුපිළිපන්නභාවය, අල්ලස හා දූෂණයට විරුද්ධවීම, විනිවිදභාවය වැනි චරිත ලක්ෂණයන් පුද්ගලයෙකු තුළ වර්ධනය වන්නේ ඔවුන්ගේ ළමාකාලයේ සිට ය. එවැනි දරු පරපුරක් අනාගතයේ නිර්මාණයකර ගැනීම, අල්ලස දූෂණය ශ්‍රී ලංකා ධරණීතලයෙන් අතුගා දමන්නට හේතුවන බව අපි දැඩි ලෙස විශ්වාස කරමු. එවැනි උසස් ගුණයන්ගෙන් පිරිපුන් මිනිසුන් බිහිකිරීම සඳහා වන පියවරයන් මෙම දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම තුළ අන්තර්ගත අතර අනාගතයට අප විසින් කරනු ලබන ඉහළම ආයෝජනය එය බව විශ්වාස කරමු.

සියලු නීතින් සහ සැලසුම් මඟින් අවසානයේ සාක්ෂාත්කර ගැනීමට අපේක්ෂා කරන්නේ අල්ලස සහ දූෂණයෙන් තොර නැවතත් පුරාණයේ පැවති ගෞරවාන්විත ශ්‍රී ලංකාව වන අතර අප සියලු දෙනා බලාපොරොත්තු වන එම රට ගොඩනගා ගැනීම සඳහා ඉදිරි වසර පහක කාලය තුළ මෙම ක්‍රියාකාරී සැලැස්ම තුළ සාධනීය පියවරයන් ගත හැකි බව මම දැඩි ලෙස විශ්වාස කරමි. එසේම රටේ සියලුම ජනතාව මෙම ක්‍රියාකාරී සැලැස්මේ මුඛ්‍ය අරමුණු ගැඹුරු ලෙස ග්‍රහණයකර ගනිමින් තම තමන් වෙත පැවරී ඇති වගකීම නිසි ලෙස ඉටු කරනු ඇතැයි මම විශ්වාස කරමි. එවිට ඉදිරියේ දී අප පැතූ සෞභාග්‍යමත් දේශය අපට දැකගත හැකි වනු ඇත.

**රංග දිසානායක**
**අධ්‍යක්ෂ ජනරාල්**
**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව**

# 01. හැඳින්වීම සහ පසුබිම

ශ්‍රී ලංකාව දූෂණයෙන් තොර, පූර්ණ සංවර්ධිත ජාතියක් වීමේ අරමුණ පෙරදැරිව ගමන් කරමින් සිටින අතර, දූෂණයට එරෙහි වීම ජාතික න්‍යාය පත්‍රයේ ප්‍රමුඛතම කාරණයක් බවට පත්ව ඇත. දූෂණය රජයේ ආයතනවල සුපිළිපන්න මෙන්ම පුරවැසියන්ගේ යහපැවැත්මට හානිකර බව වටහා ගනිමින්, එය සම්පූර්ණයෙන්ම මැඩලීමේ හදිසි අවශ්‍යතාවය ශ්‍රී ලංකා රජය හඳුනා ගනියි. ශ්‍රී ලංකාව 2004 වර්ෂයේ දී දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ ප්‍රඥාප්තියට (UNCAC) අත්සන් තැබීය. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට 19 වන සංශෝධනය මඟින් දූෂණ විරෝධී න්‍යාය පත්‍රයක් සැකසීම සඳහා කැපවීම ප්‍රකාශිතව දක්වන ලද අතර, එය 21 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ දී නැවත අවධාරණය කෙරිණි. 21 වන සංශෝධනය මඟින් ව්‍යවස්ථාදායක සභාව සහ ස්වාධීන කොමිෂන් සභා නැවත පිහිටුවීමත් සමඟ ප්‍රධාන ආයතනවල ප්‍රජාතන්ත්‍රවාදී පාලනය සහ ස්වාධීන අධීක්ෂණය, මහජන විමර්ශනය මෙන්ම දූෂණ විරෝධී ක්‍රියා මාර්ග යෙදවීම ශක්තිමත් කිරීම අරමුණු කෙරේ. මේ අනුව, ශ්‍රී ලංකාවේ දූෂණ විරෝධී රාමුවට ප්‍රකාශිතව ව්‍යවස්ථානුකූල පිළිගැනීමක් ලැබී ඇති අතර එය දූෂණයට එරෙහිව රටේ අලුත් කැපවීම සනාථ කිරීමකි.

2019 වර්ෂයේ දී, ශ්‍රී ලංකාවේ අල්ලස හා දූෂණය වැළැක්වීම සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්ම 2019-2023 සකස් කර ක්‍රියාත්මක කරන ලදී. මෙම ක්‍රියාකාරී සැලැස්ම, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව (CIABOC) විසින් මෙහෙයවන ලද උපදේශන ක්‍රියාවලියක ප්‍රතිඵලයකි. එයට පුළුල් මහජන සහභාගීත්වයක් ඇතුළත් වූ අතර දේශීය හා ජාත්‍යන්තර විශේෂඥයින් මෙන්ම මනා ජාත්‍යන්තර භාවිතාවන් සහ අත්දැකීම්වලින් ලැබුණු අවබෝධයන් ද ඇතුළත් වූ බැවින් ජාත්‍යන්තර ප්‍රමිතීන් ශ්‍රී ලංකාවේ සුවිශේෂී සන්දර්භයට ගැළපෙන ලෙස සකස් කර ගැනීමට හැකි විය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් 2023 වර්ෂයේ දී සිදු කරන ලද පාලන තත්ත්ව ඇගයීම (GDA) අනුව, මෙම ක්‍රියාකාරී සැලැස්ම "සාර්ථක පියවරක්"[1] ලෙස හඳුනාගෙන ඇති අතර, එමගින් දූෂණයේ අහිතකර ප්‍රතිඵල පිළිබඳව රජයේ අවබෝධය සහ එයට උපාය මාර්ගිකව මුහුණ දීමේ කැපවීම ද සනාථ වේ. මෙම ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ කාලය ඉක්ම ගොස් ඇති හෙයින් 2025-2029 කාල සීමාව සඳහා නව ක්‍රියාකාරී සැලැස්මක අවශ්‍යතාවයක් මතු වී ඇත.

ඒ සමගම, සිය ජාත්‍යන්තර වගකීම් සහ ජාතික කැපවීම්වලට අනුකූලව, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් 2023 අංක 9 දරණ දූෂණ විරෝධී පනත සම්මත කරන ලද අතර, එය දැඩි පාර්ශ්වකරුවන්ගේ උපදේශනවල සහ මනා ජාත්‍යන්තර හා දේශීය භාවිතාවන් පිළිබඳ පුළුල් අධ්‍යයනයක ප්‍රතිඵලයකි. මෙම පනත මඟින් දූෂණ විරෝධී නීතිමය රාමුව වැඩිදියුණු කෙරෙන අතර ප්‍රධාන වශයෙන් රටේ දූෂණ විරෝධී ක්‍රියා මාර්ග සහ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම සහ සාක්ෂාත් කර ගැනීම සඳහා භාරදූර කාර්යභාරයක් පැවරී ඇති ස්වාධීන කොමිෂන් සභාවක් වන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ (CIABOC) කාර්යභාරය ශක්තිමත් කෙරේ.

දූෂණ විරෝධී මුලපිරීම් ගණනාවක් ක්‍රියාත්මක කර තිබුණ ද, අවාසනාවකට රටේ දූෂණ මට්ටම පහව ගොස් නැත. 2023 පාලන තත්ත්ව ඇගයීම මඟින් දූෂණයට එරෙහිව සටන් කිරීම සඳහා වඩා උපාය මාර්ගික ප්‍රවේශයක අවශ්‍යතාව අවධාරණය කළ අතර හොඳින් සැලසුම් කරන ලද දූෂණ විරෝධී ජාතික උපාය මාර්ගවල ප්‍රයෝජනය ඉස්මතු කළේය. එනම්;

"දූෂණයට මුහුණ දීම සඳහා ක්‍රියාවන් සම්බන්ධීකරණයට සහ පාලනය ශක්තිමත් කිරීමට, ක්‍රියාත්මක කිරීම සඳහා බලතල සහ වගකීම් ස්ථාපිත කිරීමට සහ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය හා දූෂණ ප්‍රවණතා ඇතුළත් නිරීක්ෂණයට ඉඩ සැලසීමට සහය විය හැකි ය.[2]

1. IMF Sri Lanka Governance Diagnostic Assessment, 26
2. IMF Sri Lanka Governance Diagnostic Assessment, 26

වර්තමානයේ පවතින දූෂණය හේතුවෙන් දූෂණ විරෝධී මුලපිරීම්වල සඵලතාවය අවහිර වන අතර දූෂණයට එරෙහිව සටන් කිරීමට සහ රාජ්‍ය ආයතන කෙරෙහි ඇති දේශපාලන කැමැත්ත පිළිබඳව මහජන විශ්වාසය අඩු වේ. 2022 දේශපාලන හා ආර්ථික අර්බුදය හේතුවෙන්; ශ්‍රී ලංකාවේ දූෂණය පිළිබඳ මහජන මතය තව තවත් තීව්‍ර වූ අතර, රාජ්‍ය ආයතනවල හා රාජ්‍ය අංශයේ නිළධාරීන් අතර පවතින දූෂණය කෙරෙහි එය දැඩිව අවධානය යොමු කරයි. රාජ්‍ය අංශයේ දූෂණය විසඳීමෙන් හා අඩු කිරීමෙන් නීතියේ ආධිපත්‍ය කෙරෙහි මහජන විශ්වාසය සැලකිය යුතු ලෙස වැඩි කළ හැකි අතර සේවා සැපයීමේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කළ හැකි වුව ද, දූෂණය; සියලු අංශවලට හා පාලනයේ සෑම අංශයකටම ව්‍යාප්ත වී ඇති බවත්, තමන්ගේම සෘණාත්මක සංස්කෘතියක් සහ වටිනාකම් පද්ධතියක් පෝෂණය කරන බවත් පිළිගැනීම අත්‍යවශ්‍ය වේ.

මෙම මහජන මතය ප්‍රකට වූයේ ශ්‍රී ලංකාව 2023 දූෂණ සංජානන දර්ශකයේ (CPI) රටවල් 180ක් අතරින් 115 වන ස්ථානයට පත්වීමත් සමගය. එහිදී, ශ්‍රී ලංකාව 0 (ඉතා දූෂිත) සිට 100 (දූෂණයෙන් තොර) දක්වා වූ පරිමාණයෙන් ලකුණු 34ක් පමණක් ලබා ගත්තේය. 2012 වසරේ සිට ශ්‍රී ලංකාවට ලකුණු 6ක එකතුවක් අහිමිව ඇති අතර 2023 වසරේ දූෂණ සංජානන දර්ශකයේ අගය වාර්තාගත ලෙස පහළම අගය විය. එසේම, 2020 ගෝලීය දූෂණ මානයේ ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 79%ක් රාජ්‍ය දූෂණය ප්‍රධාන ගැටලුවක් ලෙස සැලකූහ. එනමුත්, ශුභදායී කරුණක් ලෙස, ශ්‍රී ලංකාවේ දූෂණ සංජානන දර්ශකය විසින් අගය කරන ලද අතර, විශේෂයෙන්ම ආර්ථික අර්බුදයට මග පෑදූ ආර්ථිකය පාලනය කිරීමේ දී හිටපු ජනාධිපතිවරයා, හිටපු අගමැතිවරයා සහ තවත් රජයේ නිලධාරීන් 11 දෙනෙකු මහජන විශ්වාසය හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) වගන්තිය උල්ලංඝනය කළ බවට 2023 ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව (SC FR අංක 195/2022 සහ SC FR අංක 212/2022) මගින් සොයා ගැනීම කැපී පෙනුණි. එබැවින්, මෙම සංස්කෘතිය; ඵලදායී ලෙස මැඩපැවැත්වීම සඳහා පුරවැසියන් ඇතුළුව රාජ්‍ය මෙන්ම රාජ්‍ය නොවන පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වයෙන් සමස්ත සමාජය වෙනුවෙන් ක්‍රියා මාර්ග ගැනීම අත්‍යවශ්‍ය වේ.

මෙවන් පසුබිමක් තුළ, විවිධ පාර්ශ්වකරුවන්ගේ දායකත්වයෙන් යුතුව, පෙර ජාතික ක්‍රියාකාරී සැලැස්ම අභිබවා යන අයුරින් 2025-2029 කාලසීමාව සඳහා වන දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම සකස් කොට ඉදිරිපත් කර ඇත. අල්ලසෙන් හා දූෂණයෙන් තොර රාජ්‍යයක් යන දැක්ම සාක්ෂාත් කර ගැනීමෙහි ලා විවිධ ආයතන සහ පුද්ගලයන්ගේ කාර්යභාරයන්, තනි තනිව මෙන්ම සාමූහිකව ද මෙම ක්‍රියාකාරී සැලැස්මේ දක්වා ඇත. ශ්‍රී ලංකාවේ දූෂණයට එරෙහි වීම හා වැළැක්වීම අරමුණු කරගත් ක්‍රියා මාර්ග උදෙසා වූ පුළුල් ප්‍රතිපත්තිමය රාමුවක් මෙන්ම, දූෂණ මර්දන ප්‍රතිපත්ති සංවර්ධනය හා ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් සම්බන්ධ වන සියලු පාර්ශ්වකරුවන්ගේ උත්සාහයන් හා සම්පත් මෙහෙයවීමට හා සම්බන්ධීකරණය කිරීමට අගනා මෙවලමක් ලෙස ද මෙය සැලකේ. තවද, ආයතන කෙරෙහි මහජන විශ්වාසය තහවුරු කරමින් අනාගත පරපුරට යහපත උදා කර දෙන සවිමත් සාරධර්මයන් පදනම් කොටගත් දූෂණ මර්දන සංස්කෘතියක් පෝෂණය කිරීමට ද අදහස් කෙරේ.

මෙම ක්‍රියාකාරී සැලැස්ම, ඵලදායී ජාතික දූෂණ මර්දන උපාය මාර්ගයක් සඳහා අත්‍යවශ්‍ය යැයි හඳුනාගෙන ඇති ප්‍රමුඛතා ක්ෂේත්‍ර නවයක් (09) ආවරණය වන පරිදි පුළුල් උපාය මාර්ගික කුළුණු සතරක් (04) ඔස්සේ සකස් කර ඇත. ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර හා දේශීය දූෂණ මර්දන කැපවීම්, මනා ජාත්‍යන්තර භාවිතාවන්, පර්යේෂණ අධ්‍යයන සහ මහජන සමීක්ෂණ සොයාගැනීම් පිළිබඳ පුළුල් සමාලෝචනයකින් මෙම ක්ෂේත්‍ර හඳුනා ගැනුණි. ප්‍රධාන උපාය මාර්ගික කරුණු සතර මෙසේය:

අ. නිවාරණ කටයුතු

ආ. අධ්‍යාපනය සහ ප්‍රජා සහභාගීත්වය

ඇ. ආයතනික ශක්තිමත් කිරීම සහ ක්‍රියාත්මක කිරීම

ඈ. නීතිය සහ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ

පහත ප්‍රමුඛතා ක්ෂේත්‍ර යටතේ හඳුනාගත් ක්‍රියා මාර්ග ඉහත උපාය මාර්ගික කරුණු සතරට ඇතුළත් වේ:

ප්‍රමුඛතා ක්ෂේත්‍ර 1: දූෂණ විරෝධී නීති සහ ප්‍රතිපත්ති රාමුව

ප්‍රමුඛතා ක්ෂේත්‍ර 2: බැඳියාවන් අතර ගැටුම් සහ වත්කම් ප්‍රකාශන

ප්‍රමුඛතා ක්ෂේත්‍ර 3: දූෂිත භාවිතාවන් වැළැක්වීම

ප්‍රමුඛතා ක්ෂේත්‍ර 4: තොරතුරු හෙළි කරන්නන් ආරක්ෂා කිරීම

ප්‍රමුඛතා ක්ෂේත්‍ර 5: පුද්ගලික අංශයේ සුපිළිපන්බව

ප්‍රමුඛතා ක්ෂේත්‍ර 6: රාජ්‍ය අංශයේ සුපිළිපන්බව

ප්‍රමුඛතා ක්ෂේත්‍ර 7: අධිකරණයේ සහ නඩු පැවරීමේ සේවාවේ සුපිළිපන්බව සහ ස්වාධීනත්වය

ප්‍රමුඛතා ක්ෂේත්‍ර 8: ආයතනික ශක්තිමත් බව සහ නීතිය බලාත්මක කිරීම

## ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය සහ ඇගයීම

සමස්තයක් වශයෙන් ගත් කළ, මෙම ක්‍රියාකාරී සැලැස්ම රටේ සියලුම අංශයන්ට අදාළ ක්‍රියා මාර්ග ඇතුළත් වන අතර, කෙටි කාලීන (මාස 1 සිට 12 දක්වා), මධ්‍ය කාලීන (මාස 12 සිට 36 දක්වා) සහ දිගු කාලීන (මාස 36 සිට 60 දක්වා) සන්ධිස්ථාන ඔස්සේ ක්‍රමානුකූලව ඒවා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

3. CPI 2023 for Asia Pacific: regional stagnation marked by inadequate delivery of anti-corruption commitments, https://www.transparency.org/en/news/cpi-2023-asia-pacific-stagnation-due-to-inadequate-anti-corruption-commitments

# 02. 2025-2029 දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේ ක්‍රියාවලිය

## අ . සංවිධානගත ක්‍රියාවලිය සහ හිමිකම

දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම 2025-2029 (NAP 2025-2029) සකස් කිරීම 'සමස්ත සමාජය' සහ 'සමස්ත රජය' යන දෙඅංශයේම මූලික අදහස් මත පදනම් වූවකි. එහි ප්‍රධාන අරමුණු අතරින් එකක් වූයේ, දූෂණය අඩු කිරීම සඳහා විවිධ පාර්ශ්වයන්ගේ සාමූහික සහභාගීත්වය සහ ක්‍රියා මාර්ග ගැනීම අවශ්‍ය බව අවධාරණය කරන සමාවේශී ක්‍රියාවලියක් හඳුන්වාදීමයි. විශේෂයෙන්ම, මෙම සැලැස්මට රජයේ හිමිකම සහ සහයෝගය ඇති කිරීමට විශේෂ අවධානය යොමු කර ඇත.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව නායකත්වය ලබා දී ඇති, "දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම 2025-2029" යනු ශ්‍රී ලංකාව සඳහාම වන ජාතික මට්ටමේ සැලැස්මකි, එය ශ්‍රී ලංකාවේ ජනතාව වෙනුවෙන් සකස් කර ඇති අතර, එය නිර්මාණය කර ඇත්තේ පුළුල් අංශ සහභාගීත්වයක් මතයි. මෙහි දී රජයේ ආයතන, සිවිල් සංවිධාන, පෞද්ගලික අංශය, සහ ප්‍රජා නියෝජිතයින් සමඟ සංවාද පැවැත්වීම තුළින් මෙම ක්‍රියාවලිය සමාවේශී බවට පත් කරන ලදී.

මෙම ක්‍රියාවලියෙන් විනිවිදභාවය වැඩි කිරීම සහ විවිධ අංශවල සක්‍රීය සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම අරමුණු කළ අතර, රාජ්‍ය නිලධාරීන් සහ අනිකුත් පාර්ශ්වවල වගකීම සහ කැපවීම ඇති කිරීමේ උනන්දුවක් ඇති කළේය. මෙම සමාවේශී ප්‍රවේශය සැලැස්මේ විශ්වාසය තහවුරු කිරීමට පමණක් නො ව, ජාතික ප්‍රමුඛතා වෙත ගැළපෙන සහ වගවීම ශක්තිමත් කරන ස්ථායී රාමුවක් ස්ථාපිත කිරීමට ද පහසුකම් සපයා ඇත.

## ආ . ක්‍රමවේද

දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම 2025-2029 සකස් කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු 2024 වසරේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නායකත්වය යටතේ ආරම්භ කරන ලදී. යෝජිත ක්‍රියාත්මක සැලැස්ම අනුගමනය වන රජයන්ගේ සැලසුම් සහ ජාතික ප්‍රමුඛතා සමඟ ගැළපෙන ලෙස සැලසුම් කර ඇති අතර, මෙය හොඳින් සංවිධානය කර හවුල්කාර පාර්ශ්වවල හිමිකම ශක්තිමත් කිරීම මෙන්ම වැඩි කාර්යක්ෂමතාවයක් ඇති කිරීම උදෙසා ක්‍රියාත්මක කරන ලදී.

මෙම ක්‍රියාවලිය ප්‍රධාන අදියර හතරක් ලෙස වෙන් කරන ලදී:

අ. ආරම්භක සමාලෝචනය සහ අවබෝධය

ආ. අල්ලස හා දූෂණ වැළැක්වීම සඳහා වන ජාතික ක්‍රියාකාරී සැලැස්ම 2019-2023 හි විශ්ලේෂණය

ඇ. පාර්ශවවල සාකච්ඡා

ඈ. දත්ත රැස් කිරීම සහ විශ්ලේෂණය

**අ. ආරම්භක සමාලෝචනය සහ ගැටලු අවබෝධය**

- පවතින නීතිමය රාමුව පිළිබඳ සමාලෝචනය
- ජාත්‍යන්තර වගකීම්
- මනා ජාත්‍යන්තර භාවිතාවන්
- අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත ලැබුණු පැමිණිලි දත්ත පිළිබඳ විශ්ලේෂණය

**ආ. අල්ලස හා දූෂණ වැළැක්වීම සඳහා වන ජාතික ක්‍රියාකාරී සැලැස්ම 2019-2023 හි විශ්ලේෂණය**

- අල්ලස් හා දූෂණ වැළැක්වීම සඳහා වන ජාතික ක්‍රියාකාරී සැලැස්ම (2019-2023) ක්‍රියාවට නංවා තිබීමේ ප්‍රගතිය සහ බලපෑම පිළිබඳ ඇගයීම

**ඇ. අදාළ පාර්ශ්වකරුවන් සමග සාකච්ඡා**

- දිවයින පුරා දූෂණය පිළිබඳ මහජන අවබෝධතා සමීක්ෂණය
- අවධානය යොමු කළ කණ්ඩායම් සමග සාකච්ඡා 45ක් පැවැත්වීම
- පළාත් මට්ටමේ මහජන සාකච්ඡා 09ක් පැවැත්වීම
- ජාතික මට්ටමේ සාකච්ඡා 08ක් පැවැත්වීම
- සමාජ හා මුද්‍රිත මාධ්‍යය මගින් දූෂණය පිළිබඳ සජීවී සංවාදය ප්‍රවර්ධනය කිරීම.

**ඇ. දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම 2025-2029 සැකසීම.**

දූෂණ විරෝධී ක්‍රියා මාර්ග පිළිබඳ මූලික පාඩම් සහ අත්දැකීම් හඳුනා ගැනීමේ වැදගත්කම සැලකිල්ලට ගනිමින්, පවතින නීතිමය රාමුව, ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර දූෂණ විරෝධී බැඳීම්, මනා ජාත්‍යන්තර භාවිතාවන්, සහ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත ලැබුණු පැමිණිලි දත්ත පිළිබඳ ගවේෂණ සහ විශ්ලේෂණ සිදු කරන ලදී.

මෙම විශ්ලේෂණය තුළ, පවතින නීති සහ නියෝග මූලිකව විමර්ශනය කර, ඒවායේ ශක්තිමත් සහ දුර්වල පැති හඳුනාගැනීමත්, යාවත්කාලීන කිරීමට අවශ්‍ය ක්ෂේත්‍ර තීරණය කිරීමත් සිදු කරන ලදී. මීට අමතරව, ශ්‍රී ලංකාව ජාත්‍යන්තර ගිවිසුම් සහ එකඟතා යටතේ බඳවාගෙන ඇති බැඳීම් විග්‍රහ කර, ගෝලීය ප්‍රමිතීන් හා අපේක්ෂා සමග ඒකාබද්ධතාවය සහතික කිරීම ද කළේය. අනිකුත් රටවල් දූෂණ විරෝධී ක්‍රියා මාර්ග ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳව මනා ජාත්‍යන්තර භාවිතාවන් විශ්ලේෂණය කර, ඒවායේ ක්‍රියාකාරී උපායන් හා ක්‍රමවේද මෙරට සන්දර්භයට අනුකූලව සකස් කිරීමේ හැකියාව අධ්‍යයනය කරන ලදී. මීට අමතරව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත ලැබුණු පැමිණිලි; දත්ත විශ්ලේෂණය කිරීමෙන්, සාමාන්‍ය ගැටලු රටාවන්, නිතර පැමිණෙන ගැටලු සහ මේ වන විට ක්‍රියාත්මක වන පිළිවෙළ කාර්යක්ෂමතාවය මැන ගැනීමට අවධානය යොමු කරන ලදී.

දෙවන අදියර ලෙස, 2019-2023 අල්ලස හා දූෂණය වැළැක්වීම සඳහා වන ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳ ගුණාත්මක මූල්‍යමය ඇගයීමක් සිදු කරන ලදී. මෙය, ප්‍රධාන කාර්යසාධන දර්ශක (Key Performance Indicators) සමාලෝචනය කිරීමක් අන්තර්ගත කර තිබුණි, ඒ සඳහා පූර්ව නිශ්චිත ඉලක්ක සාක්ෂාත් වූයේද, සහ වැඩිදියුණු කළ යුතු ක්ෂේත්‍ර හඳුනාගැනීම ද සිදු කරන ලදී. මීට අමතරව, ක්‍රියාත්මක කිරීමේ දී මුහුණදීමට සිදු වූ අභියෝග සහ බාධක හඳුනා ගැනීමට කටයුතු කරන ලද අතර, මෙයට ආයතනික, මෙහෙයුම්මය, සහ නීතිමය බාධක ද ඇතුළත් විය.

දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ දී සම්බන්ධ වූ විවිධ පාර්ශ්වවල ප්‍රතිපෝෂණ රැස් කරන ලද අතර; මීට රජයේ ආයතන, සිවිල් සංවිධාන, සහ පෞද්ගලික අංශය ද ඇතුළත් විය. ඔවුන්ගේ අත්දැකීම් සහ දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමට අදාළ දැක්වූ අදහස් තේරුම් ගැනීම මූලික අරමුණ විය.

ඉහත විශ්ලේෂණය මත පදනම්ව, ක්‍රියාත්මක කිරීමේ මනා භාවිතයන් සහ අනාගත දූෂණ විරෝධී උත්සාහයන් සඳහා ලබාගත් පාඩම් ලේඛනගත කර, වර්තමානයේ ක්‍රියාත්මක වන සැලසුමේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමට භාවිතා කරන ලදී.

තෙවන අදියරේ දී, මහජන අදහස් පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා ගැනීමටත්, විවිධ අදහස් එක්රැස් කිරීමටත්, 2025-2029 දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම (NAP) සකස් කිරීම සඳහා සියලු දෙනාම සහභාගී කරගනිමින් සහයෝගී ප්‍රවේශයක් ඇති කිරීමටත් අපේක්ෂාවෙන් පාර්ශ්වකරුවන් සමග සාකච්ඡා මාලාවක් පවත්වන ලදී.

පළමුව, දූෂණය පිළිබඳ ප්‍රාදේශීය මට්ටමේ මහජන මතදැක්වීම් සමීක්ෂණයක් කර, රටපුරා ජනතාවගේ දූෂණය පිළිබඳ අදහස් සහ මතදැක්වීම් තක්සේරු කිරීමේ උත්සාහයක් ගන්නා ලදී.

මෙම සමීක්ෂණය සියලුම පළාත්වල ක්‍රියාවට නංවා, දුරකථන, මාර්ගගත සහ කණ්ඩායම් සාකච්ඡා මඟින් සරල මහජන සහභාගිත්වයෙන් පුද්ගලයන් 9000 දෙනෙකුගේ සහභාගිත්වයෙන් සිදු කරන ලදී.

එමෙන්ම, පළාත් නවයේ (එක් පළාතක FGDs 05ක් බැගින්) ඉලක්ක ගත කණ්ඩායම් සාකච්ඡා (FGDs) 45ක් සංවිධානය කරන ලදී. මෙයට ප්‍රජා නායකයින්, සිවිල් සංවිධාන නියෝජිතයින්, සහ අනිකුත් පුරවැසියන් ඇතුළත් විය.

මෙම සාකච්ඡාවලට සහභාගීවූවන්ට දූෂණය සහ පාලන ක්‍රමවේද පිළිබඳ ඔවුන්ගේ අත්දැකීම්, අවබෝධය සහ යෝජනා හුවමාරු කිරීමට අවස්ථාව සලසා, සංවාදය සඳහා සහයෝගී පරිසරයක් නිර්මාණය කිරීමේ ආරම්භයක් වූ අතර, එමෙන්ම ඔවුන්ගේ අදහස් මතු කිරීමට සහ සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීමට අවකාශයක් ලබා දුන්නේය.

දෙවනුව, පළාත් මට්ටමින් සෑම පළාතක් තුළම මහජන සාකච්ඡාවන් සංවිධානය කර, මහජන සාකච්ඡා සිදු කරන ලදී. මෙම සාකච්ඡා, ඔවුන්ගේ ප්‍රදේශ හා ප්‍රජා සම්බන්ධ ගැටලු පිළිබඳ දේශීය ජනතාවට සම්බන්ධ වීමට සහ ඔවුන්ගේ හඬ ජාතික ප්‍රතිපත්ති නිර්මාණ ක්‍රියාවලියට අන්තර්ගත කිරීමට හැකිවිය.


තෙවනුව, ජාතික මට්ටමේ සාකච්ඡා 08ක් සංවිධානය කර, එමගින් මන්ත්‍රීවරු, විනිසුරුවරු, රජයේ නිලධාරීන්, පෞද්ගලික අංශ නියෝජිතයින්, මාධ්‍ය නියෝජිතයින්, සිවිල් සමාජ නියෝජිතයින්, ජාත්‍යන්තර සංවිධාන නියෝජිතයින්, තරුණ නියෝජිතයින් ඇතුළු ප්‍රධාන පාර්ශ්වයන් එකතු කරන ලදී. මෙම සාකච්ඡා දූෂණ විරෝධී ජාතික උත්සාහයන් පිළිබඳ ආකෘතික සාකච්ඡා මතුකරමින්, සහභාගීවූවන්ට ප්‍රතිපත්ති නිර්මාණය සහ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් එකතු වීමට හැකි වී තිබුණි.

මෙම දත්ත රැස් කිරීමේ ක්‍රියාවලිය සමඟ, ශ්‍රී ලංකාවේ දූෂණය පිළිබඳ මහජන අදහස් රැස් කිරීම සඳහා සමාජ සහ මුද්‍රිත මාධ්‍ය ප්‍රචාරණ කටයුතු ආරම්භ කරන ලදී. මෙය, සිවිල් ජනතාවට ඔවුන්ගේ අදහස් ප්‍රකාශ කිරීමට සහ වැඩි විශ්වාසනීය හා සාධාරණ සමාජයක් ගොඩනගා ගැනීමට දායක වීමට අවස්ථාවක් සැලසීමේ අරමුණින් සිදුකෙරිණි. සමාජ මාධ්‍ය ව්‍යාපාරය මිලියන 3ක ප්‍රේක්ෂකයන් වෙත ළඟා වූ අතර, මේ තුළින් එය විවිධ මාධ්‍යයන් අතර පුළුල් ලෙස ව්‍යාප්ත වූ බව දැක්විය හැකි ය. ශ්‍රී ලංකාවේ දූෂණය පිළිබඳව පරිශීලකයන් 300කට අධික සංඛ්‍යාවක්, තම අදහස් සහ අත්දැකීම් බෙදාහදා ගනිමින් අදහස් දැක්වූ අතර, එමගින් සක්‍රීය දායකත්වයක් ඇති විය. තවද, ප්‍රේක්ෂකයන්ගේ ඉහළ උනන්දුව සහ අන්තර් ක්‍රියාකාරිත්වය මනාව පිළිබිඹු කරමින්, ගූගල් පෝරමය මඟින් ප්‍රතිචාර 1,756ක් එකතු කරගන්නා ලදී. මුද්‍රිත මාධ්‍ය, ව්‍යාපාරය මාර්ගගත මුද්‍රිත මාධ්‍ය පිටුවල මිලියන 3,096,959ක ප්‍රේක්ෂකයන් වෙත ළඟා වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස පුළුල් ව්‍යාප්තියක් හා ඉහළ අවධානයක් හිමි විය. දූෂණයට එරෙහිව ක්‍රියාත්මක කෙරෙන මෙම ව්‍යාපාරය මඟින් දළ වශයෙන් පුද්ගලයන් 1,629,475 දෙනෙකු සමඟ සාර්ථකව සම්බන්ධ වීමට හැකි වූ අතර, එමගින් මෙම ප්‍රයත්නයන් පිළිබඳ පණිවිඩය පුළුල් ලෙස ප්‍රචාරය කරමින්, පුළුල් ප්‍රේක්ෂක පිරිසක් ඒ පිළිබඳව දැනුවත් කිරීමේ කාර්යය සාර්ථකව ඉටු කෙරිණි. මෙකී කාර්යන්හි සමස්ත ප්‍රතිඵලය, දූෂණයට එරෙහිව මහජනතාව දැනුවත් කිරීම, ඔවුන්ව ඊට සම්බන්ධ කර ගැනීම සහ එම කරුණු පිළිබඳව අවබෝධයක් ලබා දීම සඳහා ඩිජිටල් සහ සාම්ප්‍රදායික මාධ්‍යයන්හි ඵලදායී ඒකාබද්ධතාවය මනාව ප්‍රදර්ශනය කරයි. තවද, දූෂණයට එරෙහිව ගෙන යන ජාතික සාකච්ඡාවලට මෙන්ම, ප්‍රතිපත්ති සම්පාදනයට දායක වීමට පුද්ගලයන්ට අමතර අවස්ථා මෙමගින් හිමි වේ.

විවිධ පාර්ශ්වකරුවන් සමඟ කොළඹ දී පැවති උපදේශනය

| | | |
|---|---|---|
| 1 | පෞද්ගලික අංශය සමඟ සාකච්ඡා කිරීම | 2024.08.22 |
| 2 | තරුණයින් සමඟ සාකච්ඡා කිරීම | 2024.08.23 |
| 3 | සිවිල් සංවිධාන සහ අන්තර්ජාතික රාජ්‍ය නොවන ආයතන සමඟ සාකච්ඡා කිරීම | 2024.08.27 |
| 4 | මාධ්‍ය අංශය සමඟ සාකච්ඡා කිරීම | 2024.08.30 |
| 6 | ආබාධිත ප්‍රජාවන් සමඟ සාකච්ඡා කිරීම | 2024.10.25 |
| 7 | මහේස්ත්‍රාත් අධිකරණ විනිසුරුවරුන් සමඟ සාකච්ඡා කිරීම | 2024.12.03 |
| 8 | මහාධිකරණ විනිසුරුවරුන් සමඟ සාකච්ඡා කිරීම | 2024.12.04 |
| 9 | අභියාචනාධිකරණ විනිසුරුවරුන් සමඟ සාකච්ඡා කිරීම | 2024.12.05 |
| 10 | රාජ්‍ය අංශය සමඟ සාකච්ඡා කිරීම | 2024.12.18 |
| 11 | පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සමඟ සාකච්ඡා කිරීම | 2025.01.10 |

වගුව 1: පාර්ශ්වකරුවන් සමඟ පැවැත්වූ උපදේශන




## සමස්ත ලංකා සිවිල් සහභාගීත්වය

| | | |
|---|---|---|
| 1 | 2024.08.01 | කුරුණෑගල |
| | | පුත්තලම |
| 2 | 2024.08.02 | මහනුවර |
| | | මාතලේ |
| | | නුවරඑළිය |
| 3 | 2024.08.06 | යාපනය |
| | | මුලතිව් |
| | | කිලිනොච්චිය |
| | | මන්නාරම |
| | | වවුනියාව |
| 4 | 2024.08.07 | අම්පාර |
| | | මඩකලපුව |
| | | ත්‍රිකුණාමලය |
| 5 | 2024.08.08 | අනුරාධපුර |
| | | පොළොන්නරුව |
| 6 | 2024.08.13 | බදුල්ල |
| | | මොනරාගල |
| 7 | 2024.08.14 | කෑගල්ල |
| | | රත්නපුර |
| 8 | 2024.08.28 | ගාල්ල |
| | | මාතර |
| | | හම්බන්තොට |
| 9 | 2024.08.29 | කොළඹ |
| | | ගම්පහ |
| | | කළුතර |

සැකසීමේ අවසන් අදියරේ දී, මෙම විවිධ මූලාශ්‍රයන් මගින් රැස්කොට ඇති දත්ත සංශ්ලේෂණය කිරීම සිදු කරන ලදී. විශ්ලේෂණය; දූෂණ විරෝධී උත්සාහයන්හි සන්දර්භය තුළ ප්‍රධාන ප්‍රවණතා, අභියෝග සහ අවස්ථා හඳුනා ගැනීමට අවධානය යොමු කරන ලදී. සංශ්ලේෂිත දත්ත සහ විශ්ලේෂණය පදනම් කරගෙන, සැකසීමේ ක්‍රියාවලිය, සාක්ෂි පදනම් වූ යෝජනා සහ මනා භාවිතාවන් ඇතුළත් කරමින්, සැලැස්ම ප්‍රායෝගික සහ විවිධ පාර්ශ්වයන්ගේ අවශ්‍යතා සමග ගැළ පෙන පරිදි නිර්මාණය කරන ලදී.

මෙම ක්‍රියාවලියේ අවසන් පියවර ලෙස, කෙටුම්පත් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම (Action Plan), ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන ආයතන වෙත ඉදිරිපත් කර, කොළඹ පැවති වැඩමුළුවක දී ඔවුන්ගේ සමාලෝචන සහ ප්‍රතිපෝෂණ ලබා ගන්නා ලදී. මෙම සහයෝගීතාමය ප්‍රවේශය තුළින්, දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්මෙහි විස්තරාත්මක පරීක්ෂාවක් සිදු කර, අවශ්‍යතාවයන්ට අනුකූලව සංශෝධන සිදු කරමින්, විවිධ පාර්ශ්වයන්ගේ අදහස් නියෝජනය වන පරිදි සකස් කිරීමෙන් අනතුරුව, එහි ක්‍රියාත්මක කිරීමේ හැකියාව තහවුරු කෙරිණි.

# 03. ශ්‍රී ලංකාවේ දූෂණ තත්ත්වය


දූෂණය යනු, සමාජයේ සෑම ස්ථරයකටම බලපෑම් එල්ල කරන පුළුල් ගැටලුවක් වන අතර, එය සමස්ත ජාතියක කීර්තියට හා ස්ථාවරත්වයට බරපතළ තර්ජනයක් එල්ල කරන ප්‍රබල ගැටලුවකි. එය පාලනයේ මූලිකාංග දුර්වල කරන අතර, මහජන විශ්වාසය බිඳ දමමින්, ජාතික සම්පත් ක්ෂය කර, ආර්ථික අවස්ථා විකෘති කරයි. දූෂණයේ අහිතකර ප්‍රතිවිපාක ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයට, පුරවැසියන්ගේ යහපැවැත්මට සහ දේශපාලන ස්ථාවරත්වයට සැලකිය යුතු ලෙස හානි කර ඇත. වසර ගණනාවක් පුරා, ශ්‍රී ලංකාවේ දූෂණය සම්බන්ධයෙන් මහජන කතිකාව ප්‍රධාන වශයෙන්ම අවධානය යොමු කර ඇත්තේ දේශපාලන චරිත, රාජ්‍ය ආයතන සහ රාජ්‍ය නිලධාරීන් විසින් බලය අනිසි ලෙස භාවිතා කිරීම කෙරෙහි ය. 2022 වර්ෂයේ ඇති වූ ආර්ථික හා දේශපාලන අර්බුදයෙන් පසුව, දූෂණය පිළිබඳ කතිකාව වඩාත් තීව්‍ර වූ අතර, බොහෝ දෙනා දූෂණය, රටේ එදිනෙදා කටයුතුවලට සහ එහි ජනතාවගේ ජීවිතයට බලපාන අර්බුදවලට හේතුවක් ලෙස සැලකීමට පටන් ගත්හ. රාජ්‍ය ආයතන තුළ සහ රාජ්‍ය නිලධාරීන් අතර පවතින දූෂණය වර්තමාන මහජන කතිකාව තුළ බොහෝ විට අවධානයට ලක් වුව ද, දූෂණය සමාජයේ සියලු අංශවලටම ව්‍යාප්ත වන අතර, අවසානයේ දී ජනතාවගේ සුබසාධනයට බාධා ඇති කරන බව හඳුනා ගැනීම ඉතා වැදගත් වේ. එමනිසා, එවැනි දූෂණ කටයුතු පාලනය කිරීමට සහ වැළැක්වීමට හැකි ක්‍රම තීරණය කිරීම සඳහා, ශ්‍රී ලංකාවේ පවතින දූෂණ තත්ත්වය විමර්ශනය කර හඳුනා ගැනීම අත්‍යවශ්‍ය වේ.

## අ. අංශමය අවදානම්

2018 වර්ෂයේ දී, ශ්‍රී ලංකාව UNCAC (දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය) සමාලෝචනයේ දෙවන චක්‍රය සාර්ථකව නිම කළේය. මෙම පුළුල් තක්සේරුව මඟින් දූෂිත භාවිතයන් වළක්වා ගැනීම සඳහා නිවාරණ ක්‍රියා මාර්ග ක්‍රියාත්මක කිරීම සහ වත්කම් නැවත ලබා ගැනීමේ ක්‍රියාවලීන් කෙරෙහි අවධානය යොමු කරන ලදී. ඊට පෙර 2015 දී, ශ්‍රී ලංකාව පළමු සමාලෝචන චක්‍රය නිම කරන ලද අතර, එහිදී දූෂණයට අදාළ වරදකරණය, නීතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියා මාර්ගවල ඵලදායීතාවය සහ දූෂණයට එරෙහිව සටන් කිරීම සඳහා ජාත්‍යන්තර සහයෝගීතා ප්‍රයත්නයන් පිළිබඳව විමර්ශනය කරන ලදී. මෙම සමාලෝචන මඟින් ශ්‍රී ලංකා රජය විසින් ගන්නා ලද ඇතැම් මුල පිරීම් අගය කරන ලද අතර, ක්‍රියාත්මක කිරීමේ දී ඇති වූ අභියෝග කිහිපයක් ද ඉස්මතු කරන ලදී. 2023 අංක 9 දරණ දූෂණ විරෝධී පනත, කෙටුම්පත් කිරීමේ අදියරේදී සමාලෝචනවල සියලුම අනිවාර්ය සහ ඇතැම් විකල්ප නිර්දේශයන් සැලකිල්ලට ගත් අතර, එහි ප්‍රතිඵලයක් ලෙස එය ලෝකයේ හොඳම දූෂණ විරෝධී නීතිවලින් එකක් ලෙස සැලකේ.


මෙම ක්‍රියා මාර්ගයන් තිබියදීත්, රටෙහි දූෂණ තත්ත්වය සහ දූෂණය පිළිබඳ මහජනතාවගේ ආකල්පයන් කනස්සල්ලට කරුණකි. මෙම ක්‍රියාකාරී සැලැස්ම කෙටුම්පත් කිරීමට පෙර, පවත්වන ලද මහජන සමීක්ෂණයකින්, ශ්‍රී ලංකාවේ අල්ලස් හා දූෂණයට වැඩිපුරම ගොදුරු විය හැකි අංශ මොනවාද යන්න පිළිබඳව, (අ) ප්‍රතිචාර දැක්වූවන්ගේ අදහස් සහ (ආ) ප්‍රතිචාර දැක්වූවන්ගේ අත්දැකීම් යන කරුණු පදනම් කර ගනිමින් විමර්ශනයක් සිදු කරන ලදී. රට තුළ දූෂණ මට්ටම පිළිබඳව නිතර වාර්තා වන මහජන අප්‍රසාදය පිළිබිඹු කරමින්, සමීක්ෂණයට සහභාගී වූවන්ගෙන් බහුතරයක් (64%) රාජ්‍ය අංශය දූෂණයට වැඩි වශයෙන් ගොදුරු විය හැකි බවට අදහස් පළ කළ අතර, පෞද්ගලික අංශය (24%)ක ප්‍රතිශතයක් සමඟ දෙවන ස්ථානයටත්, රාජ්‍ය නොවන අංශය (12%)ක ප්‍රතිශතයක් සමඟ අවසන් ස්ථානයටත් පත්විය.

සමීක්ෂණයට සහභාගීවූවන්ගේ අදහස්වලට අනුව, අල්ලස් හා දූෂණයට වැඩිම අවදානමක් සහිත ආයතන ලෙස පොලිසිය, දේශපාලනඥයන්, රේගුව, ආගමන විගමන දෙපාර්තමේන්තුව සහ පාසල් හඳුනාගෙන ඇත.





**රූපය 1 - ප්‍රතිචාර දැක්වූවන්ගේ අදහස් මත පදනම්ව, අල්ලස් හා දූෂණයට වැඩිපුරම ගොදුරු විය හැකි ආයතනවල වර්ගීකරණය**

සමීක්ෂණයට සහභාගීවූවන් ඔවුන්ගේ පෞද්ගලික අත්දැකීම් මත පදනම්ව, වඩාත්ම දූෂිත ආයතන පහක් ලෙස පොලිසිය, අධ්‍යාපන ආයතන, ඉඩම් ලේකම් කාර්යාල, පළාත් පාලන ආයතන සහ පළාත් සභා හඳුනා ගන්නා ලදී. මෙම තත්ත්වය, නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනවල සහ ප්‍රජා මට්ටමේ අත්‍යවශ්‍ය මහජන සේවාවන්හි දූෂණය බහුලව පවතින බවට මතයක් ඇති කරන අතර, මෙම වැදගත් ආයතන කෙරෙහි පවතින සමස්ත විශ්වාසයට ද බලපෑමක් ඇති කරයි. දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මෙන්ම, පළාත් පාලන ආයතනවල සේවකයින්ට එරෙහිව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත අඛණ්ඩව ලැබෙන පැමිණිලි ප්‍රමාණය, සමීක්ෂණයේ නිගමන සනාථ කරයි. මහජන සේවාවන් විමධ්‍යගත කිරීම සඳහා යළිත් ඉල්ලීම් ඉදිරිපත් වෙමින් පවතින බැවින්, ප්‍රජා මට්ටමේ ආයතනවල දූෂණ අවදානම අවම කිරීම අත්‍යවශ්‍ය වේ.




**රූපය 2 - ප්‍රතිචාර දැක්වූවන්ගේ අත්දැකීම් මත පදනම්ව, අල්ලස් හා දූෂණය බහුලව පවතින ආයතනවල වර්ගීකරණය**

පළාත් නවය තුළම, අල්ලස් හා දූෂණ අත්දැකීම්වලට වැඩි වශයෙන් සම්බන්ධ වී ඇත්තේ පොලිසිය බව ප්‍රතිචාර දැක්වූවන් පෙන්වා දී ඇත. මෙම කරුණ, රටේ නීතිය ක්‍රියාත්මක කරන ආයතනවල සුපිළිපන්න බව සහ වගවීම පිළිබඳව දැඩි කනස්සල්ලක් ඇති කරයි. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව මඟින් සිදු කරන ලද වැටලීම්වල දී අත්අඩංගුවට ගත් පුද්ගලයින් ගණන ද මේ බව සනාථ කරයි. 2024 වර්ෂයේ දී පොලිසිය, රාජ්‍ය අංශයේ ආයතන අතරින් වැඩිම අත්අඩංගුවට ගැනීම් ගණනක් සිදු කර ඇති අතර, එම සංඛ්‍යාව 22 කි. තවද, 2024 වර්ෂයේ දී දූෂණයට අදාළ නඩු විභාගවල දී මහාධිකරණය හමුවේ පොලිස් නිලධාරීන් 15 දෙනෙකු චූදිතයන් ලෙස නම් කර තිබේ.





**රූපය 3 - අත්දැකීම් මත පදනම්ව, පළාත් අනුව දූෂණයට සහ අල්ලස්වලට ගොදුරු විය හැකි ඉහළම ආයතන 5**

පෙර පැවති 2019-2023 අල්ලස හා දූෂණ වැලැක්වීම සඳහා වන ජාතික ක්‍රියාකාරී සැලැස්ම මඟින් දූෂණ විරෝධී ක්‍රියා මාර්ග ක්‍රියාත්මක කිරීමේ දී නීතිය ක්‍රියාත්මක කරන ආයතනයක් ලෙස පොලිසියේ තීරණාත්මක කාර්යභාරය අවධාරණය කළ අතර, එම ආයතන ශක්තිමත් කිරීම සඳහා විශේෂ අංශයක් ද වෙන් කර තිබුණි. කෙසේ වෙතත්, මෙම සමීක්ෂණයේ ප්‍රතිඵල මඟින් දූෂණයට එරෙහිව ශ්‍රී ලංකාව ගෙන යන සටනේ දී පවතින ප්‍රධාන අභියෝගය අනාවරණය වේ. වැඩිදුරටත්, මෙම ප්‍රතිඵල මඟින් රට තුළ දූෂණයට එරෙහිව සටන් කිරීම සඳහා නීතිමය සහ ප්‍රතිපත්තිමය රාමුව ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හදිසි අවශ්‍යතාවය අවධාරණය කෙරේ.

ධනාත්මක ප්‍රතිඵලයක් ලෙස, 2023 දූෂණ විරෝධී පනත යටතේ අලුතින් හඳුන්වා දුන් පෞද්ගලික අංශයේ අල්ලස් දීම සම්බන්ධයෙන්, පුද්ගලයන් විසින් පෞද්ගලික අංශයේ සේවකයින්ට එරෙහිව පැමිණිලි ඉදිරිපත් කරන බවට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිල සංඛ්‍යා ලේඛනවලින් පෙනී යයි. මේ දක්වා එක් අත්අඩංගුවට ගැනීමක් පමණක් සිදුවී ඇති අතර, එමඟින් පෙනී යන්නේ දූෂණයට එරෙහිව කටයුතු කිරීම සඳහා අලුතින් හඳුන්වා දුන් නීතිමය විධිවිධාන ජනතාව විසින් ක්‍රියාකාරීව භාවිත කරන බවයි. කෙසේ වෙතත්, 2024 වර්ෂයේ දී අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත ලැබුණු පැමිණිලි 3850න් 1714ක් කොමිසමේ විෂය පථයෙන් බැහැරව පැවතුණි. මෙමඟින්, දූෂණය යනු කුමක්ද යන්න සහ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවෙහි කාර්යභාරය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කෙරෙන අතර, කොමිසම අමතන්නේ කාටදැයි ජනතාව දැන සිටීම ද වැදගත් වේ.


## ආ. දූෂණයේ ස්වභාවය, හේතු සහ බලපෑම්

මහජන සමීක්ෂණයට සහභාගීවූවන්ගෙන් 49%ක් පමණ, තමන් පෞද්ගලිකව අල්ලසක් ලබා දුන් බව පිළිගත් අතර, 18%ක් තමන් දූෂණය නැමති වරදේ කොටස් කරුවෙක් වී ඇත්දැයි සැක පළ කළහ. වාර්තා වූ අල්ලස් වර්ග; මුදල්, භාණ්ඩ, සේවා සහ ලිංගික අල්ලස් දක්වා විහිදී ගියේය.




**රූපය 4 - අල්ලස් වර්ග**

එවැනි අල්ලස් ලබා දීමට පොදු හේතු ලෙස සමීක්ෂණයට සහභාගී වූවන් විසින්, දඩ මුදල් ගෙවීමෙන් වැළකීම සහ රාජ්‍ය ආයතනවල පරිපාලන කටයුතු කඩිනම් කර ගැනීම සඳහන් කරන ලදී.





**රූපය 5: අල්ලසක් ලබා දීමට හේතු.**

ඉහත හේතුවලට අමතරව, ප්‍රතිචාර දැක්වූවන් පහත සඳහන් හේතු ද හඳුනාගෙන ඇත:

- දරුවන් පාසලකට ඇතුළත් කිරීම සඳහා
- වෛද්‍යවරයෙකු හමුවීමට වේලාවක් වෙන් කර ගැනීම සඳහා
- උසස්වීමක් ලබා ගැනීම සඳහා
- ලංසු සම්මත කර ගැනීම සඳහා
- මැතිවරණ සමයේ දේශපාලන වාසි ලබා ගැනීම සඳහා
- පොලිසියට හෝ වෙනත් රාජ්‍ය නිලධාරීන්ට ඇති බිය

සමීක්ෂණ ප්‍රතිඵලවලින් පෙනී යන්නේ, දූෂණය මේ වන විට ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් සැලකිය යුතු පිරිසකගේ ජීවිතවල සාමාන්‍ය තත්ත්වයක් බවට පත්ව ඇති බවයි. එය රාජ්‍ය අංශයට හෝ එහි සේවකයින්ට පමණක් සීමා වූ ගැටලුවක් නොවන, බොහෝ පුද්ගලයෝ දූෂණය පුද්ගලික වාසි සහ ප්‍රතිලාභ ලබාගැනීමට සුදුසු මාර්ගයක් ලෙස සලකති. දූෂණයේ මූලික හේතු සහ ප්‍රතිලාභීන් රාජ්‍ය අංශය තුළින් හඳුනාගත හැකි වුව ද, දූෂණය ශ්‍රී ලංකාව තුළ පුළුල් ලෙස පැතිරී ඇති සංස්කෘතියක් බවට වර්ධනය වී තිබේ. ශ්‍රී ලංකාවේ අල්ලස් ගැනීමේ සංස්කෘතියට දායක වන සාධක විමර්ශනය කිරීමේ දී, දුර්වල නීතිය ක්‍රියාත්මක කිරීම, අඩු වැටුප් පරිමාණයන් සහ දූෂණ ක්‍රියාවන් වාර්තා නොකර සාමාන්‍යකරණය කිරීම යන කරුණු, සමාජය තුළ දූෂිත භාවිතයන් සාමාන්‍යකරණය වීමට සහ ඒවාට හුරුවීමට ප්‍රධාන වශයෙන්ම හේතු වී ඇති බව සමීක්ෂණයෙන් හෙළි විය. දිගුකාලීනව දූෂිත ක්‍රියාවන් වැළැක්වීම සඳහා මෙම ප්‍රධාන ක්‍රමානුකූල ගැටලු විසඳීම අත්‍යවශ්‍ය විය හැකි ය.




**රූපය 6: දූෂිත සංස්කෘතියක් සඳහා වන හේතු පිළිබඳව මහජන මතය**

තවද, 2023 පාලන තත්ත්ව ඇගයීම මගින් රාජ්‍ය අංශයේ දූෂණයට හේතු කිහිපයක් සහ රාජ්‍ය ප්‍රසම්පාදන කටයුතුවල දී අංශ ගණනාවක් සහ ගැටලු අතර පවතින අන්තර් සම්බන්ධතාවය හඳුනාගන්නා ලදී. රාජ්‍ය ව්‍යවසායන් සමග ඉහළ වටිනාකමක් සහිත දූෂණය බොහෝ සෙයින් සම්බන්ධ වී ඇති බව පාලන තත්ත්ව ඇගයීම මගින් හඳුනාගත් අතර, විශේෂයෙන් මූල්‍ය අංශය තුළ රාජ්‍ය ආයතන සහ පෞද්ගලික සමාගම් අතර පවතින දැඩි සම්බන්ධතාවය අවධාරණය කෙරිණි. රාජ්‍ය ප්‍රසම්පාදනය, රාජ්‍ය කොන්ත්‍රාත්තු සහ උපාය මාර්ගික ආයෝජන සඳහා වරප්‍රසාද පැවරීම වැනි ක්ෂේත්‍රවල ප්‍රතිපත්ති සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීමේ දී ලබා දී ඇති සැලකිය යුතු බලයලත්භාවය, මෙම ක්ෂේත්‍රයන්හි රාජ්‍ය ක්‍රියාකාරකම්වලට පහසුවෙන් අභියෝග එල්ල කිරීමට නොහැකිවීම හේතුවෙන් දූෂණයට ඇති ඉඩකඩ වැඩි කරයි. මෙම තත්ත්වය විනිවිදභාවයේ අඩුපාඩුවකින් ද උග්‍ර වන අතර, අධිකාරියේ විසිරුණු ව්‍යුහය සහ පුද්ගලයන් කිහිප දෙනෙකු අතේ වගකීම් සංකේන්ද්‍රණය වීම ද ඊට බලපායි. රාජ්‍ය සහ පෞද්ගලික ප්‍රභූන් අතර පවතින දීර්ඝකාලීන සබඳතා, ඥාති සංග්‍රහයට සහ පක්ෂග්‍රාහීත්වයට හේතු වන බව මෙයින් පැහැදිලි වේ. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත වසරක් තුළ ලැබෙන පැමිණිලිවලින් බහුතරයක් කාර්යාලයේ බලය අනිසි ලෙස භාවිතා කිරීම (හෝ 'දූෂණය' යන වරද) සම්බන්ධයෙන් වන අතර, එම සම්බන්ධතාවය ද මෙය මගින් අවධාරණය කෙරේ.

ශ්‍රී ලංකාවේ දූෂණය හේතුවෙන් ඇතිවිය හැකි පාඩුව විවිධ පැතිකඩයන්ගෙන් සමන්විත වන අතර, එය සමාජයේ සහ ආර්ථිකයේ විවිධ අංශවලට බලපායි. දූෂණයේ සමස්ත පාඩුව පිළිබඳ නිශ්චිත සංඛ්‍යාත්මක දත්ත සොයා ගැනීම දුෂ්කර වුව ද, එහි පුළුල්ව පැතිරී ඇති ස්වභාවය ජාතියේ සංවර්ධනයට සහ යහපැවැත්මට සැලකිය යුතු ලෙස බලපායි. රජයේ ටෙන්ඩර් ප්‍රසම්පාදනවල දී සිදුවන

දූෂණය හේතුවෙන් ශ්‍රී ලංකාවට වාර්ෂිකව සිදුවන අලාභය රටේ දළ දේශීය නිෂ්පාදිතයෙන් (GDP) 1%[4]ක් පමණ වන බවට ගණන් බලා ඇත. මෙයින් අදහස් කරන්නේ දූෂණය හේතුවෙන් රටට ඩොලර් බිලියන ගණනක ආර්ථික පාඩුවක් සිදුවිය හැකි බවයි. එක්සත් ජාතීන්ගේ සංවිධානය, තිරසාර සංවර්ධන අරමුණු (Sustainable Development Goals) සාක්ෂාත් කර ගැනීම සඳහා දූෂණයට එරෙහිව කටයුතු කිරීම අත්‍යවශ්‍ය බව හඳුනාගෙන ඇත. මන්දයත්, පුළුල්ව පැතිරී ඇති දූෂණය, රජයේ ආයතන කෙරෙහි මහජන විශ්වාසය හීන කරන අතර, එමගින් කලකිරීම් ඇතිවීමටත් සිවිල් කටයුතුවල නිරත වීමට ඇති අකමැත්තටත් හේතු වේ. එය සමාජ කොන්ත්‍රාත්තුව දුර්වල කරන අතර "විශ්වාසය ඌනතාවය"[5] වැඩි කරයි. එය විදේශ ආයෝජනවලට බලපාන අතර, ව්‍යාපාර කිරීමේ පිරිවැය වැඩි කරන අතර එහි ප්‍රතිඵලයක් ලෙස ආර්ථික වර්ධනයට බාධා ඇති කරයි. දූෂණය, සෞඛ්‍ය සේවා, අධ්‍යාපනය සහ යටිතල පහසුකම්වල කාර්යක්ෂමතාවයට අහිතකර ලෙස බලපාන අතර, එහි ගුණාත්මකභාවය ද බිඳ දමයි. මෙහි ප්‍රතිඵලයක් ලෙස පුරවැසියන්ට ප්‍රමාණවත් සේවාවන් නොලැබීම සහ සමස්ත ජීවන තත්ත්වය පහත වැටීම සිදුවිය හැකි ය. දූෂණය බොහෝ විට පුළුල්, ජනතාවගේ වියදමින් කුඩා පිරිසකට ප්‍රතිලාභ ගෙන දෙයි.

ජනගහනයට අහිතකර ලෙස බලපාන අතර, බලය අසමාන ලෙස බෙදී යාම, වැටුප් විෂමතා, ජීවන තත්ත්වය පහත වැටීම සහ ජීවන වියදම ඉහළ යාම තුළින් සමාජ අසමානතාවයන් තවදුරටත් උග්‍ර කරයි

ඒ අනුව, දූෂණයේ පුළුල් බලපෑම, ක්ෂණික මූල්‍යමය පාඩුවලට එහා ගොස් ශ්‍රී ලංකාවේ සමාජ ව්‍යුහය, ආර්ථික ස්ථාවරත්වය සහ ජාත්‍යන්තර කීර්තියට බලපාන බව අවබෝධ කරගත යුතු ය. එමනිසා, දූෂණයට එරෙහිව කටයුතු කිරීම, යහපත් පාලනයක් (governance) පමණක් නො ව, තිරසාර සංවර්ධනය, සමාජ සාධාරණත්වය, විදේශ ආයෝජන ප්‍රවර්ධනය කිරීම සඳහාත්, වඩාත් විනිවිදභාවයෙන් යුත්, වගවීමක් සහිත සහ සමෘද්ධිමත් අනාගතයක් කරා යන ගමන සලසන අත්‍යවශ්‍ය සාධකයකි.

## ඈ. දූෂණය පාලනය කිරීමේ ක්‍රියා මාර්ග

ශ්‍රී ලංකාවේ දූෂණය පාලනය කිරීම සඳහා දැනට ගෙන ඇති ක්‍රියා මාර්ග තක්සේරු කිරීමේ දී, රට තුළ පවතින නීතිමය සහ ප්‍රතිපත්තිමය රාමුව පරීක්ෂා කිරීම වැදගත් වේ. 2022 "අරගලය" (පුරවැසි අරගලය) හේතුවෙන් ආර්ථික හා දේශපාලන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියක නිරත වන ශ්‍රී ලංකාව තුළ, පාර්ලිමේන්තුව විසින් 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත සම්මත කරන ලදී. මෙම පනතේ ප්‍රකාශිත අරමුණු අතර ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක සුබසාධනය සඳහා අල්ලස් සහ දූෂණය වැළැක්වීම සහ තුරන් කිරීම; මහජන සහභාගීත්වය ඇතුළුව පාලනයේ විනිවිදභාවය, වගවීම සහ සුපිළිපන්න බව වැඩිදියුණු කිරීම; පනත ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය කිරීම, දූෂණයට අදාළ වැරදි විමර්ශනය කිරීම සහ නඩු පැවරීම සඳහා ස්වාධීන කොමිෂන් සභාවක් ස්ථාපිත කිරීම; දූෂණය වැළැක්වීම පිළිබඳ අධ්‍යාපනික මුල පිරීම් පැවැත්වීම; නීති විරෝධී ලෙස ධනය උපයා ගැනීම වැළැක්වීම සඳහා බලවත් වත්කම් ප්‍රකාශන ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම; දූෂණයට එරෙහිව සටන් කිරීමේ දී අන්තර්-ආයතනික හා ජාත්‍යන්තර සහයෝගීතාවය පෝෂණය කිරීම සහ ජාත්‍යන්තර බැඳීම් සහ මනා භාවිතාවන් ක්‍රියාත්මක කිරීම යන කරුණු ඇතුළත් වේ.

ඉහත කරුණු සැලකිල්ලට ගත් විට, ද්විත්වවාදී රටක් වන ශ්‍රී ලංකාව, මෙම පනත මගින් සිය ජාත්‍යන්තර බැඳීම් සිය දේශීය නීතිමය රාමුවට ඇතුළත් කිරීමට පැහැදිලි පියවර ගෙන ඇති බව පැහැදිලි වේ. තවද, 1954 අල්ලස් පනත (26 පරිච්ඡේදය), 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත සහ 1975 අංක 1 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ නීතිය අහෝසි කරමින්, දූෂණ විරෝධී පනත මගින් පෙර පැවති නීතිමය රාමුව යටතේ පැවති දූෂණ විරෝධී ක්‍රියා මාර්ගවල විෂය පථය වැඩි දියුණු කර ඇත. උදාහරණයක් ලෙස, මෙම පනත මගින් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවෙහි මෙහෙයුම් සහ මූල්‍යමය ස්වාධීනත්වය වැඩි දියුණු කරන අතර දූෂණය වැළැක්වීම සහ රජයේ දූෂණ විරෝධී ප්‍රතිපත්ති ක්‍රියාත්මක

4. https://www.dailymirror.lk/business-news/Sri-Lankas-annual-loss-due-to-government-tender-corruption-amounts-to-1-of-Gross-Domestic-Product-Verit%C3%A9-Research/273-298012
5. https://unis.unvienna.org/unis/en/pressrels/2023/uniscp1172.html

කිරීම සඳහා විධිවිධාන ඇතුළත් වේ. එමෙන්ම, ජනාධිපතිවරයා සහ ස්වාධීන කොමිෂන් සභාවල සාමාජිකයින් වැනි, මීට පෙර වත්කම් ප්‍රකාශ කිරීමේ අවශ්‍යතාවලින් නිදහස් කර තිබූ නිලධාරීන් වෙත වත්කම් ප්‍රකාශ කිරීමේ අවශ්‍යතා පුළුල් කර ඇත. පෙර පැවති නීතිමය රාමුව තුළ පැවති හිඩැස් පියවීම්වලට අමතරව, දූෂණ විරෝධී පනත මඟින් රට තුළ දූෂණ විරෝධී ක්‍රියා මාර්ග සහ ආයතනවල විෂය පථය සහ බලතල පුළුල් කිරීම සඳහා නව විධිවිධාන හඳුන්වා දෙන ලදී. වෙළඳාමේ දී බලපෑම් කිරීම,[6] විදේශ නිලධාරීන්ට අල්ලස් දීම,[7] පෞද්ගලික අංශයේ අල්ලස් ලබා ගැනීම,[8] බැඳියාවන් අතර ගැටුම් ප්‍රකාශ කිරීමට අපොහොසත් වීම[9] සහ ක්‍රීඩාවලට සම්බන්ධ දූෂණ ක්‍රියාකාරකම් ඇතුළු[10] නව වැරදි මෙම පනතට ඇතුලත් කර ඇත. තවද, 109 වගන්තිය මඟින්, අල්ලස් මඟින් හෝ අල්ලස්වලින් ලැබූ ආදායමෙන් ලබාගත් බවට හඳුනාගත් චංචල හෝ නිශ්චල දේපළ කිසිදු බරපැනකින් තොරව රාජසන්තක කර රාජ්‍යයට පවරා දෙන ලෙස අධිකරණයට නියෝග කළ හැකි ය. 112 වගන්තියේ දී, මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත සමඟ එහි සම්බන්ධතාවය ඇති කරන අතර, එමඟින් මුදල් විශුද්ධිකරණයට එරෙහි වීම සහතික කරයි. මෙම පනත මඟින් දූෂිත ක්‍රියාවන් පිළිබඳව වාර්තා කරන පුද්ගලයන්ට ආරක්ෂාව සැපයීම ද සහතික කරන අතර, පළිගැනීමේ බියකින් තොරව එම කටයුතු සිදුකිරීමට අවස්ථාව සලසයි.

තවද, මැතිවරණ ව්‍යාපාර සඳහා මුදල් සැපයීම නියාමනය කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් 2023 අංක 3 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත සම්මත කරන ලදී. මෙම පනත මඟින් පළාත් පාලන, පළාත් සභා, පාර්ලිමේන්තු සහ ජනාධිපතිවරණ ඇතුළු සියලු මට්ටම්වල මැතිවරණ සඳහා ව්‍යාපාර මුදල් සහ වියදම් සම්බන්ධයෙන් වැදගත් රෙගුලාසි හඳුන්වා දෙන ලදී. රජයේ දෙපාර්තමේන්තු, රජයේ සැලකිය යුතු හිමිකාරීත්වයක් ඇති සමාගම්, විදේශීය රජයන්, ජාත්‍යන්තර සංවිධාන සහ නිර්නාමික මූලාශ්‍රවලින් පරිත්‍යාග ලබාගැනීම ඇතුළු වියදම් සීමා කිරීම් මෙම පනත මඟින් සිදු කෙරේ. 2024 ජනාධිපතිවරණයේ දී සහ පාර්ලිමේන්තු මැතිවරණයේ දී මෙම පනතේ විධිවිධාන භාවිතා විය.

දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියහි 5 සහ 6 වගන්ති ක්‍රියාත්මක කිරීම සඳහා, සවිස්තරාත්මක හා සම්බන්ධීකරණ ක්‍රියාකාරී සැලැස්මක් අවශ්‍ය වන බැවින්, ශ්‍රී ලංකාව 2019-2023 කාලය සඳහා ප්‍රථම වරට දූෂණය සහ අල්ලස් වැළැක්වීමේ ජාතික ක්‍රියාකාරී සැලැස්මක් (NAP) සකස් කළේය. මෙම දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම මඟින් තිරසාර සංවර්ධන අරමුණු (SDGs), විශේෂයෙන්ම ඉලක්ක 16 - සාමය, යුක්තිය සහ ශක්තිමත් ආයතන සාක්ෂාත් කර ගැනීම සඳහා ද රටට සහාය වේ. ඊට අමතරව, විවෘත රාජ්‍ය හවුල්කාරිත්වය (OGP) සහ පොදු වර්ණීය (GSP+) වෙළඳ සහන යටතේ ශ්‍රී ලංකාවේ බැඳීම්වලට ද එය අනුකූල වේ. එහි දී දූෂණ විරෝධී රාමුව වැඩිදියුණු කිරීම සහ රාජ්‍ය, පෞද්ගලික හා සිවිල් සමාජ අංශ සම්බන්ධ කර ගනිමින් ත්‍රෛපාර්ශ්වික අධීක්ෂණය සහ දූෂණ විරෝධී ප්‍රයත්නයන්හි හිමිකාරීත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා දූෂණ වැළැක්වීමේ ක්‍රියාකාරී සැලැස්මක් තිබීමේ අවශ්‍යතාවය අවධාරණය කෙරිණි. මෙම දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ දී, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් ජාත්‍යන්තර සංවිධාන සහ සිවිල් සමාජ සංවිධානවල මූල්‍ය ආධාර ඇතිව පොදු ජනතාව සහ රාජ්‍ය නිලධාරීන් ඉලක්ක කර ගනිමින් දිවයින පුරා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී. තවද, ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන ඇතුළු ජාත්‍යන්තර සංවිධාන විසින් පෙර දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්මෙහි විවිධ අංගයන් ක්‍රියාත්මක කිරීම සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත තාක්ෂණික සහාය ලබා දී ඇත.

ඊට අමතරව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහ නීතියෙන් ස්ථාපිත කර ඇති තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාව, මැතිවරණ කොමිෂන් සභාව සහ ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව ඇතුළු ස්වාධීන කොමිෂන් සභා, රටේ දූෂණ විරෝධී න්‍යාය පත්‍රයේ තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. මෙම ආයතන, සක්‍රීයව තොරතුරු හෙළිදරව් කිරීමේ අවශ්‍යතා, තොරතුරු ඉල්ලීම්වලට

6. දූෂණ විරෝධි පනතේ 104 වගන්තිය
7. දූෂණ විරෝධි පනතේ 105 වගන්තිය
8. දූෂණ විරෝධි පනතේ 106 වගන්තිය
9. දූෂණ විරෝධි පනතේ 107 වගන්තිය
10. දූෂණ විරෝධි පනතේ 108 වගන්තිය

ප්‍රවේශය, මහජන උපදේශන සහ වගවීම ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රතිපෝෂණ මාර්ග වැනි යාන්ත්‍රණයන් තුළින් පාලනයට පුරවැසියන්ගේ සහභාගීත්වය දිරිමත් කරයි.

අඛණ්ඩව බලයට පත් වූ රජයන් විසින්, මෙහෙයුම් කටයුතු විධිමත් කිරීම සහ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම අරමුණු කර ගනිමින්, ශ්‍රී ලංකාවේ රජයේ සේවාවන් ඩිජිටල්කරණය කිරීම සඳහා ද කටයුතු කර ඇත. රජයේ සේවාවන් ඔන්ලයින් වෙත ගෙනයාම මං ගින්, පුද්ගලිකව මුහුණට මුහුණ හමුවීම් අවම කරන අතර, එමඟින් දූෂණයට ඇති අවස්ථා අවම කළ හැකි ය. රජයේ තොරතුරු පද්ධතිවල අන්තර් ක්‍රියාකාරීත්වය සහතික කිරීම සඳහා විවෘත ප්‍රමිතීන් සමූහයක් වන ලංකා අන්තර්ක්‍රියාකාරීත්ව රාමුව ද (Lanka interoperability Framework) විවිධ රජයේ ආයතනවලට බාධාවකින් තොරව තොරතුරු බෙදා ගැනීමට සහ පොදු සේවාවන්හි දී මිනිස් මැදිහත්වීම අවම කිරීමට හැකි වන පරිදි ක්‍රියාත්මක කෙරේ. මිනිස් අන්තර්ක්‍රියා සීමා කිරීම, දූෂණයට ඇති අවස්ථා අවම කරනු ඇත. කෙසේ වෙතත්, රජයේ සේවාවන් ඩිජිටල්කරණය කිරීම රට තුළ සීමිත සාර්ථකත්වයක් ලබා ඇති අතර, යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, පුරවැසියන් සහ නිලධාරීන් අතර ඩිජිටල් සාක්ෂරතාවය වර්ධනය කිරීම සහ ශක්තිමත් සයිබර් ආරක්ෂණ ක්‍රියා මාර්ග සහතික කිරීම සඳහා තවදුරටත් ඒකාබද්ධ ප්‍රයත්න දැරීම අවශ්‍ය වේ. ඊට අමතරව, අභියෝගවලට මුහුණදීම සහ ඔන්ලයින් සේවාවන්හි ප්‍රතිලාභ ප්‍රවර්ධනය කිරීම සඳහා අඛණ්ඩව පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය අවශ්‍ය වන අතර, අවසානයේ දී වඩාත් විනිවිද පෙනෙන සහ කාර්යක්ෂම පාලන පද්ධතියක් සඳහා වෙහෙස විය යුතු ය.

# 04. 2019-2023 ශ්‍රී ලංකාව තුලින් අල්ලස් හා දූෂණය වැලැක්වීම සඳහා වන ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම පිළිබඳ සමාලෝචනය/ඇගයීම.

ශ්‍රී ලංකාව තුලින් අල්ලස් හා දූෂණය වැළැක්වීම සඳහා වන 2019-2023 ජාතික ක්‍රියාකාරී සැලැස්ම පිළිබඳ තක්සේරුවක් සිදු කිරීම අතිශයින්ම වැදගත් වන්නේ, පෙර පැවති උපාය මාර්ග සහ මුලපිරීම්වල ඵලදායීතාවය පිළිබඳ වැදගත් තොරතුරු සැපයීම තුළින් සාර්ථක වූ හා අසාර්ථක වූ කරුණු හඳුනා ගැනීමට එය පිටිවහලක් වන බැවිනි. මෙම තක්සේරුව මඟින් ප්‍රතිපත්ති සම්පාදකයින්ට සාර්ථකත්වයන්ගෙන් මෙන්ම අසාර්ථකත්වයන්ගෙන් ද ඉගෙන ගැනීමට අවස්ථාව සැලසෙන අතර, වර්තමාන සැලැස්ම සාක්ෂිමය පදනමක් සහිත ශක්තිමත් අඩිතාලමක් මත ගොඩනැඟීම සහතික කෙරේ. තවද, දූෂණයට එරෙහිව සටන් කිරීමේ දී ඔවුන්ගේ භූමිකාවන්හි වගකීම භාර ගැනීමට ක්‍රියාත්මක කරන ආයතන දිරිගන්වමින්, ඔවුන් අතර වගවීමක් ඇති කිරීමට ද එය මහෝපකාරී වේ.

2019-2023 සැලැස්මෙහි අධීක්ෂණය සහ ඇගයීම ජනාධිපතිවරයා විසින් පත් කරන ලද ස්වාධීන විශේෂඥයින්ගෙන් සමන්විත 'ජාතික සුපිළිපන්න සභාව' විසින් සිදු කිරීමට නියමිතව තිබුණි. මෙම සභාවට ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම පිළිබඳව වරින් වර සමාලෝචන සිදු කිරීම, ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPI) සකස් කිරීම සහ අවශ්‍ය නම් අමතර සම්පත් වෙන් කරන ලෙස අයවැය ආයතනවලට උපදෙස් දීම ඇතුළු කාර්යයන් පැවරී තිබුණි. ඊට අමතරව ජාතික ක්‍රියාකාරී සැලැස්මෙහි ඵලදායී ක්‍රියාකාරීත්වය සහතික කිරීම සඳහා වරින් වර ජනාධිපති ලේකම් කාර්යාලයට වාර්තා කිරීම ද අවශ්‍ය විය. කෙසේ වෙතත්, මේ දක්වා ජනාධිපතිවරයා විසින් ජාතික සුපිළිපන්න සභාව පත් කර නොමැති අතර, එමඟින් 2019-2023 ජාතික ක්‍රියාකාරී සැලැස්මෙහි ඵලදායී අධීක්ෂණය සහ ඇගයීම අඩපණ විය.

එහි ප්‍රතිඵලයක් ලෙස, ඇගයීම සඳහා, දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්මෙහි එක් එක් ආයතනයට පවරා ඇති ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම පිළිබඳ ප්‍රගති වාර්තාවක් ලබා දෙන ලෙස සියලුම වගකිවයුතු ආයතනවලින් ඉල්ලා සිටින ලදී. මෙම එක් එක් ක්‍රියාකාරකම සම්පූර්ණ කර ඇත් ද / ක්‍රියාත්මක වෙමින් පවතීද / කිසිසේත්ම ක්‍රියාත්මක කර නොමැති ද යන්න පිළිබඳ තත්ත්වය, සෑම අභියෝගයක් සහ සෑම ක්‍රියාකාරකමක් සම්බන්ධයෙන්ම නිරීක්ෂණ ද සහිතව වාර්තා කරන ලෙස මෙම ආයතනවලින් ඉල්ලා සිටින ලදී.

## අ. ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය

2019 දෙසැම්බර් මාසයේ දී අවසන් වීමට නියමිතව තිබූ 2019-2023 ජාතික ක්‍රියාකාරී සැලැස්ම, කොමිසන් සභා තීරණයකට අනුව 2024 දෙසැම්බර් දක්වා දීර්ඝ කර ඇති අතර, එහි ක්‍රියාත්මක කිරීමේ කාලය තුළ මධ්‍යස්ථ ප්‍රගතියක් අත් කර ගෙන ඇත. "ඇ" උපාය මාර්ගය (නීතිය සහ ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණ) යටතේ බොහෝ ක්‍රියා මාර්ග සාර්ථකව ක්‍රියාත්මක කර ඇති අතර, අදාළ ඉලක්ක ද සාක්ෂාත් කරගැනීමට හැකි වී ඇත. තවද, "ඇ" උපාය මාර්ගය (අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සහ අනෙකුත් නීතිය ක්‍රියාත්මක කරන ආයතන ශක්තිමත් කිරීම) යටතේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත පැවරී තිබූ බොහෝ ආයතනික සහ මෙහෙයුම්මය ප්‍රතිසංස්කරණ කටයුතු සාර්ථකව නිමවා ඇති අතර, "ආ" උපාය මාර්ගය (වටිනාකම් පදනම් කරගත් අධ්‍යාපනය සහ ප්‍රජා සහභාගීත්වය) යටතේ දූෂණ විරෝධී පණිවිඩ ප්‍රචාරය කිරීම සඳහා අවශ්‍ය මෙවලම් සංවර්ධනය කිරීමේ කටයුතු ද සාර්ථකව සිදුකර ඇත.

විවිධ වගකිවයුතු ආයතනවලින් ලැබුණු ප්‍රගති වාර්තා මඟින්, "අ" උපාය මාර්ගය (නිවාරණ ක්‍රියා මාර්ග) සහ "ආ" උපාය මාර්යේ (අධ්‍යාපනය සහ ප්‍රජා සහභාගීත්වය) දක්වා ඇති දැනුවත් කිරීමේ මුල පිරීම් කිහිපයක් සාර්ථකව ඉටු කර ඇති බව පෙන්වා දී ඇත. කෙසේ වෙතත්, නිවාරණ ප්‍රතිපත්ති සංවර්ධනය කිරීම සහ පාසල්, විශ්වවිද්‍යාල, වෘත්තීය පුහුණුව සහ රාජ්‍ය නිලධාරීන්ගේ පුහුණුව

සඳහා විෂය මාලාවලට දූෂණ විරෝධී අධ්‍යාපනය ඒකාබද්ධ කිරීම වැනි වෙනත් වැදගත් ක්‍රියා මාර්ග ක්‍රියාත්මක කර නොමැත. පෞද්ගලික අංශයේ සහභාගීත්වය සහ සහයෝගීතාවය අපේක්ෂා කළ බොහෝ ක්‍රියා මාර්ගවලට තවමත් ප්‍රතිචාර ලැබී නොමැත. දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්මෙහි ඵලදායීතාවය වැඩි දියුණු කිරීම සඳහාත්, අනාගතය සඳහා වඩාත් පුළුල් හා තිරසාර දූෂණ විරෝධී උපාය මාර්ගයක් සහතික කිරීම සඳහාත්, ඉදිරියට යමින් මෙම ක්ෂේත්‍ර කෙරෙහි නව අවධානයක් යොමු කිරීමේ අවශ්‍යතාවය මෙමඟින් අවධාරණය කරයි.

## ආ. ප්‍රධාන ගැටලු සහ අභියෝග

2019-2023 ජාතික ක්‍රියාකාරී සැලැස්ම සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා වූ ප්‍රධාන අභියෝගය වූයේ ජාතික ජාතික සුපිළිපන්න සභාව පත් නොකිරීමයි. ජාතික ක්‍රියාකාරී සැලැස්ම වරින් වර සමාලෝචනය කිරීමේ සහ අවශ්‍ය වෙනස්කම් සිදුකිරීමේ කාර්යය පැවරී තිබූ මෙම සභාව නොමැති වීම, ජාතික ක්‍රියාකාරී සැලැස්මෙහි ප්‍රගතිය පිළිබඳව කාලෝචිත ඇගයීම් සිදු කිරීමට නොහැකි වීමට හේතු විය. එහි ප්‍රතිඵලයක් ලෙස, ක්‍රියා මාර්ගවල ප්‍රගතිය ඵලදායී ලෙස අධීක්ෂණය කිරීමටත්, ප්‍රතිඵල ඇගයීමටත්, එම ඇගයීම් මත පදනම්ව මැදිහත්වීම් නැවත තක්සේරු කිරීමටත් නොහැකි විය. එමනිසා, උපරිම බලපෑමක් ඇති කිරීම සඳහා නියමිත වේලාවට ක්‍රියා මාර්ගවලට අවශ්‍ය වෙනස්කම් සිදුකිරීමට නොහැකි විය. මෙයින් ලද අත්දැකීම නම් දේශපාලනමය වශයෙන් වෙනස් වීමට භාජනය විය හැකි නව ව්‍යුහයන් ඇති කරනවා වෙනුවට, අධීක්ෂණය සහ ඇගයීම සඳහා පවතින ව්‍යුහයන් උපයෝගී කර ගැනීමයි.

මීට අමතරව, වගකිවයුතු ආයතනවලින් ලැබුණු ප්‍රතිපෝෂණ මඟින් විවිධ ආයතනවලට පවරා ඇති දූෂණ විරෝධී ක්‍රියා මාර්ගවල ඵලදායීතාවයට බාධා කළ අභියෝග කිහිපයක් පහත පරිදි අනාවරණය වේ:

අ. **සීමිත සම්පත්:** මිනිස්, මූල්‍ය සහ යටිතල පහසුකම් සම්පත්වල සැලකිය යුතු හිඟයක් පවතී. ප්‍රමාණවත් සම්පත් නොමැති වීම නිසා අවශ්‍ය මෙවලම් සහ තාක්ෂණයන් සඳහා ආයෝජනය කිරීමටත්, නවතම දූෂණ විරෝධී උපාය මාර්ග, නීතිමය වෙනස්කම් සහ මනා භාවිතාවන් පිළිබඳව දැනුවත්ව සිටීම සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන් පැවැත්වීමටත් ඇති හැකියාව සීමා කරයි. නීතිය ක්‍රියාත්මක කරන ආයතන වෙත ප්‍රමාණවත් සම්පත් වෙන් නොකිරීම නිසා දූෂණ නඩු විමර්ශනය කිරීමේ සහ නඩු පැවරීමේ හැකියාවට බාධා එල්ල වේ.

ආ. **කාර්ය බහුලත්වය:** අධික රාජකාරී බර, නිලධාරීන්ට අත්‍යවශ්‍ය පුහුණු වැඩසටහන්වලට සහභාගී වීමට බාධාවක් වන අතර, එමඟින් ඔවුන්ගේ කුසලතා සහ දැනුම වැඩිදියුණු කරගැනීමේ හැකියාව සීමා කරයි. නිලධාරීන් රාජකාරිවලින් යටපත් වූ විට, දිගුකාලීන කුසලතා වර්ධනයට වඩා ක්ෂණිකව ඉටුකළ යුතු කාර්යයන් සඳහා ප්‍රමුඛතාවය දීම නිසා, පුහුණු සැසිවලට සහභාගී වීමට ඇති කැමැත්ත අඩු විය හැකියි. මෙමගින් දූෂණ විරෝධී උපාය මාර්ග පිළිබඳ නවතම දැනුම සහ මනා භාවිතාවන් පිළිබඳව දැනුවත්ව සිටීමේ අවස්ථාව අහිමි වන අතර, මතුවන අභියෝගවලට ඵලදායී ලෙස මුහුණ දීමේ හැකියාව අඩු කරයි.

ඇ. **අඛණ්ඩ පුහුණුවල අවශ්‍යතාවය:** දූෂණ විරෝධී ප්‍රයත්නයන්හි ගම්‍යතාවය පවත්වා ගැනීම සහ වෙනස් වන අභියෝගවලට මුහුණදීම සඳහා අඛණ්ඩ පුහුණුව සහ අධ්‍යාපනික වැඩසටහන් අත්‍යවශ්‍ය වේ. අඛණ්ඩ පුහුණුව සහ අධ්‍යාපනික වැඩසටහන් නොමැතිකම, දූෂණ විරෝධී ප්‍රයත්නයන්ට බාධා ඇති කරන අතර, දූෂණයට එරෙහිව ස්ථිරසාරව සටන් කිරීමේ හැකියාවට බාධා පමුණුවයි. නිතිපතා පුහුණුවක් නොමැතිව, කාර්ය මණ්ඩලය දූෂණ විරෝධී උපාය මාර්ග, නීතිමය රාමු සහ දූෂිත ක්‍රියාවන්හි නව ප්‍රවණතා පිළිබඳව යාවත්කාලීන දැනුමක් නොමැතිව සිටියි. මෙම දැනුමේ හිඩැස, දූෂණය ඵලදායී ලෙස හඳුනාගැනීමට සහ එයට එරෙහිව සටන් කිරීමට ඇති හැකියාවට බාධා පමුණුවන අතර, එමගින් ආයතන නව ආකාරයේ දූෂණයන්ට ගොදුරු වීමට ඉඩ ඇත. එය, සැක සහිත ක්‍රියාකාරකම් වාර්තා කිරීමට හෝ අවශ්‍ය ප්‍රතිසංස්කරණ වෙනුවෙන් පෙනී සිටීමට සේවකයින් තුළ ඇති අකමැත්තක් ඇති කරමින්, නොසැලකිලිමත්කමේ සංස්කෘතියක් ඇති කරයි.

ඈ. **ආයතනික ප්‍රතිරෝධය:** ඇතැම් විටෙක, ආයතන තුළ පවතින ප්‍රතිරෝධය, තහවුරු වී ඇති භාවිතයන් සහ චින්තනයන් හේතුවෙන්, දූෂණ විරෝධී මුල පිරීම් පිළි ගැනීමට සහ ක්‍රියාත්මක කිරීමට බාධා ඇති කර ඇත. නව දූෂණ විරෝධී ක්‍රියා මාර්ග හඳුන්වාදීමට ගත් උත්සාහයන් සැකයකින් හෝ දැඩි විරෝධයකින් යුතුව ප්‍රතික්ෂේප කරනු ලැබේ. වසර ගණනාවක් තිස්සේ මෙම රාමුව තුළ ක්‍රියාත්මක වූ සේවකයින්, වෙනස්කම්වලට බිය විය හැකි අතර, එමගින් ඔවුන්ගේ භූමිකාවන්ට බාධා ඇති වේ යැයි හෝ ඔවුන්ගේ බලයට අභියෝගයක් එල්ල වේ යැයි සිතා වෙනස්කම්වලට එරෙහි විය හැකි ය.

ඉ. **සංස්කෘතික හා ව්‍යුහාත්මක බාධක:** ආයතන තුළ පවතින අවිධිමත් සංස්කෘතීන් සහ ව්‍යුහාත්මක බාධක, විශේෂයෙන් පෞද්ගලික අංශය තුළ, විනිවිදභාවය සහ වගවීම ප්‍රවර්ධනය කිරීමේ ප්‍රයත්නයන්ට බාධා ඇති කළ හැකි ය. මෙම සංස්කෘතික සම්මතයන්, සේවකයින්ව වැරදි හැසිරීම් වාර්තා කිරීමෙන් හෝ වගකීමක් පැවරීමෙන් අධෛර්යමත් කළ හැකි අතර, නිහඬතාවය සහ වරදට අනුබල දෙන තත්වයක් වර්ධනය කරයි. තවද, ආයතනවල සදාචාරාත්මක හැසිරීම් පිළිබඳ පැහැදිලි ප්‍රතිපත්ති හෝ මාර්ගෝපදේශ නොමැති විට, සේවකයින්ට ඔවුන්ගෙන් අපේක්ෂා කරන ප්‍රමිතීන් පිළිබඳව අවිනිශ්චිතතාවයක් ඇතිවිය හැකි අතර, එමගින් අනුකූල නොවන භාවිතයන්ට සහ දූෂණ අවදානම ඉහළ යෑමට ඉඩ ඇත.

ඊ. **ඵලදායී නොවන නීතිය ක්‍රියාත්මක කිරීම:** දූෂණ විරෝධී නීති සහ ප්‍රතිපත්ති ඵලදායී ලෙස ක්‍රියාත්මක නොකිරීම, ඒවායේ අපේක්ෂිත බලපෑම අඩු කරන අතර, දූෂිත ක්‍රියාවන් දිගටම පැවතීමට ඉඩ සලසයි. ශක්තිමත් දූෂණ විරෝධී නීතිමය රාමුවක් තිබියදීත්, ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණ දුර්වල හෝ අනුකූල නොවන ලෙස යෙදූ විට, සදාචාර විරෝධී හැසිරීම් සඳහා වගකිව යුතු අය කිසිදු ප්‍රතිවිපාකයකට ලක් නොවන බව පුද්ගලයන්ට සහ ආයතනවලට හැඟෙන අතර, එමගින් දඬුවම් නොලැබීමේ සංස්කෘතියක් වර්ධනය වේ.

උ. **ශක්තිමත් දේශපාලන කැපවීමක අවශ්‍යතාව:** දූෂණ විරෝධී මුලපිරීම් ඉදිරියට ගෙනයාමට සහ සුපිළිපන්න බව පිළිබඳ සංස්කෘතියක් ඇති කිරීමට දේශපාලන නායකයින්ගේ ශක්තිමත් කැපවීමක් අත්‍යවශ්‍ය වේ. රජයේ නායකයින්ගේ ශක්තිමත් කැපවීමක් නොමැතිකම, දූෂණ විරෝධී මුලපිරීම් ඉදිරියට ගෙනයාමට සහ සුපිළිපන්න බව පිළිබඳ සංස්කෘතියක් වර්ධනය කිරීමට තීරණාත්මක බාධාවක් වන අතර, විශේෂයෙන් අවශ්‍ය සම්පත් වෙන් කිරීම සහ දූෂණ විරෝධී ක්‍රියා මාර්ග ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම යන කරුණුවල දී එය තදින්ම දැනෙයි. නායකයින් මෙම මුල පිරීම් සඳහා ක්‍රියාකාරීව සහයෝගය දක්වන විට, ඔවුන් වගවීමේ ආකල්පයක් ඇති කරනවා පමණක් නො ව, රජය තුළ සහ සමාජයේ සිටින අන් අයව ද එවැනිම ස්ථාවරයන් ගැනීමට පෙළඹවීමක් සිදු කරයි. විනිවිදභාවයකින් යුත් පරිසරයක් ගොඩනැගීම සඳහාත්, සදාචාරාත්මක හැසිරීම් අපේක්ෂා කරන සහ ඊට ප්‍රශංසා කරන තත්වයක් ඇති කිරීම සඳහාත් මෙම නායකත්වය අත්‍යවශ්‍ය වේ. මෙම කැපවීම නොමැතිව, දූෂණ විරෝධී ප්‍රයත්නයන්ට අර්ථවත් වෙනසක් ඇති කිරීමට අවශ්‍ය සහයෝගය සහ ගම්‍යතාවය නොමැති විය හැකි අතර, එහි ප්‍රතිඵලයක් ලෙස දූෂණයේ අඛණ්ඩ චක්‍රයක් සහ රාජ්‍ය ආයතන කෙරෙහි ජනතා විශ්වාසය බිඳ වැටීමක් සිදුවිය හැකියි.

මෙම අභියෝගවලට මුහුණදීම, දූෂණ විරෝධී ක්‍රියා මාර්ගවල කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමටත්, වඩාත් විනිවිද පෙනෙන සහ වගකිවයුතු පාලන රාමුවක් ස්ථාපිත කිරීමටත් ඉතා වැදගත් වේ. මෙම ගැටලු විසඳීමෙන්, ඵලදායී දූෂණ විරෝධී ක්‍රියා මාර්ග සඳහා වඩාත් හිතකර පරිසරයක් නිර්මාණය කිරීමට පාර්ශ්වකරුවන්ට හැකි වනු ඇත.



# 05. කාචයක සටහන්




Date – 5th December, 2024
Venue –Anthurium Hall, Taj Samudra Hotel, Colombo, Sri Lanka





## 06. ක්‍රියාකාරී සැලැස්ම - උපාය මාර්ගික ප්‍රමුඛතා ක්ෂේත්‍ර



අ. නිවාරණ කටයුතු



ආ. අධ්‍යාපනය සහ ප්‍රජා සහභාගීත්වය



ඇ. ආයතනික ශක්තිමත් කිරීම සහ ක්‍රියාත්මක කිරීම



ඈ. නීතිය සහ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ



පිහාටු - ආරක්ෂණය

# අ. නිවාරණ කටයුතු

## අ. නිවාරණ කටයුතු

**පළමුවන උපාය මාර්ගික ප්‍රමුඛතා ක්ෂේත්‍රය: නිවාරණ කටයුතු**

දූෂණය සිදුවීමට පෙර එය වළක්වා ගැනීමට වැරදි සගහත හැසිරීම් සඳහා ඇති අවස්ථා අවම කිරීම සහ දූෂිත හැසිරීම් මැඩපැවැත්වීම සඳහා වන පද්ධති ශක්තිමත් කිරීම ඉතා වැදගත් වේ. විනිවිදභාවය, වගවීම සහ ඵලදායී අධීක්ෂණ යාන්ත්‍රණ පද්ධතිවල නොමැති විට දූෂණය වර්ධනය වන බව හඳුනා ගැනීම මත එය පදනම් වේ. දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතියේ (UNCAC) ප්‍රධාන අංගයන්ගෙන් එකක් වන්නේ දූෂණය වැළැක්වීමයි. දූෂණයට හේතු වන තත්වයන් අවම කිරීමට සහ දූෂණය සිදුවීමට පෙර එය තුරන් කිරීම අරමුණු කරගත් ක්‍රියාකාරී පියවර ගැනීමට සාමාජික රටවලට දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ ප්‍රඥාප්තිය දිරිගන්වයි.

මෙම දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම (NACAP), 'නිවාරණ කටයුතු' එහි ප්‍රධාන උපාය මාර්ගික ක්ෂේත්‍රවලින් එකක් ලෙස යෝජනා කරන අතර, එහි සමස්ත උපාය මාර්ගික අරමුණ වන්නේ 'විනිවිදභාවය, වගවීම සහ සුපිළිපන්නභාවය ආයතනගත කිරීම සඳහා සියලු අංශවල දූෂණ අවදානම් අවම කිරීමට සහ සදාචාරාත්මක භාවිතයන් ප්‍රවර්ධනය කිරීමට පුළුල් නිවාරණ පියවර ක්‍රියාත්මක කිරීම' යන්නයි. දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්මහි වැළැක්වීම කෙරෙහි දක්වන අවධානය, දූෂණයට මුහුණ දීම සඳහා පුළුල් ප්‍රවේශයක් සපයන අතර, තනි පුද්ගල වගවීම කෙරෙහි පමණක් නො ව, අනාගත දූෂණ අවදානම්වලින් ආරක්ෂා විය හැකි ක්‍රමවත් ව්‍යුහයන් ශක්තිමත් කිරීම කෙරෙහි ද අවධානය යොමු කරයි. පහත කොටස් මඟින් විනිවිදභාවය, වගවීම සහ යහපාලනය ප්‍රවර්ධනය කරන අතර ශ්‍රී ලංකාවේ පවතින දූෂණ සංස්කෘතියට මුහුණ දීමේ, එය අවම කිරීමේ සහ අවසානයේ දී එය තුරන් කිරීමේ අපේක්ෂාවෙන් ශක්තිමත් අපරාධ යුක්ති විනිශ්චය රාමුව දිරිමත් කරනු ලැබේ.

ඒ අනුව, දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම (NACAP) දූෂණය වැළැක්වීම සඳහා පහත සඳහන් **උප අරමුණු හත** (07) යෝජනා කරයි:

1. රාජ්‍ය අංශය තුළ සුපිළිපන්නභාවය වැඩි දියුණු කිරීම සහ දූෂණය වැළැක්වීම සඳහා ක්‍රියාකාරී පියවර ක්‍රියාත්මක කිරීම.
2. රාජ්‍ය අංශය තුළ බැඳියාවන් අතර ගැටීම (Conflicts of Interest), වත්කම් ප්‍රකාශ කිරීම සහ තෑගි රෙගුලාසි කළමනාකරණය වැඩි දියුණු කිරීම.
3. රාජ්‍ය සේවාවන්හි විනිවිදභාවය, වගවීම සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා පුරවැසියන්ට රාජ්‍ය සේවා සඳහා ඇති ප්‍රවේශය වැඩිදියුණු කිරීම සහ ප්‍රශස්ත කිරීම.
4. දූෂණය වැළැක්වීම සහ ඵලදායී සම්පත් වෙන් කිරීම සහතික කිරීම සඳහා රාජ්‍ය ප්‍රසම්පාදන සහ රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේ සුපිළිපන්නභාවය සහ විනිවිදභාවය වැඩි දියුණු කිරීම.
5. තේරී පත් වූ නියෝජිතයින්ගේ සුපිළිපන්නභාවය සහ වගවීම සහතික කිරීම සඳහා ශක්තිමත් යාන්ත්‍රණ ස්ථාපිත කිරීම, මහජන විශ්වාසය සහ සදාචාරාත්මක පාලනය පෝෂණය කිරීම.
6. අපරාධ යුක්ති විනිශ්චය පද්ධතියේ සුපිළිපන්නභාවය සහ ඵලදායීතාවය පිළිබඳ මහජන විශ්වාසය වැඩි දියුණු කිරීම.
7. පෞද්ගලික අංශය තුළ දූෂණය වැළැක්වීම සහ සදාචාරාත්මක ව්‍යාපාරික භාවිතයන් ප්‍රවර්ධනය කිරීම සඳහා ඉලක්කගත මුලපිරීම් ක්‍රියාත්මක කිරීම.

දූෂණය සිදුවීමෙන් පසු එයට ප්‍රතිචාර දැක්වීමට වඩා දූෂණය වැළැක්වීම වඩා ලාභදායී සහ තිරසාර බව හඳුනා ගනිමින්, මෙම පියවර ඵලදායී වීමට නම්, රාජ්‍ය හා පෞද්ගලික යන දෙඅංශයෙන්ම කැපවීම සහ අඛණ්ඩ ප්‍රයත්නයන් මෙන්ම පොදුවේ මහජනතාවගේ සහ ගෝලීය ප්‍රජාවගේ සහාය අවශ්‍ය බව තරයේ සටහන් කර ගත යුතු ය. ප්‍රධානීන් සඳහා පුහුණු වැඩසටහන් පවත්වන බව සහතික කිරීම.

| උපාය මාර්ගික අරමුණ: විනිවිදභාවය, වගවීම සහ සුපිළිපන්නභාවය ආයතනගත කිරීම සඳහා සියලු අංශවල දූෂණ අවදානම් අවම කිරීමට සහ සදාචාරාත්මක භාවිතයන් ප්‍රවර්ධනය කිරීමට පුළුල් නිවාරණ පියවර ක්‍රියාත්මක කිරීම. | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| උප අරමුණ 1: රාජ්‍ය අංශය තුළ සුපිළිපන්නභාවය වැඩි දියුණු කිරීම සහ දූෂණය වැළැක්වීම සඳහා ක්‍රියාකාරී පියවර ක්‍රියාත්මක කිරීම. | | | | | | | |
| No. | මිනුම/ ක්‍රියා මාර්ග | ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPIs) | කාල රාමුව | | | වගකිව යුතු (ප්‍රධාන) ආයතන | ක්‍රියාත්මක කරන ආයතන |
| | | | කෙටි | මධ්‍ය | දිර්ඝ | | |
| 1 | සෑම රාජ්‍ය ආයතනයකම අභ්‍යන්තර කටයුතු ඒකක (Internal Affairs Units - IAU) පිහිටුවීම තුළින් දූෂණයට එරෙහිව සටන් කිරීම, සදාචාරාත්මක හැසිරීම් පෝෂණය කිරීම සහ රාජ්‍ය ආයතන තුළ විනිවිදභාවය සහතික කිරීම. | 1. පිහිටුවා ඇති අභ්‍යන්තර කටයුතු ඒකක සංඛ්‍යාව.<br>2. අභ්‍යන්තර කටයුතු ඒකකවල කාර්යක්ෂමතාව සහ විනිවිදභාවය සම්බන්ධයෙන් පාර්ශ්වකරුවන්ගේ සමීක්ෂණවල තෘප්තිමත්භාවයේ ප්‍රතිශතය අවම වශයෙන් 75%ක් විය යුතු ය. | කෙටිකාලීන | | | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව<br>ජනාධිපති ලේකම් කාර්යාලය | සියලුම රාජ්‍ය ආයතන |
| 2 | සියලුම අභ්‍යන්තර කටයුතු ඒකකවල සාමාජිකයන්ට; ඔවුන්ගේ රාජකාරි කාර්යක්ෂමව ඉටු කිරීමට අවශ්‍ය දැනුම, කුසලතා සහ මෙවලම් ලබා දීම සඳහා අභ්‍යන්තර කටයුතු ඒකකවල මෙහෙයුම් සහ සාරාංශ කරුණු පිළිබඳව මූලික සහ වරින් වර යාවත්කාලීන පුහුණු වැඩසටහන් පැවැත්වීම. | 1. පුහුණුව සඳහා අවශ්‍ය වන සියලුම මෙවලම් සකසා නිම කිරීම<br>2. පවත්වන ලද පුහුණු සැසි ගණන.<br>3. පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වීමේ ප්‍රතිශතය අවම වශයෙන් 90%ක් විය යුතු ය.<br>4. පුහුණුව සම්පූර්ණ කිරීමේ ප්‍රතිශතය අවම වශයෙන් 95%ක් විය යුතු ය.<br>5. පුහුණුවෙන් පසු දැනුම ඇගයීමේදී, මෙහෙයුම් සහ සාරාංශ කරුණු පිළිබඳ දැනුම රඳවා තබා ගැනීම සහ අවබෝධය සාමාන්‍යයෙන් 80%ක් විය යුතු ය.<br>6. වසරින් වසර දූෂණ සිදුවීම් වල අඩුවීම. | කෙටිකාලීන<br>මධ්‍යකාලීන | | | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | සියලුම රාජ්‍ය ආයතන |

| | | | | | |
|---|---|---|---|---|---|
| 3 | අභ්‍යන්තර කටයුතු ඒකකයෙන් පිටත සිටින අනෙකුත් කාර්ය මණ්ඩල සාමාජිකයින්ට දූෂණය නිවාරණ පියවර පිළිබඳව පුහුණු කිරීම. | 1. සකසන ලද සියලුම පුහුණු මෙවලම්<br>2. පවත්වන ලද පුහුණු සැසි ගණන.<br>3. පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වීමේ ප්‍රතිශතය අවම වශයෙන් 90%ක් විය යුතු ය.<br>4. පුහුණුව සම්පූර්ණ කිරීමේ ප්‍රතිශතය අවම වශයෙන් 95%ක් විය යුතු ය.<br>5. පුහුණුවට පෙර සහ පසු ඇගයීම්වල ලකුණු සංසන්දනය කිරීමේදී, පුහුණුවෙන් පසු දැනුම වැඩිදියුණු වීමේ ප්‍රතිශතය අවම වශයෙන් 30%ක් විය යුතු ය.<br>6. ඔවුන්ගේ දෙපාර්තමේන්තු තුළ සිදුවන දූෂණ විරෝධී වැඩසටහන්වලට අවම වශයෙන් 50%ක සහභාගීත්වයක් තිබිය යුතු ය.<br>7. වසරින් වසර දූෂණ සිදුවීම් අඩුවීම. | කෙටිකාලීන මධ්‍යකාලීන | සියලුම රාජ්‍ය ආයතනවල අභ්‍යන්තර කටයුතු ඒකක | සියලුම රාජ්‍ය ආයතන |

| | | | | | |
|---|---|---|---|---|---|
| 4 | සෑම ආයතනයක් තුළම පවතින දූෂණ අවදානම් හඳුනා ගැනීම සඳහා සෑම වසර 3කට වරක් ආයතනික දූෂණ අවදානම් තක්සේරු (Institutional Corruption Risk Assessments - ICRA) පැවැත්වීම සහ පහත ක්‍රියා මාර්ග මගින් සොයාගැනීම් ප්‍රකාශයට පත් කිරීම<br><br>i. ආයතනික දූෂණ අවදානම් තක්සේරු ක්‍රමවේදයන් සහ රාමු සංවර්ධනය කිරීම.<br><br>ii. විවිධ විශේෂඥ දැනුම සහතික කරමින් ආයතනික දූෂණ අවදානම් තක්සේරු පැවැත්වීම සඳහා ස්වාධීන බහුකාර්ය කණ්ඩායම් හඳුනා ගැනීම.<br><br>iii. සෑම ආයතනයකම කාර්ය මණ්ඩලය සඳහා ආයතනික දූෂණ අවදානම් තක්සේරු ක්‍රියාත්මක කිරීම පිළිබඳ පුහුණුව ලබා දීම.<br><br>iv. ආයතනික දූෂණ අවදානම් තක්සේරු සැලසුම් කර සිදු කිරීම.<br><br>v. නිර්දේශිත පියවර ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සහ කාලයාගේ ඇවෑමෙන් සිදුවන වැඩිදියුණු කිරීම් නිරීක්ෂණය කිරීම සඳහා පසු විපරම් සැලැස්මක් ස්ථාපිත කිරීම. | 1. ආයතනික දූෂණ අවදානම් තක්සේරු (ICRA) ක්‍රමවේදය සංවර්ධනය කිරීම.<br><br>2. ස්වාධීන බහුකාර්ය කණ්ඩායම් පිහිටුවීම.<br><br>3. ආයතනික දූෂණ අවදානම් තක්සේරු (ICRA) ක්‍රියාත්මක කිරීම පිළිබඳ පුහුණුව සම්පූර්ණ කිරීම.<br><br>4. ආයතනික දූෂණ අවදානම් තක්සේරු (ICRA) සැලසුම් කර සිදුකිරීම.<br><br>5. ආයතනික දූෂණ අවදානම් තක්සේරුවේ (ICRA) සොයාගැනීම් ප්‍රකාශයට පත් කිරීම.<br><br>6. නිර්දේශිත ක්‍රියා මාර්ගවලින් අවම වශයෙන් 60%ක් අනුගමනය කිරීම.<br><br>7. හඳුනාගත් අවදානම්වල වැඩිදියුණු කිරීම් මැනීම සඳහා පසු විපරම් ඇගයීමක් පැවැත්වීම. | මධ්‍යකාලීන | සියලුම රාජ්‍ය ආයතන | සියලුම රාජ්‍ය ආයතනවල අභ්‍යන්තර කටයුතු ඒකක |

| | | | | | |
|---|---|---|---|---|---|
| 5 | මෙම ජාතික ක්‍රියාකාරී සැලැස්ම (NAP) සහ ආයතනික දූෂණ අවදානම් තක්සේරුවලට (ICRA) අනුව, දූෂණයට එරෙහිව ක්‍රියාශීලීව සටන් කිරීම සඳහා ආයතනික ක්‍රියාකාරී සැලසුම් (Institutional Action Plans - IAPs) සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම, පහත ක්‍රියා මාර්ග මඟින් සිදුකරනු ලැබේ<br>v. ආයතනික ක්‍රියාකාරී සැලසුම් (IAPs) සකස් කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම.<br>vi. ඉහත කරුණු මත පදනම්ව අල්ලස් හා දූෂණය වැළැක්වීම සඳහා ආයතනික ක්‍රියාකාරී සැලසුම් (IAPs) සකස් කිරීමට චක්‍රලේඛ නිකුත් කිරීම.<br>vii. ආයතනික මට්ටමින් ආයතනික ක්‍රියාකාරී සැලසුම් (IAPs) ක්‍රියාත්මක කිරීම/ අනුගමනය කිරීම. | 1. පුහුණුව සඳහා අවශ්‍ය වන සියලුම මෙවලම් සකසා නිම කිරීම.<br>2. පවත්වන ලද පුහුණු සැසි ගණන.<br>3. පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වීමේ ප්‍රතිශතය අවම වශයෙන් 90%ක් විය යුතු ය.<br>4. චක්‍රලේඛන නිකුත් කිරීම.<br>5. මාස 12ක් ඇතුළත ආයතනික ක්‍රියාකාරී සැලසුම් (IAPs) සකස් කිරීම.<br>6. ක්‍රියාකාරී සැලසුම්වල ක්‍රියාවන්ගෙන් අවම වශයෙන් 75%ක් වත් අනුගමනය කිරීම. | මධ්‍යකාලීන | සියලුම රාජ්‍ය ආයතන | සියලුම රාජ්‍ය ආයතනවල අභ්‍යන්තර කටයුතු ඒකක |

| | | | | | |
|---|---|---|---|---|---|
| 6 | සේවකයින්ට දූෂිත ක්‍රියාවන් වාර්තා කිරීම සඳහා අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව වෙත සම්බන්ධිත ආරක්ෂිත සහ රහස්‍ය වාර්තා කිරීමේ නාලිකා භාවිතා කරමින්, ආරක්ෂිත වාර්තා කිරීමේ යාන්ත්‍රණ (අනන්‍යතාවය හෙළි නොවන වාර්තා කිරීමේ යාන්ත්‍රණ ඇතුළුව) අභ්‍යන්තර කටයුතු ඒකක (IAU) හරහා සංවර්ධනය කිරීම. | 1. ආයතනික තොරතුරු හෙළි කරන්නන් ආරක්ෂා කිරීමේ ප්‍රතිපත්ති කෙටුම්පත් කර සම්මත කිරීම.<br>2. අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව වෙත සම්බන්ධිත ආරක්ෂිත සහ රහස්‍ය වාර්තා කිරීමේ නාලිකා ස්ථාපිත කිරීම.<br>3. පරිශීලක ප්‍රවේශ්‍යතා අනුපාතය 100%ක් විය යුතු ය.<br>4. සිදුවීම් වාර්තා කිරීමේ පරිමාව පළමු වසරේ දී 25%ක වැඩිවීමක් පෙන්නුම් කරයි.<br>5. වාර්තා කිරීමේ යාන්ත්‍රණවල ඵලදායිතාවය සහ රහස්‍යභාවය සම්බන්ධයෙන් වාර්ෂික පරිශීලක සමීක්ෂණවල තෘප්තිමත්භාවයේ ප්‍රතිශතය අවම වශයෙන් 75%ක් විය යුතු ය. | කෙටිකාලීන මධ්‍යකාලීන | සියලුම රාජ්‍ය ආයතන | සියලුම රාජ්‍ය ආයතනවල අභ්‍යන්තර කටයුතු ඒකක |
| 7 | සියලුම රාජ්‍ය ආයතන සඳහා සුපිළිපන්න නිලධාරීන් (Integrity Officers) පත් කිරීම අඛණ්ඩව සිදු කිරීම සහ ඔවුන් අභ්‍යන්තර කටයුතු ඒකකවලට (IAU) අන්තර්ග්‍රහණය කර ගැනීම. | 1. පත් කරන ලද සුපිළිපන්න නිලධාරීන් සංඛ්‍යාව.<br>2. සුපිළිපන්න නිලධාරීන්ගේ කාර්යක්ෂමතාව සහ රහස්‍යභාවය සම්බන්ධයෙන් වාර්ෂික පරිශීලක සමීක්ෂණවල තෘප්තිමත්භාවයේ ප්‍රතිශතය අවම වශයෙන් 75%ක් විය යුතු ය. | කෙටිකාලීන | | සියලුම රාජ්‍ය ආයතන |
| 8 | සුපිළිපන්න නිලධාරීන් සඳහා විශේෂිත වූ මූලික සහ වරින් වර යාවත්කාලීන පුහුණු වැඩසටහන් පැවැත්වීම. | 1. පුහුණුව සඳහා අවශ්‍ය වන සියලුම මෙවලම් සකසා නිම කිරීම.<br>2. පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වීමේ ප්‍රතිශතය අවම වශයෙන් 90%ක් විය යුතු ය.<br>3. පුහුණුව සම්පූර්ණ කිරීමේ ප්‍රතිශතය අවම වශයෙන් 95%ක් විය යුතු ය.<br>4. පුහුණුවෙන් පසු දැනුම ඇගයීම, අන්තර්ගතය රඳවා තබා ගැනීම සහ අවබෝධය සාමාන්‍යයෙන් 70%ක් විය යුතු ය.<br>5. පුහුණු අන්තර්ගතයෙන් 70%ක් ප්‍රායෝගිකව යෙදීම. | කෙටිකාලීන දීර්ඝකාලීන | අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව | සියලුම රාජ්‍ය ආයතන |

| | | | | | |
|---|---|---|---|---|---|
| 9 | සුපිළිපන්න නිලධාරීන් දෙපාර්තමේන්තු ප්‍රධානීන් සඳහා පුහුණු වැඩසටහන් පවත්වන බව සහතික කිරීම. | 1. පුහුණුව සඳහා අවශ්‍ය වන සියලුම මෙවලම් සකසා නිම කිරීම.<br>2. පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වීමේ ප්‍රතිශතය අවම වශයෙන් 90%ක් විය යුතු ය.<br>3. පුහුණුව සම්පූර්ණ කිරීමේ ප්‍රතිශතය අවම වශයෙන් 95%ක් විය යුතු ය.<br>4. පුහුණුවෙන් පසු දැනුම ඇගයීමේදී, දැනුම රඳවා තබා ගැනීම සහ අන්තර්ගතය අවබෝධ කර ගැනීම සඳහා සාමාන්‍ය අගය 70%ක් විය යුතු ය.<br>5. පුහුණු අන්තර්ගතයෙන් 70%ක් ප්‍රායෝගිකව යෙදීම. | කෙටිකාලීන දීර්ඝකාලීන | සියලුම රාජ්‍ය ආයතන | සියලුම රාජ්‍ය ආයතන |
| 10 | ආයතන සංග්‍රහය (Establishment Code) සමාලෝචනය කර සදාචාරාත්මක ප්‍රමිතීන්, බැඳියාවන් අතර ගැටුම් ඇති කරුණු (conflict of interest) පිළිබඳ ප්‍රතිපත්ති සහ වත්කම් හෙළිදරව් කිරීම් අවධාරණය කිරීම සඳහා අවශ්‍ය සංශෝධන සලකා බැලීම. | 1. මූලික සමාලෝචනය සම්පූර්ණ කිරීම.<br>2. පාර්ශ්වකරුවන්ගේ උපදේශන සම්පූර්ණ කිරීම.<br>3. සමාලෝචනය අවසන් කිරීම.<br>4. අවශ්‍ය සංශෝධන ඇතුළත් කිරීම.<br>5. සංශෝධිත සංග්‍රහය පිළිබඳව රාජ්‍ය නිලධාරීන් සඳහා පුහුණුව සහ දැනුවත් කිරීම් පැවැත්වීම.<br>6. අනුකූලතා අධීක්ෂණ රාමුවක් ස්ථාපිත කිරීම.<br>7. ඵලදායිතාවය සහ අදාළත්වය සඳහා වාර්ෂික සමාලෝචනයක් පැවැත්වීම. | දීර්ඝකාලීන | රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය | රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය<br>රාජ්‍ය සේවා කොමිෂන් සභාව (PSC ) |

| | | | | | |
|---|---|---|---|---|---|
| 11 | පවතින දූෂණ විරෝධී ක්‍රියා මාර්ගවල ඵලදායීතාවය ඇගයීමට සහ විවිධ රාජ්‍ය අංශවල වැඩිදියුණු කළ යුතු ක්ෂේත්‍ර හඳුනා ගැනීමට දූෂණ විරෝධී මුලපිරීම් තක්සේරු (Anti-Corruption Integrity Assessments - AIA) පැවැත්වීම. | 1. දූෂණ විරෝධී මුලපිරීම් තක්සේරු (AIA) රාමුව සංවර්ධනය කිරීම.<br>2. තක්සේරු කිරීම සඳහා රාජ්‍ය අංශයේ ආයතන හඳුනා ගැනීම.<br>3. තක්සේරු කණ්ඩායම් පිහිටුවීම.<br>4. දූෂණ විරෝධී මුලපිරීම් තක්සේරුව (AIA) සැලසුම් කර ක්‍රියාත්මක කිරීම.<br>5. තක්සේරු කිරීමේ සම්පූර්ණ කිරීමේ අනුපාතය ආයතනවලින් අවම වශයෙන් 75%ක් විය යුතු ය.<br>6. වැඩිදියුණු කළ යුතු ක්ෂේත්‍ර හඳුනා ගැනීම.<br>7. නිර්දේශිත ක්‍රියා මාර්ගවලින් අවම වශයෙන් 70%ක් අනුගමනය කිරීම.<br>8. හඳුනාගත් ක්ෂේත්‍රවල වැඩිදියුණු කිරීම් මැනීම සඳහා පසු විපරම් ඇගයීමක් පැවැත්වීම. | කෙටිකාලීන<br>මධ්‍යකාලීන | අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව | සියලුම රාජ්‍ය ආයතනවල අභ්‍යන්තර කටයුතු ඒකක |
| උප අරමුණ 2: රාජ්‍ය අංශය තුළ බැඳියාවන් අතර ගැටුම්, වත්කම් ප්‍රකාශ කිරීම සහ තෑගි රෙගුලාසි කළමනාකරණය වැඩි දියුණු කිරීම. | | | | | |
| 1 | ස්වයංක්‍රීය සත්‍යාපනයට හැකිවන පරිදි, වෙනත් ආයතනික වත්කම් දත්ත ගබඩාවලට සම්බන්ධිත, මාර්ගගත (online), ප්‍රසිද්ධියට පත් කළ හැකි වත්කම් ප්‍රකාශ කිරීමේ ක්‍රමයක් ස්ථාපිත කිරීමෙන්, 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ දක්වා ඇති වත්කම් ප්‍රකාශ කිරීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීම. | 1. පද්ධති පිරිවිතරයන් සහිත සංකල්ප සටහනක් සකස් කිරීම.<br>2. ලංසු කැඳවීම් නිකුත් කිරීම.<br>3. ප්‍රසම්පාදන කමිටුව කැඳවීම.<br>4. අවශ්‍ය මෘදුකාංග නිර්මාණය කර සංවර්ධනය කිරීම.<br>5. අවශ්‍ය දෘඩාංග මිල දී ගැනීම.<br>6. පරිශීලක පුහුණුවෙන් අවම වශයෙන් 80%ක් පැවැත්වීම.<br>7. ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සඳහා තාක්ෂණික කමිටුවක් පත් කිරීම.<br>8. පද්ධතිය ක්‍රියාත්මක කිරීම. | කෙටිකාලීන<br>මධ්‍යකාලීන | අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව | අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2 | 2023 අංක 9 දරණ දූෂණ විරෝධී පනතේ දක්වා ඇති වත්කම් ප්‍රකාශ කිරීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා පහත කරුණු ආවරණය වන පරිදි රෙගුලාසි සකස් කර පැනවීම:<br><br>i. ප්‍රකාශයක් ගොනු කිරීමට අවශ්‍ය වන්නේ කවුරුන් ද යන්න.<br><br>ii. ප්‍රකාශ කළ යුතු වත්කම් සහ ප්‍රකාශ සඳහා ආකෘතිය.<br><br>iii. ප්‍රකාශයක් ගොනු කිරීමේ ක්‍රියාවලිය.<br><br>iv. වත්කම් ප්‍රකාශ කිරීම, වලංගු කිරීම සහ ගබඩා කිරීම.<br><br>v. ප්‍රකාශයක් ගොනු කිරීමට අපොහොසත් වීම හෝ වැරදි තොරතුරු සැපයීම සඳහා වන සම්බාධක.<br><br>vi. පද්ධති ක්‍රියාකාරිත්වය පිළිබඳ මහජන වාර්තා කිරීම.<br><br>vii. දත්ත රහස්‍යතාවය සහ විනිවිදභාවය. | 1. රෙගුලාසි කෙටුම්පත් කිරීම.<br><br>2. පාර්ශ්වකරුවන්ගේ උපදේශන පැවැත්වීම.<br><br>3. රෙගුලාසි අනුමත කර ක්‍රියාත්මක කිරීම.<br><br>4. අනුකූලතා අධීක්ෂණ රාමුවක් සකස් කිරීම. | කෙටිකාලීන | අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව | අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව |

| | | | | | |
|---|---|---|---|---|---|
| 3 | විද්‍යුත් වත්කම් ප්‍රකාශ කිරීමේ ක්‍රමයට ප්‍රවේශ වීමේ ක්‍රියාවලිය පැහැදිලි කරන ආබාධිත ප්‍රජාව අන්තර්ගෘහිත, තේරුම් ගැනීමට පහසු මෙවලම් භාවිතා කරමින්, සමාජ මාධ්‍ය, ප්‍රජා වැඩමුළු සහ තොරතුරු වෙබ් අඩවි වැනි විවිධ වේදිකා භාවිතා කරමින් තොරතුරු බෙදා හැරීම ඇතුළුව, වත්කම් ප්‍රකාශ ඉදිරිපත් කරන්නේ කෙසේ ද යන්න පිළිබඳ, තොරතුරු වෙත ප්‍රවේශ වන්නේ කෙසේ ද යන්න පිළිබඳව ප්‍රකාශකයින් දැනුවත් කිරීම සඳහා සන්නිවේදන සැලැස්මක් සකස් කිරීම. | 1. සන්නිවේදන සැලැස්ම සකස් කිරීම.<br>2. අන්තර්ගතය නිර්මාණය කිරීම.<br>3. ප්‍රතිපෝෂණ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම.<br>4. සන්නිවේදන ප්‍රයත්නයේ ඵලදායීතාවය ඇගයීම සඳහා කාර්ය සාධන මිනුම් සකස් කිරීම. | කෙටිකාලීන | අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව | අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව |
| 4 | දූෂණ විරෝධී ප්‍රයත්නයන්හි ජාත්‍යන්තර සහයෝගීතාව වැඩි දියුණු කිරීම සඳහා වත්කම් සම්බන්ධ තොරතුරු විදේශීය පාර්ශ්වයන් සමඟ බෙදා ගැනීමට බලයලත් ආයතනවලට ඉඩ සලසන මාර්ගෝපදේශ සංවර්ධනය කිරීම. | 1. මාර්ගෝපදේශ කෙටුම්පත් කිරීම.<br>2. පාර්ශ්වකරුවන්ගේ උපදේශන පැවැත්වීම.<br>3. මාර්ගෝපදේශ අනුමත කර ක්‍රියාත්මක කිරීම. | කෙටිකාලීන | අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව | අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව |

| | | | | | |
|---|---|---|---|---|---|
| 5 | 2023 අංක 9 දරණ දූෂණ විරෝධී පනතේ දක්වා ඇති බැඳියාවන් අතර ගැටුම් (CoI) නීති සහ රෙගුලාසි ක්‍රියාත්මක කිරීම සඳහා පහත කරුණු ඇතුළත් රෙගුලාසි සකස් කර පැනවීම:<br><br>i. බැඳියාවන් අතර ගැටුම් යන්නෙහි අර්ථ දැක්වීම්.<br><br>ii. හෙළිදරව් කිරීම සහ ඉවත් වීම සඳහා පැහැදිලි මාර්ගෝපදේශ ඇතුළුව ගැටුම් ප්‍රකාශ කිරීම සහ කළමනාකරණය කිරීම පිළිබඳ උපදෙස්.<br><br>iii. ගැටුම් ප්‍රකාශ කිරීමට හෝ කළමනාකරණය කිරීමට අපොහොසත් වීම සඳහා වන දඩුවම්.<br><br>iv. පද්ධති ක්‍රියාකාරිත්වය පිළිබඳ මහජන වාර්තා කිරීම. | 1. රෙගුලාසි කෙටුම්පත් කිරීම.<br>2. පාර්ශ්වකරුවන්ගේ උපදේශන පැවැත්වීම.<br>3. රෙගුලාසි අනුමත කර ක්‍රියාත්මක කිරීම. අනුකූලතා අධීක්ෂණ රාමුවක් සකස් කිරීම. | කෙටිකාලීන | අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව | අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව |
| 6 | බැඳියාවන් අතර ගැටුම් වැළැක්වීම සඳහා පෞද්ගලික අංශයේ තනතුරුවලට මාරුවන රාජ්‍ය නිලධාරීන් සඳහා සිසිලන කාල සීමාවන් (cooling-off periods) හඳුන්වා දී ක්‍රියාත්මක කිරීම. | 1. රීති කෙටුම්පත් කිරීම.<br>2. පාර්ශ්වකරුවන්ගේ උපදේශන පැවැත්වීම.<br>3. රීති අනුමත කර ක්‍රියාත්මක කිරීම.<br>4. අනුකූලතා අධීක්ෂණ රාමුවක් සකස් කිරීම. | කෙටිකාලීන<br>මධ්‍යකාලීන | අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව | අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව |

| | | | | | |
|---|---|---|---|---|---|
| 7 | බැඳියාවන් අතර ගැටුම් පිළිබඳ නීති රීති සම්බන්ධයෙන් දැනුවත්භාවය සහ අනුකූලතාව වැඩි දියුණු කිරීම. | 1. සන්නිවේදන සැලැස්ම සකස් කිරීම.<br>2. අන්තර්ගතය නිර්මාණය කිරීම.<br>3. ප්‍රතිපෝෂණ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම.<br>4. සන්නිවේදන ප්‍රයත්නයේ ඵලදායීතාවය ඇගයීම සඳහා කාර්ය සාධන මිනුම් සකස් කිරීම. | කෙටිකාලීන මධ්‍යකාලීන | අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව | අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව |
| 8 | තෑගි පිළිගැනීම සහ වාර්තා කිරීම සම්බන්ධ රීති සම්මත කිරීම. | 1. රීති කෙටුම්පත් කිරීම.<br>2. පාර්ශ්වකරුවන්ගේ උපදේශන පැවැත්වීම.<br>3. රීති අනුමත කර ප්‍රකාශයට පත් කිරීම.<br>4. රීති පිළිබඳව රාජ්‍ය නිලධාරීන් සඳහා පුහුණුව සහ දැනුවත් කිරීම් පැවැත්වීම.<br>5. මාර්ගෝපදේශ ප්‍රවර්ධනය කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම.<br>6. අනුකූලතා අධීක්ෂණ රාමුවක් සකස් කිරීම. | කෙටිකාලීන මධ්‍යකාලීන | අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව | අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව<br>රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය<br>රාජ්‍ය සේවා කොමිෂන් සභාව<br>ජනාධිපති ලේකම් කාර්යාලය<br>පාර්ලිමේන්තුව |
| 9 | සෑම රාජ්‍ය ආයතනයක් සඳහාම තෑගි ලේඛනයක් නිර්මාණය කිරීම. | 1. සම්මත ආකෘතියක් නිර්මාණය කිරීම.<br>2. දත්ත රැස් කිරීමේ රාමුවක් සකස් කිරීම.<br>3. රාජ්‍ය ආයතනවලින් අවම වශයෙන් 80%ක් සඳහා තෑගි ලේඛනයක් සංවර්ධනය කර ක්‍රියාත්මක කිරීම.<br>4. තෑගි ලේඛනවලට තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය නිලධාරීන් සඳහා පුහුණුව සහ දැනුවත් කිරීම් පැවැත්වීම.<br>5. අනුකූලතා අධීක්ෂණ රාමුවක් සකස් කිරීම.<br>6. එහි ඵලදායිතාවය සහ අදාළත්වය තක්සේරු කිරීම සඳහා තෑගි ලේඛන පද්ධතියේ වාර්ෂික සමාලෝචනයක් පැවැත්වීම. | කෙටිකාලීන | අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව | සියලුම රාජ්‍ය ආයතන |

| | | | | | |
|---|---|---|---|---|---|
| 10 | මහජනතාවට ප්‍රවේශ විය හැකි, මාර්ගගත (online) අයිතිකරුවන්ගේ ලේඛනයක් නිර්මාණය කිරීම. (Beneficial Ownership Register) | 1. දත්ත එකතු කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා නියාමන රාමුව සංවර්ධනය කිරීම.<br>2. දත්ත එකතු කිරීමේ රාමුව සකස් කිරීම.<br>3. පද්ධති පිරිවිතරයන් සහිත සංකල්ප සටහනක් සකස් කිරීම.<br>4. ලංසු කැඳවීම් නිකුත් කිරීම.<br>5. ප්‍රසම්පාදන කමිටුව කැඳවීම.<br>6. අවශ්‍ය මෘදුකාංග නිර්මාණය කර සංවර්ධනය කිරීම.<br>7. අවශ්‍ය දෘඩාංග මිල දී ගැනීම.<br>8. පරිශීලක පුහුණුවෙන් අවම වශයෙන් 80%ක් පැවැත්වීම.<br>9. ප්‍රවර්ධන සහ දැනුවත් කිරීමේ වැඩසටහන් දියත් කිරීම.<br>10. පද්ධතිය ක්‍රියාත්මක කිරීම.<br>11. අනුකූලතා අධීක්ෂණ රාමුවක් සකස් කිරීම.<br>12. ලේඛනයේ ඵලදායිතාවය සහ පරිශීලකයන්ගේ සහභාගීත්වය පිළිබඳ වාර්ෂික සමාලෝචනයක් පැවැත්වීම. | කෙටිකාලීන | සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව | සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව |

| | | | | | |
|---|---|---|---|---|---|
| 11 | මූල්‍ය ආයතනවලට (Financial Institutions - FIs), නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාරවලට (Designated Non-Financial Businesses - DNFBs) සහ මහජනතාවට ප්‍රවේශ විය හැකි දේශපාලනික වශයෙන් නිරාවරණය වූ පුද්ගලයින්ගේ (Politically Exposed Persons - PEP) දත්ත ගබඩාවක් සංවර්ධනය කිරීම. | 1. දත්ත එකතු කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා නියාමන රාමුව සංවර්ධනය කිරීම.<br>2. දත්ත එකතු කිරීමේ රාමුව සකස් කිරීම.<br>3. පද්ධති පිරිවිතරයන් සහිත සංකල්ප සටහනක් සකස් කිරීම.<br>4. ලංසු කැඳවීම් නිකුත් කිරීම.<br>5. ප්‍රසම්පාදන කමිටුව කැඳවීම.<br>6. අවශ්‍ය මෘදුකාංග නිර්මාණය කර සංවර්ධනය කිරීම.<br>7. අවශ්‍ය දෘඩාංග මිල දී ගැනීම.<br>8. දත්ත ගබඩාව භාවිතා කිරීම පිළිබඳව මූල්‍ය ආයතන (FIs) සහ නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර (DNFBs) සඳහා 90%ක පුහුණුව සහ දැනුවත් කිරීම් පැවැත්වීම.<br>9. ප්‍රවර්ධන සහ මහජන දැනුවත් කිරීමේ වැඩසටහන් දියත් කිරීම.<br>10. දත්ත ගබඩාව ක්‍රියාත්මක කිරීම.<br>11. දත්ත ගබඩාවේ ක්‍රියාකාරීත්වය සහ ප්‍රවේශ්‍යතාවය පිළිබඳ පරිශීලක තොරතුරු රැස් කිරීම සඳහා ප්‍රතිපෝෂණ යාන්ත්‍රණයක් සකස් කිරීම.<br>12. අනුකූලතා අධීක්ෂණ රාමුවක් සකස් කිරීම.<br>13. දත්ත ගබඩාවේ ඵලදායිතාවය සහ පරිශීලකයන්ගේ සහභාගීත්වය පිළිබඳ වාර්ෂික සමාලෝචනයක් පැවැත්වීම | කෙටිකාලීන | මහ බැංකුව | මහ බැංකුව<br><br>මූල්‍ය බුද්ධි ඒකකය (FIU) |

| උප අරමුණ 3: රාජ්‍ය සේවාවන්හි විනිවිදභාවය, වගවීම සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා පුරවැසියන්ට රාජ්‍ය සේවා සඳහා ඇති ප්‍රවේශය වැඩිදියුණු කිරීම සහ ප්‍රශස්ත කිරීම. | | | | | |
|---|---|---|---|---|---|
| 1 | තොරතුරු දැනගැනීමේ අයිතිය (RTI) පනතේ 8 වන වගන්තිය සහ 10 වන වගන්තිය යටතේ රාජ්‍ය බලධාරීන්ගේ ක්‍රියාකාරී හෙළිදරව් කිරීම් අධීක්ෂණය කිරීම සඳහා යාන්ත්‍රණ හඳුන්වා දීම. | 1. අධීක්ෂණ රාමුව සකස් කිරීම.<br>2. දත්ත එකතු කිරීමේ රාමුව සකස් කිරීම.<br>3. රාජ්‍ය බලධාරීන් සඳහා මාර්ගෝපදේශ සකස් කිරීම.<br>4. හෙළිදරව් කිරීම්වල ඵලදායීතාවය සහ ප්‍රවේශ්‍යතාවය පිළිබඳව මහජනතාවට වාර්තා කිරීමට ප්‍රතිපෝෂණ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.<br>5. ඵලදායීතාවය සහ පරිශීලකයන්ගේ සහභාගීත්වය පිළිබඳ වාර්ෂික සමාලෝචනයක් පැවැත්වීම. | මධ්‍යකාලීන | තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කොමිෂන් සභාව | තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කොමිෂන් සභාව |
| 2 | තොරතුරු සඳහා ප්‍රවේශය වැඩි දියුණු කිරීම සඳහා ප්‍රමිතිගත ආකෘති නිකුත් කිරීම සහ ඉදිරිපත් කිරීම් ඩිජිටල්කරණය කිරීම. | 1. ප්‍රමිතිගත ආකෘති සකස් කිරීම.<br>2. පාර්ශ්වකරුවන්ගේ උපදේශන පැවැත්වීම.<br>3. ඩිජිටල්කරණ උපාය මාර්ගයක් සකස් කිරීම.<br>4. ඩිජිටල් වේදිකා සංවර්ධනය කර ක්‍රියාත්මක කිරීම.<br>5. පරිශීලකයින් සඳහා අවම වශයෙන් 80%ක පුහුණුවක් පැවැත්වීම.<br>6. මහජන දැනුවත් කිරීමේ වැඩසටහන් දියත් කිරීම.<br>7. වේදිකාවල ක්‍රියාකාරීත්වය සහ ප්‍රවේශ්‍යතාවය පිළිබඳ පරිශීලක තොරතුරු රැස් කිරීම සඳහා ප්‍රතිපෝෂණ යාන්ත්‍රණයක් සකස් කිරීම.<br>8. අනුකූලතා අධීක්ෂණ රාමුවක් සකස් කිරීම.<br>9. ඵලදායීතාවය සහ පරිශීලක තෘප්තිය පිළිබඳ වාර්ෂික සමාලෝචනයක් පැවැත්වීම. | කෙටිකාලීන | තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කොමිෂන් සභාව | තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කොමිෂන් සභාව |

| | | | | | |
|---|---|---|---|---|---|
| 3 | පුරවැසියන් ඉල්ලන භාෂාවෙන් තොරතුරු නිකුත් කරන බව සහතික කිරීම සඳහා යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම. | 1. භාෂා අවශ්‍යතා තක්සේරුවක් පැවැත්වීම.<br>2. ඉල්ලූ භාෂාවලින් තොරතුරු නිකුත් කිරීම සඳහා ප්‍රතිපත්තියක් සකස් කිරීම.<br>3. පරිවර්තන සම්පත් හඳුනාගෙන සුරක්ෂිත කිරීම.<br>4. ප්‍රතිපත්තියට අනුකූල වීම පිළිබඳ කාර්ය මණ්ඩලය සඳහා 100%ක පුහුණුවක් පැවැත්වීම.<br>5. මහජන දැනුවත් කිරීමේ වැඩසටහන් දියත් කිරීම.<br>6. අනුකූලතා අධීක්ෂණ රාමුවක් සකස් කිරීම.<br>7. විවිධ භාෂාවලින් තොරතුරු ඉල්ලීම පිළිබඳව ඔවුන්ගේ අත්දැකීම් වාර්තා කිරීමට පුරවැසියන් සඳහා ප්‍රතිපෝෂණ යාන්ත්‍රණයක් සකස් කිරීම.<br>8. ඵලදායීතාවය සහ පරිශීලක තෘප්තිය පිළිබඳ වාර්ෂික සමාලෝචනයක් පැවැත්වීම. | කෙටිකාලීන | තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කොමිෂන් සභාව | තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කොමිෂන් සභාව |

| | | | | | |
|---|---|---|---|---|---|
| 4 | විනිවිදභාවය සහතික කිරීම සඳහා තොරතුරු දැනගැනීමේ අයිතිය (RTI) ඉල්ලීම්වලට අනුකූල වීමේ අවශ්‍යතා සහ ක්‍රියා පටිපාටි පිළිබඳව රාජ්‍ය නිලධාරීන් සඳහා පුහුණුව ලබා දීම. | 1. පුහුණු අවශ්‍යතා ඇගයීමක් පැවැත්වීම.<br>2. පුහුණුව සඳහා අවශ්‍ය වන සියලුම මෙවලම් සකසා නිම කිරීම.<br>3. සෑම ආයතනයකම නිලධාරීන්ගෙන් අවම වශයෙන් 30%ක් වාර්ෂිකව පුහුණු කරනු ලැබේ.<br>4. පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වීමේ ප්‍රතිශතය අවම වශයෙන් 90%ක් විය යුතු ය.<br>5. පුහුණුව සම්පූර්ණ කිරීමේ ප්‍රතිශතය අවම වශයෙන් 95%ක් විය යුතු ය.<br>6. පුහුණුවෙන් පසු දැනුම ඇගයීමේ දී, මෙහෙයුම් සහ සාරාංශ කරුණු පිළිබඳ දැනුම රඳවා තබා ගැනීම සහ අවබෝධය සාමාන්‍යයෙන් 80%ක් විය යුතු ය.<br>7. ඉල්ලීම්වලට අනුකූල වීම වසරින් වසර වැඩිදියුණු වීමක් පෙන්නුම් කිරීම. | කෙටිකාලීන මධ්‍යකාලීන | තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කොමිෂන් සභාව | තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කොමිෂන් සභාව<br><br>ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන (SLIDA) |
| 5 | පොදු සේවා මුහුණුවරෙහි මානව අතුරු මුහුණත් (human interface) අඩු කිරීම සඳහා ඩිජිටල්කරණය ක්‍රියාත්මක කිරීම, (උදා: ගාස්තු, බදු, බලපත්‍ර ගාස්තු) පොදු ප්‍රවේශය සහිත විද්‍යුත් ගෙවීම් වේදිකාවක් හඳුන්වා දීම ඇතුළුව. | 1. මානව අතුරු මුහුණත අඩු කිරීම සඳහා පුළුල් ඩිජිටල් උපාය මාර්ගයක් සකස් කිරීම.<br>2. පාර්ශ්වකරුවන්ගේ උපදේශන පැවැත්වීම.<br>3. නිර්මාණ සහ තාක්ෂණික පිරිවිතරයන් සකස් කිරීම.<br>4. විද්‍යුත් ගෙවීම් වේදිකාව පවතින රාජ්‍ය සේවා පද්ධති සමඟ ඒකාබද්ධ කිරීම.<br>5. විද්‍යුත් ගෙවීම් වේදිකාව ක්‍රියාත්මක කිරීම.<br>6. පොදු සේවා මුහුණුවරෙහි ඩිජිටල්කරණයේ බලපෑම පිළිබඳ වාර්ෂික සමාලෝචනයක් පැවැත්වීම. | කෙටිකාලීන මධ්‍යකාලීන | මුදල් අමාත්‍යාංශය<br><br>ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය | සියලුම රාජ්‍ය ආයතන |

| | | | | | |
|---|---|---|---|---|---|
| උප අරමුණ 4: දූෂණය වැළැක්වීම සහ ඵලදායී සම්පත් වෙන් කිරීම සහතික කිරීම සඳහා රාජ්‍ය ප්‍රසම්පාදන සහ රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේ සුපිළිපන්නභාවය සහ විනිවිදභාවය වැඩි දියුණු කිරීම. | | | | | |
| 1 | රේගුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව (IRD) සහ සුරාබදු දෙපාර්තමේන්තුව වැනි ඉහළ දූෂණ අවදානම් සහිත රාජ්‍ය ආයතන සඳහා දූෂණ අවදානම් තක්සේරු (Corruption Risk Assessments - CRA) සිදු කිරීම, පහත ක්‍රියා මාර්ග මගින් සිදු කරනු ලැබේ:<br><br>i. විවිධ විශේෂඥ දැනුම සහතික කරමින් තක්සේරු සිදු කිරීම සඳහා බහුකාර්ය කණ්ඩායමක් පිහිටුවීම.<br><br>ii. එක් එක් ආයතනයේ විශේෂිත අවදානම්වලට ගැළපෙන තක්සේරු නිර්ණායක සහ ක්‍රමවේදයන් සකස් කිරීම.<br><br>iii. දූෂණ අවදානම් තක්සේරුව (CRA) සැලසුම් කර සිදු කිරීම.<br><br>iv. එක් එක් ආයතනය සඳහා සවිස්තර වාර්තාවකට සොයාගැනීම් සහ නිර්දේශ සම්පාදනය කිරීම.<br><br>v. නිර්දේශිත පියවර ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සහ කාලයාගේ ඇවෑමෙන් සිදුවන වැඩිදියුණු කිරීම් නිරීක්ෂණය කිරීම සඳහා පසු විපරම් සැලැස්මක් ස්ථාපිත කිරීම. | 1. ස්වාධීන බහුකාර්ය කණ්ඩායම් පිහිටුවීම.<br><br>2. දූෂණ අවදානම් තක්සේරු (CRA) ක්‍රමවේදය සකස් කිරීම.<br><br>3. ආයතනික දූෂණ අවදානම් තක්සේරු (ICRA) ක්‍රියාත්මක කිරීම පිළිබඳ පුහුව සම්පූර්ණ කිරීම.<br><br>4. දූෂණ අවදානම් තක්සේරුව (CRA) සැලසුම් කර සිදු කිරීම.<br><br>5. දූෂණ අවදානම් තක්සේරුවේ (CRA) සොයාගැනීම් ප්‍රකාශයට පත් කිරීම.<br><br>6. නිර්දේශිත ක්‍රියා මාර්ගවලින් අවම වශයෙන් 60%ක් අනුගමනය කිරීම.<br><br>7. හඳුනාගත් අවදානම්වල වැඩිදියුණු කිරීම් මැනීම සඳහා පසු විපරම් ඇගයීමක් පැවැත්වීම. | මධ්‍යකාලීන | ශ්‍රී ලංකා රේගුව<br><br>දේශීය ආදායම් දෙපාර්තමේන්තුව<br><br>සුරාබදු දෙපාර්තමේන්තුව | ශ්‍රී ලංකා රේගුව<br><br>දේශීය ආදායම් දෙපාර්තමේන්තුව<br><br>සුරාබදු දෙපාර්තමේන්තුව |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2 | රාජ්‍ය ප්‍රසම්පාදන සහ රාජ්‍ය මූල්‍ය සම්බන්ධයෙන් කැබිනට් මණ්ඩලයේ සියලුම තීරණ රජයේ තොරතුරු දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කිරීම. | 1. රාජ්‍ය ප්‍රසම්පාදන සහ රාජ්‍ය මූල්‍ය සම්බන්ධයෙන් කැබිනට් මණ්ඩලයේ තීරණ ප්‍රසිද්ධ කිරීම සඳහා අවශ්‍යතා සහ ක්‍රියා පටිපාටි දක්වන ප්‍රතිපත්තියක් සම්මත කිරීම.<br>2. කැබිනට් මණ්ඩලයේ තීරණ ප්‍රසිද්ධ කිරීමේ ප්‍රතිපත්තියට අනුකූල වීම තක්සේරු කිරීම සඳහා වාර්ෂික සමාලෝචනයක් අවම වශයෙන් 80%ක අනුකූලතා අනුපාතයකින් සිදු කිරීම. | කෙටිකාලීන | අමාත්‍ය මණ්ඩල කාර්යාලය | අමාත්‍ය මණ්ඩල කාර්යාලය<br><br>මුදල් අමාත්‍යාංශය |
| 3 | විනිවිදභාවය ඉහළ නැංවීම අරමුණු කර ගනිමින්, ජාතික විද්‍යුත් ප්‍රසම්පාදන අධීක්ෂණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම. | 1. පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා සහ අපේක්ෂාවන් හඳුනා ගැනීම සඳහා අවශ්‍යතා ඇගයීමක් පැවැත්වීම.<br>2. කාර්ය සාධන අවශ්‍යතා පිළිබඳ තොරතුරු ඇතුළත් සංකල්ප සටහනක් සකස් කිරීම.<br>3. ලංසු කැඳවීම් නිකුත් කිරීම.<br>4. ප්‍රසම්පාදන කමිටුව කැඳවීම.<br>5. අවශ්‍ය මෘදුකාංග නිර්මාණය කර සංවර්ධනය කිරීම.<br>6. අවශ්‍ය දෘඩාංග මිල දී ගැනීම.<br>7. පරිශීලක පුහුණුවෙන් අවම වශයෙන් 80%ක් පැවැත්වීම.<br>8. ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සඳහා තාක්ෂණික කමිටුවක් පත් කිරීම.<br>9. පද්ධතිය ක්‍රියාත්මක කිරීම.<br>10. ජාතික විද්‍යුත් ප්‍රසම්පාදන අධීක්ෂණ පද්ධතියේ ඵලදායීතාවය තක්සේරු කිරීම සඳහා වාර්ෂික සමාලෝචනයක් පැවැත්වීම. | කෙටිකාලීන<br>මධ්‍යකාලීන | මහජන මුදල් දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය | මහජන මුදල් දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය<br><br>ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව |

| | | | | | |
|---|---|---|---|---|---|
| 4 | ජාතික විද්‍යුත් ප්‍රසම්පාදන අධීක්ෂණ පද්ධතියේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා විද්‍යුත් ප්‍රසම්පාදන ක්‍රියාවලියේ පරිශීලකයින් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. | 1. සියලුම දැනුවත් කිරීමේ මෙවලම් සංවර්ධනය කිරීම.<br>2. පවත්වන ලද දැනුවත් කිරීමේ සැසි ගණන.<br>3. පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වීමේ ප්‍රතිශතය අවම වශයෙන් 90%ක් විය යුතු ය.<br>4. පුහුණුව සම්පූර්ණ කිරීමේ ප්‍රතිශතය අවම වශයෙන් 95%ක් විය යුතු ය.<br>5. පුහුණු සැසියෙන් පසු දැනුම ඇගයීමේ දී, මෙහෙයුම් සහ සාරාංශ කරුණු පිළිබඳ දැනුම රඳවා තබා ගැනීම සහ අවබෝධය සාමාන්‍යයෙන් 80%ක් විය යුතු ය. | කෙටිකාලීන මධ්‍යකාලීන | ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව | ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව |
| 5 | ජාතික විද්‍යුත් ප්‍රසම්පාදන අධීක්ෂණ පද්ධතියක් (Electronic Procurement Monitoring System - EPMS) ස්ථාපිත කිරීම. | 1. ජාතික විද්‍යුත් ප්‍රසම්පාදන අධීක්ෂණ පද්ධතිය (EPMS) යාන්ත්‍රණය සඳහා රාමුවක් සකස් කිරීම.<br>2. අධීක්ෂණ කමිටුවක් ස්ථාපිත කර සාමාජිකයින් පත් කිරීම.<br>3. සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි (Standard Operating Procedures - SOPs) සකස් කිරීම.<br>4. අධීක්ෂණ කාර්යයන් සහ මනා භාවිතාවන් පිළිබඳව කමිටු සාමාජිකයින් සහ රාජ්‍ය ප්‍රසම්පාදන නිලධාරීන් සඳහා පුහුණුව පැවැත්වීම.<br>5. ජාතික විද්‍යුත් ප්‍රසම්පාදන අධීක්ෂණ පද්ධතියේ (EPMS) යාන්ත්‍රණයේ ඵලදායීතාවය තක්සේරු කිරීම සඳහා වාර්ෂික සමාලෝචනයක් පැවැත්වීම. | කෙටිකාලීන මධ්‍යකාලීන | ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව | ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව |

| | | | | | |
|---|---|---|---|---|---|
| 6 | ජාතික විද්‍යුත් ප්‍රසම්පාදන අධීක්ෂණ පද්ධතියට (EPMS) සම්බන්ධිතව, ප්‍රසම්පාදන රතු කොඩි පද්ධතියක් නිර්මාණය කිරීම සහ සැක සහිත ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් පිළිබඳව කාලෝචිත ඇඟවීම් ලබා දීම සඳහා අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව සමඟ සම්බන්ධතාවයක් ඇති කිරීම. | 1. පද්ධතිය සඳහා ප්‍රධාන දර්ශක සහ නිර්ණායක හඳුනා ගැනීම සඳහා අවශ්‍යතා ඇගයීමක් සිදු කිරීම.<br>2. නිර්මාණ සහ තාක්ෂණික පිරිවිතරයන් සකස් කිරීම.<br>3. පද්ධතිය අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව සමඟ ඒකාබද්ධ කිරීම.<br>4. පරිශීලක පුහුණුවෙන් අවම වශයෙන් 90%ක් සම්පූර්ණ කිරීම.<br>5. සලකුණු කළ ක්‍රියාකාරකම් නිරීක්ෂණය කරන සහ අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව සඳහා වාර්තා ජනනය කරන අධීක්ෂණ පද්ධතියක් ස්ථාපිත කිරීම.<br>6. පද්ධතිය ක්‍රියාත්මක කිරීම. | කෙටිකාලීන මධ්‍යකාලීන | ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව | ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව<br>අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව |
| 7 | ඍජු ප්‍රසම්පාදන අඩු කිරීම සඳහා උපාය මාර්ග සකස් කිරීම. | 1. වත්මන් ඍජු ප්‍රසම්පාදන භාවිතාවන් පිළිබඳ පුළුල් විශ්ලේෂණයක් සිදු කිරීම.<br>2. ඍජු ප්‍රසම්පාදන අඩු කිරීම සඳහා විශේෂිත පියවර දක්වන උපාය මාර්ග සකස් කිරීම.<br>3. විකල්ප ප්‍රසම්පාදන ක්‍රම සහ මනා භාවිතාවන් පිළිබඳ ප්‍රසම්පාදන නිලධාරීන් සඳහා අවම වශයෙන් 90%ක පුහුණුවක් පැවැත්වීම.<br>4. උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම සහ ඵලදායිතාවය නිරීක්ෂණය කිරීම සඳහා වූ අධීක්ෂණ සහ ඇගයීම් (M&E) රාමුවක් සකස් කිරීම.<br>5. අඩු කිරීමේ ඉලක්කයක් නිශ්චිතව දැක්වීම. | කෙටිකාලීන | ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව | සියලුම කැබිනට් අමාත්‍යාංශ |

| | | | | | |
|---|---|---|---|---|---|
| 8 | සංශෝධිත රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හඳුන්වා දීම. | 1. මාර්ගෝපදේශ සංශෝධනය කිරීම.<br>2. පාර්ශ්වකරුවන්ගේ උපදේශන පැවැත්වීම.<br>3. මාර්ගෝපදේශ අනුමත කර ප්‍රකාශයට පත් කිරීම.<br>4. මාර්ගෝපදේශ පිළිබඳව රාජ්‍ය නිලධාරීන් සඳහා පුහුණුව සහ දැනුවත් කිරීම් පැවැත්වීම.<br>5. මාර්ගෝපදේශ ප්‍රවර්ධනය කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම.<br>6. අනුකූලතා අධීක්ෂණ රාමුවක් සකස් කිරීම. | කෙටිකාලීන | ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව | ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව |
| 9 | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පිළිබඳව රාජ්‍ය නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ සැසි පැවැත්වීම. | 1. දැනුවත් කිරීමේ අරමුණු නිර්වචනය කිරීම.<br>2. සියලුම දැනුවත් කිරීමේ අන්තර්ගතයන් සකස් කිරීම.<br>3. පවත්වන ලද සැසි ගණන.<br>4. සැසි සඳහා සහභාගී වීමේ ප්‍රතිශතය අවම වශයෙන් 90%ක් විය යුතු ය.<br>5. සැසිවල ඵලදායීතාවය පිළිබඳ ප්‍රතිපෝෂණ ලේඛනගත කිරීම. | කෙටිකාලීන<br>මධ්‍යකාලීන | ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව | ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව |

| | | | | | |
|---|---|---|---|---|---|
| 10 | ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව, තාක්ෂණික ඇගයීම් කමිටුව සහ ප්‍රසම්පාදන කමිටු සාමාජිකයින් සඳහා වාර්ෂික පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම. | 1. පුහුණු අරමුණු නිර්වචනය කිරීම.<br>2. පුහුණුව සඳහා අවශ්‍ය වන සියලුම මෙවලම් සකසා නිම කිරීම.<br>3. පවත්වන ලද පුහුණු සැසි ගණන.<br>4. පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වීමේ ප්‍රතිශතය අවම වශයෙන් 90%ක් විය යුතු ය.<br>5. පුහුණුව සම්පූර්ණ කිරීමේ ප්‍රතිශතය අවම වශයෙන් 95%ක් විය යුතු ය.<br>6. පුහුණුවට පෙර සහ පසු ඇගයීම්වල ලකුණු සංසන්දනය කිරීමේ දී, පුහුණුවෙන් පසු දැනුම වැඩිදියුණු වීමේ ප්‍රතිශතය අවම වශයෙන් 30%ක් විය යුතු ය. | කෙටිකාලීන<br>දීර්ඝකාලීන | ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව | ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව |
| 11 | බැඳියාවන් අතර ගැටුම් හෙළිදරව් කිරීම් ඇතුළත් කිරීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවේ සහ ප්‍රසම්පාදන කමිටු සාමාජිකයින්ගේ ප්‍රකාශ කිරීමේ පෝරමය සංශෝධනය කිරීම. | 1. වත්මන් ප්‍රකාශ කිරීමේ පෝරමය සමාලෝචනය කර සංශෝධනය කිරීම.<br>2. පාර්ශ්වකරුවන්ගේ උපදේශන පැවැත්වීම.<br>3. සංශෝධිත ප්‍රකාශ කිරීමේ පෝරමය අනුමත කර ප්‍රකාශයට පත් කිරීම.<br>4. සංශෝධිත පෝරමය පිළිබඳව කමිටු සාමාජිකයින් සඳහා පුහුණුව සහ දැනුවත් කිරීම් පැවැත්වීම.<br>5. අනුකූලතා අධීක්ෂණ රාමුවක් සකස් කිරීම. | කෙටිකාලීන | ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව | ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව |
| 12 | ප්‍රසම්පාදන සහ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් විදේශීය පාර්ශ්වකරුවන් සමඟ අත්දැකීම් සහ මනා භාවිතාවන් බෙදා ගැනීම සඳහා සැසි පැවැත්වීම. | 1. සැසිවල අරමුණු නිර්වචනය කිරීම.<br>2. සියලුම සැසි අන්තර්ගතයන් සකස් කිරීම.<br>3. පවත්වන ලද සැසි ගණන.<br>4. සැසි සඳහා සහභාගී වීමේ ප්‍රතිශතය අවම වශයෙන් 90%ක් විය යුතු ය.<br>5. සැසිවල අදාළත්වය සහ ප්‍රයෝජනය පිළිබඳ සහභාගීවන්නන්ගේ ප්‍රතිපෝෂණ ලේඛනගත කිරීම. | කෙටිකාලීන<br>දීර්ඝකාලීන | ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව | ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව |

| | | | | | |
|---|---|---|---|---|---|
| 13 | සම්මත ලංසු ලේඛනයක් සකස් කර ක්‍රියාත්මක කිරීම. | 1. ආකෘතිය කෙටුම්පත් කිරීම.<br>2. පාර්ශ්වකරුවන්ගේ උපදේශන පැවැත්වීම.<br>3. ආකෘතිය අවසන් කර ප්‍රකාශයට පත් කිරීම.<br>4. ලේඛනය පිළිබඳව ප්‍රසම්පාදන නිලධාරීන් සහ ලංසුකරුවන් සඳහා පුහුණුව සහ දැනුවත් කිරීම් පැවැත්වීම.<br>5. අනුකූලතා අධීක්ෂණ රාමුවක් සකස් කිරීම. | කෙටිකාලීන | ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව | ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව |
| 14 | ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් පසු සමාලෝචන (Post Procurement Review - PPR) පද්ධතියක් හඳුන්වා දීම. | 1. ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් පසු සමාලෝචන (PPR) සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සම්පූර්ණ කිරීම.<br>2. වාර්ෂිකව අවම වශයෙන් ප්‍රසම්පාදන කොන්ත්‍රාත්තුවලින් 70%ක් සමාලෝචනය කරනු ලැබේ. | මධ්‍යකාලීන | ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව | ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව<br>සියලුම රාජ්‍ය ආයතන |
| 15 | ප්‍රමුඛතාවය දිය යුතු ව්‍යාපෘති ලැයිස්තුවක් පවත්වාගෙන යාම අනිවාර්ය කිරීම. | 1. මූලික ප්‍රමුඛතා ලැයිස්තුව සකස් කිරීම.<br>2. පාර්ශ්වකරුවන්ගේ උපදේශන පැවැත්වීම.<br>3. මූලික ලැයිස්තුව අවසන් කර ප්‍රකාශයට පත් කිරීම.<br>4. මූලික ලැයිස්තුව වරින් වර යාවත්කාලීන කරනු ලැබේ. | කෙටිකාලීන | මුදල් අමාත්‍යාංශය | රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය |
| 16 | සියලුම රාජ්‍ය කොන්ත්‍රාත්තු සහ රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව ගිවිසුම්වල අනිවාර්ය දූෂණ විරෝධී වගන්තියක් ඇතුළත් කිරීම. | 1. වගන්තිය කෙටුම්පත් කර අවසන් කිරීම.<br>2. චක්‍රලේඛයක් නිකුත් කිරීම.<br>3. සියලුම කොන්ත්‍රාත්තු සහ ගිවිසුම්වල එම වගන්තිය අනිවාර්යයෙන්ම ඇතුළත් කිරීම සහතික කිරීම.<br>4. අනුකූලතා අධීක්ෂණ පද්ධතියක් ස්ථාපිත කිරීම. | කෙටිකාලීන | මුදල් අමාත්‍යාංශය | රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය |

| | | | | | |
|---|---|---|---|---|---|
| 17 | රාජ්‍ය පරිපාලනයේ සහ රාජ්‍ය සමාගම්වල සියලුම තනතුරු සඳහා බඳවා ගැනීමේ දී කුසලතා මත පදනම් වූ සහ වෘත්තීය නිර්ණායකවලට අනුකූල වන බව සහතික කිරීම. | 1. සම්මත බඳවා ගැනීමේ නිර්ණායක සහ ක්‍රියාවලීන් සකස් කර ක්‍රියාත්මක කිරීම.<br>2. නව බඳවා ගැනීමේ නිර්ණායක වලදී බඳවා ගන්නා නිලධාරීන් සඳහා අවම වශයෙන් 90%ක සහභාගීත්වයක් සහිතව පුහුණු සැසි පැවැත්වීම.<br>3. අනුකූලතා අධීක්ෂණ පද්ධතියක් ස්ථාපිත කිරීම. | කෙටිකාලීන | මුදල් අමාත්‍යාංශය | රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය |
| 18 | ජාතික ප්‍රසම්පාදනයේ දී බැඳියාවන් අතර ගැටුම් පිළිබඳ නීති උල්ලංඝනය කරන රාජ්‍ය සේවකයින්ට නිතිපතා විනයානුකූල ක්‍රියා මාර්ග ගැනීම සහතික කිරීම. | 1. 90%ක් හෝ ඊට වැඩි සහභාගීත්වයක් සහිතව විනයානුකූල ක්‍රියා මාර්ග ගැනීම පිළිබඳ පුහුණුවක් පැවැත්වීම.<br>2. බැඳියාවන් අතර ගැටුම් උල්ලංඝනය කිරීම් වාර්තා කිරීමේ සහ විසඳීමේ 90%ක අනුකූලතා ප්‍රතිශතයක් ලබා ගැනීම.<br>3. හඳුනාගත් උල්ලංඝන අවස්ථාවන්ගෙන් අවම වශයෙන් 80%කට සම්බාධක පැනවීම. | කෙටිකාලීන දීර්ඝකාලීන | ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව | ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව |
| 19 | විගණන වාර්තාවල සොයාගැනීම් සහ නිර්දේශ ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සඳහා යාන්ත්‍රණයක් නිර්මාණය කිරීම. | 1. අධීක්ෂණ රාමුවක් සකස් කර ක්‍රියාත්මක කිරීම.<br>2. විගණන නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ අවම වශයෙන් 80%ක ප්‍රතිශතයක් ලබා ගැනීම. | මධ්‍යකාලීන | පාර්ලිමේන්තුව | රාජ්‍ය ගිණුම් කාරක සභාව (COPA)<br><br>පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COPE) |

| | | | | | |
|---|---|---|---|---|---|
| 20 | ශක්තිමත් පාලනයක් සහ විනිවිදභාවයක් සඳහා අත්තිවාරමක් ස්ථාපිත කරන ඵලදායී ජාතික අයවැය ක්‍රියාවලියක් පහත ලක්ෂණ ඔස්සේ ක්‍රියාත්මක කිරීම:<br><br>i. නිවැරදි අනාවැකි සහ සවිස්තරාත්මක අවදානම් විශ්ලේෂණය මත පදනම් වූ මධ්‍ය කාලීන මූල්‍ය රාමුවක් භාවිතා කරමින් ජාතික අයවැය සකස් කිරීම.<br><br>ii. මූල්‍ය සැලසුම්කරණයේ සහ ප්‍රතිපත්ති ක්‍රියාකාරකම්වල පූර්ණ විනිවිදභාවය සහතික කිරීම සඳහා අයවැය මඟින් සමස්ත රාජ්‍ය පරිපාලන අංශයම ආවරණය වන බව සහතික කිරීම.<br><br>iii. අයවැය අනුමත කිරීම සඳහා පාර්ලිමේන්තුවේ බලය තහවුරු කරන සහ සම්පත් භාවිතය සඳහා අයවැය ආයතන වගකිව යුතු බවට සහතික වන නිර්වචනය කරන ලද, විනිවිද පෙනෙන සහ කාලෝචිත ක්‍රියාවලියක් හරහා අයවැය සකස් කිරීම. | 1. මධ්‍යකාලීන මූල්‍ය රාමුවක් භාවිතා කරමින් ජාතික අයවැය සකස් කිරීම.<br><br>2. සමස්ත රාජ්‍ය පරිපාලන අංශයම අයවැයට ඇතුළත් කිරීම. | කෙටිකාලීන | මුදල් අමාත්‍යාංශය | මුදල් අමාත්‍යාංශය |

| | | | | | |
|---|---|---|---|---|---|
| 21 | අයවැය පිරිවැය-ප්‍රතිලාභ සහ ක්‍රියාත්මක කිරීමේ හැකියාව පිළිබඳ විශ්ලේෂණයකින් තොරව පාර්ලිමේන්තුව විසින් සිදු කරනු ලබන විශාල සංශෝධන වැළැක්වීම සහ අයවැය හිඟයට වන බලපෑම සැලකිල්ලට ගනිමින් අයවැය වියදම් සැලසුම්කරණයේ විනය සහතික කිරීම. | 1. අයවැය වියදම් සැලසුම්කරණයට අදාළව පාර්ලිමේන්තුව මඟින් සිදු කරනු ලබන විශාල සංශෝධන සංඛ්‍යාව අවම වශයෙන් 70% කින් අඩු කිරීම | කෙටිකාලීන | මුදල් අමාත්‍යාංශය | මුදල් අමාත්‍යාංශය |
| 22 | සම්මත අභ්‍යන්තර පාලනයන් සහ බාහිර අධීක්ෂණයකින් තොරව අයවැයෙන් පිටත ඇති අරමුදල්වලට සම්බන්ධ දූෂණ අවදානම අවම කරමින් මූල්‍ය ප්‍රතිපත්තියේ සම්පූර්ණ විනිවිදභාවය සහ වගවීම සහතික කිරීම සඳහා සියලුම රාජ්‍ය අරමුදල් ජාතික අයවැය තුළ ඒකාබද්ධ කිරීම. | 1. උපදේශන පැවැත්වීම.<br>2. සියලුම රාජ්‍ය අරමුදල් ජාතික අයවැය තුළ 100%ක් ඒකාබද්ධ කිරීම සාක්ෂාත් කර ගැනීම.<br>3. ඒකාබද්ධ කරන ලද සියලුම රාජ්‍ය අරමුදල් සහ ඒවායේ වෙන් කිරීම් පිළිබඳ සවිස්තර වාර්ෂික විනිවිදභාව වාර්තා ප්‍රකාශයට පත් කිරීම. | කෙටිකාලීන | මුදල් අමාත්‍යාංශය | මුදල් අමාත්‍යාංශය |

| උප අරමුණ 5: මහජන විශ්වාසය සහ සදාචාරාත්මක පාලනය වර්ධනය කරමින් තේරී පත් වූ නියෝජිතයින්ගේ සුපිළිපන්නභාවය සහ වගවීම සහතික කිරීම සඳහා ශක්තිමත් යාන්ත්‍රණ ස්ථාපිත කිරීම. | | | | | |
|---|---|---|---|---|---|
| 1 | මැතිවරණ ව්‍යාපාර වියදම් අධීක්ෂණය පිළිබඳ නීති උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් වන අවදානම් සංඥා ක්‍රමානුකූලව හඳුනාගැනීම සඳහා දත්ත කේන්ද්‍රගත කරන විද්‍යුත් පද්ධතියක් ස්ථාපිත කිරීම. | 1. ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සඳහා තාක්ෂණික කමිටුවක් පත් කිරීම.<br>2. පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා සහ අපේක්ෂාවන් හඳුනා ගැනීම සඳහා අවශ්‍යතා ඇගයීමක් පැවැත්වීම.<br>3. පද්ධති පිරිවිතරයන් සහිත සංකල්ප සටහනක් සකස් කිරීම.<br>4. අදාළ සියලුම දත්ත මූලාශ්‍ර හඳුනාගෙන දත්ත ප්‍රමිතිකරණ ප්‍රොටෝකෝල සකස් කිරීම.<br>5. ලංසු කැඳවීම් නිකුත් කිරීම.<br>6. ප්‍රසම්පාදන කමිටුව කැඳවීම.<br>7. අවශ්‍ය මෘදුකාංග නිර්මාණය කර සංවර්ධනය කිරීම.<br>8. අවශ්‍ය දෘඩාංග මිල දී ගැනීම.<br>9. පරිශීලක පුහුණුවෙන් අවම වශයෙන් 80%ක් පැවැත්වීම.<br>10. අදාළ සියලුම දත්ත මූලාශ්‍ර කේන්ද්‍රගත පද්ධතියට 100%ක් ඒකාබද්ධ කිරීම.<br>11. පද්ධතිය ක්‍රියාත්මක කිරීම.<br>12. පද්ධතියේ කාර්ය සාධනය සහ ඵලදායීතාවය තක්සේරු කිරීම සඳහා වාර්ෂික සමාලෝචනයක් පැවැත්වීම. | මධ්‍යකාලීන | මැතිවරණ කොමිෂන් සභාව | මැතිවරණ කොමිෂන් සභාව |
| 2 | රාජ්‍ය තනතුරුවල වගවීම සහ සුපිළිපන්නභාවය ඉහළ නැංවීම සඳහා පාර්ලිමේන්තු ආචාර ධර්ම සංග්‍රහය පුළුල් ලෙස සමාලෝචනය කිරීම. | 1. සමාලෝචන කමිටුවක් පිහිටුවීම.<br>2. උපදේශන ක්‍රියාවලියක් හරහා පවතින ආචාර ධර්ම සංග්‍රහය සමාලෝචනය කිරීම.<br>3. සංශෝධන අවසන් කිරීම.<br>4. සංශෝධිත සංග්‍රහය පිළිබඳ පුහුණු සහ දැනුවත් කිරීමේ සැසිවාර සියල්ලම, කිසිදු අතපසු වීමකින් තොරව, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා පැවැත්වීම. | මධ්‍යකාලීන | පාර්ලිමේන්තුව | පාර්ලිමේන්තුව |

| | | | | | |
|---|---|---|---|---|---|
| 3 | සුපිළිපන්නභාවය සහ වගවීම ප්‍රවර්ධනය කිරීම සඳහා පළාත් සභා මන්ත්‍රීවරුන්, පළාත් පාලන ආයතනවල නියෝජිතයින් සහ සමූපකාර සමිතිවල සාමාජිකයින් සඳහා ආචාර ධර්ම සංග්‍රහයන් සකස් කර හඳුන්වා දීම. | 1. ක්‍රියාකාරී කණ්ඩායමක් පත් කිරීම.<br>2. මූලික කෙටුම්පත් සම්පූර්ණ කිරීම.<br>3. පාර්ශ්වකරුවන්ගේ උපදේශන පැවැත්වීම.<br>4. ආචාර ධර්ම සංග්‍රහයන් සකසා නිම කිරීම.<br>5. සංශෝධිත ආචාර ධර්ම සංග්‍රහය පිළිබඳ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන සියලු පුහුණු සහ දැනුවත් කිරීමේ සැසිවාර සාර්ථකව පැවැත්වීම. | මධ්‍යකාලීන | පාර්ලිමේන්තුව<br><br>මැතිවරණ කොමිෂන් සභාව | පාර්ලිමේන්තුව<br><br>මැතිවරණ කොමිෂන් සභාව |
| උප අරමුණ 6: අපරාධ යුක්ති විනිශ්චය පද්ධතියේ සුපිළිපන්නභාවය සහ ඵලදායීතාවය පිළිබඳ මහජන විශ්වාසය වැඩි දියුණු කිරීම. | | | | | |
| 1 | 2023 අංක 09 දරන දූෂණ විරෝධී පනත යටතේ තොරතුරු හෙළි කරන්නන් ආරක්ෂා කිරීමේ යාන්ත්‍රණය පිළිබඳව රාජ්‍ය නිලධාරීන් සහ පුරවැසියන් දැනුවත් කිරීම සඳහා පුළුල් සන්නිවේදන උපාය මාර්ගයක් සකස් කිරීම. | 1. සන්නිවේදන උපාය මාර්ගය සකස් කිරීම.<br>2. අන්තර්ගතය නිර්මාණය කිරීම.<br>3. තොරතුරු බෙදා හැරීම සඳහා වගකිව යුතු කාර්ය මණ්ඩලය සඳහා 100%ක පුහුණුව සම්පූර්ණ කිරීම.<br>4. මහජනතාව සහ රාජ්‍ය නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.<br>5. ප්‍රතිපෝෂණ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම.<br>6. සන්නිවේදන ප්‍රයත්නයේ ඵලදායීතාවය ඇගයීම සඳහා කාර්ය සාධන මිනුම් සකස් කිරීම. | මධ්‍යකාලීන | අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව | අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2 | තොරතුරු හෙළි කරන්නන් ආරක්ෂා කිරීමේ යාන්ත්‍රණයේ විස්තර සහ දූෂණය වාර්තා කිරීමේ ක්‍රියාවලිය පැහැදිලි කිරීම සඳහා රාජ්‍ය නිලධාරීන් සහ පාර්ශ්වකරුවන් සඳහා පුහුණු සැසි සංවිධානය කිරීම. | 1. පුහුණුව සඳහා අවශ්‍ය වන සියලුම මෙවලම් සකසා නිම කිරීම.<br>2. පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වීමේ ප්‍රතිශතය අවම වශයෙන් 85%ක් විය යුතු ය.<br>3. පුහුණුව සම්පූර්ණ කිරීමේ ප්‍රතිශතය අවම වශයෙන් 90%ක් විය යුතු ය.<br>4. පුහුණුවෙන් පසු දැනුම ඇගයීමේ දී, මෙහෙයුම් සහ සාරාංශ කරුණු පිළිබඳ දැනුම රඳවා තබා ගැනීම සහ අවබෝධය සාමාන්‍යයෙන් 80%ක් විය යුතු ය.<br>5. පුහුණු අන්තර්ගතයෙන් 70%ක් යෙදීම. | කෙටිකාලීන මධ්‍යකාලීන | අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව | අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව<br><br>ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය |
| 3 | තොරතුරු හෙළි කරන්නන් ආරක්ෂා කිරීමට සහ ඔවුන්ගේ ආරක්ෂාව සහතික කිරීමට දෙපාර්තමේන්තු ප්‍රධානියාට (HoD) බලය පැවරීම:<br><br>i. තොරතුරු හෙළි කරන්නන් ආරක්ෂා කිරීමේ සහ ඔවුන්ගේ ආරක්ෂාව සහතික කිරීමේ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ වගකීම් පැහැදිලිව නිර්වචනය කිරීම.<br><br>ii. තොරතුරු හෙළි කරන්නන්ට එලදායී ලෙස සහාය වීමට සහ ආරක්ෂා කිරීමට දෙපාර්තමේන්තු ප්‍රධානියාට සම්පත් සහ මාර්ගෝපදේශ සැපයීම. | 1. තොරතුරු හෙළි කරන්නන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ වගකීම් පැහැදිලි කරන ලියවිල්ලක් සකස් කර බෙදා හරින ලදී.<br>2. දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගෙන් අවම වශයෙන් 80%ක් තොරතුරු හෙළි කරන්නන්ගේ ආරක්ෂාව පිළිබඳ පුහුණුව සම්පූර්ණ කිරීම.<br>3. සමස්ත සම්පත් සහ මාර්ගෝපදේශ සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත සැපයීම.<br>4. තොරතුරු හෙළි කරන්නන්ට සහාය වීමේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ විශ්වාසය සහ ඵලදායීතාවය තක්සේරු කිරීම සඳහා ප්‍රතිපෝෂණ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම. | කෙටිකාලීන | අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව | අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව<br><br>සියලුම රාජ්‍ය ආයතනවල අභ්‍යන්තර කටයුතු ඒකක |

| | | | | | |
|---|---|---|---|---|---|
| 4 | සුපිළිපන්නභාවය සහ වගවීම ප්‍රවර්ධනය කිරීම සඳහා අධිකරණය විසින්ම සකස් කරන ලද, අධිකරණය සඳහා පැහැදිලි චර්යා මාර්ගෝපදේශ නිර්මාණය කිරීම. | 1. පාර්ශ්වකරුවන්ගේ උපදේශන පැවැත්වීම.<br>2. මාර්ගෝපදේශ කෙටුම්පත් කර සම්මත කිරීම.<br>3. නව මාර්ගෝපදේශ පිළිබඳව අධිකරණ සාමාජිකයින්ගෙන් 100%ක් සඳහා පුහුණු සැසි පැවැත්වීම. | කෙටිකාලීන | අධිකරණ සේවා කොමිෂන් සභාව | අධිකරණ සේවා කොමිෂන් සභාව |
| 5 | නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් සඳහා ආචාර ධර්ම සංග්‍රහයක් හඳුන්වා දීම සහ එයට අනුකූල වීම ඔවුන්ගේ සේවා කොන්ත්‍රාත්තුවල අනිවාර්ය අංගයක් බවට පත් කිරීම. | 1. මූලික කෙටුම්පත සම්පූර්ණ කිරීම.<br>2. පාර්ශ්වකරුවන්ගේ උපදේශන පැවැත්වීම.<br>3. ආචාර ධර්ම සංග්‍රහය අවසන් කිරීම.<br>4. නව සංග්‍රහය පිළිබඳ 100%ක පුහුණුව සහ දැනුවත් කිරීමේ සැසි පැවැත්වීම.<br>5. නව සේවා කොන්ත්‍රාත්තුවලින් 100% ක්ම ආචාර ධර්ම සංග්‍රහයට අනුකූල වීම ඇතුළත් කිරීම.<br>6. අනුකූලතා අධීක්ෂණ රාමුවක් ස්ථාපිත කිරීම.<br>7. ඵලදායීතාවය සහ අදාළත්වය සඳහා වාර්ෂික සමාලෝචනයක් පැවැත්වීම. | කෙටිකාලීන | අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව | ශ්‍රී ලංකා පොලීසිය<br>අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව |
| 6 | නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් සඳහා ආචාර ධර්ම සංග්‍රහයක් හඳුන්වා දීම සහ එයට අනුකූල වීම ඔවුන්ගේ සේවා කොන්ත්‍රාත්තුවල අනිවාර්ය අංගයක් බවට පත් කිරීම. | 1. මූලික කෙටුම්පත සම්පූර්ණ කිරීම.<br>2. පාර්ශ්වකරුවන්ගේ උපදේශන පැවැත්වීම.<br>3. ආචාර ධර්ම සංග්‍රහය අවසන් කිරීම.<br>4. නව සංග්‍රහය පිළිබඳ 100%ක පුහුණුව සහ දැනුවත් කිරීමේ සැසි පැවැත්වීම.<br>5. නව සේවා කොන්ත්‍රාත්තුවලින් 100% ක්ම ආචාර ධර්ම සංග්‍රහයට අනුකූල වීම ඇතුළත් කිරීම.<br>6. අනුකූලතා අධීක්ෂණ රාමුවක් ස්ථාපිත කිරීම.<br>7. ඵලදායීතාවය සහ අදාළත්වය සඳහා වාර්ෂික සමාලෝචනයක් පැවැත්වීම. | කෙටිකාලීන | නීතිපති දෙපාර්තමේන්තුව | නීතිපති දෙපාර්තමේන්තුව |

| | | | | | |
|---|---|---|---|---|---|
| 7 | නීතිඥවරුන් අතර ආචාර ධර්ම පිළිපැදීම ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණ රීති ක්‍රියාත්මක කිරීම සහ ශක්තිමත් කිරීම. | 1. මූලික කෙටුම්පත සම්පූර්ණ කිරීම.<br>2. පාර්ශ්වකරුවන්ගේ උපදේශන පැවැත්වීම.<br>3. ආචාර ධර්ම සංග්‍රහය අවසන් කිරීම.<br>4. නව සංග්‍රහය පිළිබඳ 100%ක පුහුණුව සහ දැනුවත් කිරීමේ සැසි පැවැත්වීම.<br>5. ඵලදායීතාවය සහ අදාළත්වය සඳහා වාර්ෂික සමාලෝචනයක් පැවැත්වීම. | දීර්ඝකාලීන | ශ්‍රී ලංකා නීතිඥ සංගමය | ශ්‍රී ලංකා නීතිඥ සංගමය |
| 8 | මානව හිමිකම් උල්ලංඝනය කිරීම් සම්බන්ධ පැමිණිලිවල ඇති දූෂණ ගැටලු ඵලදායීව හැසිරවීම පිළිබඳව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ (ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව) නිලධාරීන් පුහුණු කිරීම. | 1. පුහුණුව සඳහා අවශ්‍ය වන සියලුම මෙවලම් සකසා නිම කිරීම.<br>2. පවත්වන ලද පුහුණු සැසි ගණන.<br>3. පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වීමේ ප්‍රතිශතය අවම වශයෙන් 90%ක් විය යුතු ය.<br>4. පුහුණුව සම්පූර්ණ කිරීමේ ප්‍රතිශතය අවම වශයෙන් 95%ක් විය යුතු ය.<br>5. පුහුණුවට පෙර සහ පසු ඇගයීම්වල ලකුණු සංසන්දනය කිරීමේ දී, පුහුණුවෙන් පසු දැනුම වැඩිදියුණු වීමේ ප්‍රතිශතය අවම වශයෙන් 40%ක් විය යුතු ය.<br>6. පුහුණුවට සහභාගී වූවන්ගෙන් බහුතරයකගෙන් (80%) ප්‍රතිචාර ලබාගැනීමත්, පුහුණුවේ ඵලදායීතාවය ඉහළ මට්ටම (85%) ලෙස තක්සේරුකිරීමත් සිදු කිරීම. | කෙටිකාලීන | ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව | අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව<br>ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව |

| උප අරමුණ 7: පෞද්ගලික අංශය තුළ දූෂණය වැළැක්වීම සහ සදාචාරාත්මක ව්‍යාපාරික භාවිතයන් ප්‍රවර්ධනය කිරීම සඳහා ඉලක්ක ගත මුලපිරීම් ක්‍රියාත්මක කිරීම. | | | | | |
|---|---|---|---|---|---|
| 1 | පෞද්ගලික අංශය සඳහා වූ සුපිළිපන්නභාවය සහ දූෂණ විරෝධී ආයතනික සංග්‍රහයක ආකෘතියක්, පෞද්ගලික අංශයේ නියෝජිතයින්, නීති විශාරදයින් සහ දූෂණ විරෝධී සංවිධානවල නියෝජිතයින්ගේ සහභාගීත්වයෙන් යුතු උපදේශනාත්මක ක්‍රියාවලියක් මඟින්, සකස් කිරීම. | 1. ක්‍රියාකාරී කණ්ඩායමක් පත් කිරීම.<br>2. මූලික කෙටුම්පත සම්පූර්ණ කිරීම.<br>3. පාර්ශ්වකරුවන්ගේ උපදේශන පැවැත්වීම.<br>4. ආචාර ධර්ම සංග්‍රහය අවසන් කිරීම. | මධ්‍යකාලීන | අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව | අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව<br>සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව<br>සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව<br>වාණිජ මණ්ඩලය<br>ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය<br>ලංකා සේවාදායකයින්ගේ සම්මේලනය |
| 2 | මෙම සංග්‍රහයේ ඵලදායීතාවය සහ ප්‍රායෝගිකත්වය මෙහෙයුම් සැකසුම් තුළ ක්‍රියාත්මක කිරීමට සහ පරීක්ෂා කිරීමට කැමති සමාගම් සමඟ නියමු වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම. | 1. සහභාගී වන සමාගම් හඳුනා ගැනීම.<br>2. නව සංග්‍රහය පිළිබඳ 100%ක පුහුණුව සහ දැනුවත් කිරීමේ සැසි පැවැත්වීම.<br>3. සංග්‍රහයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම.<br>4. අනුකූලතා අධීක්ෂණ රාමුවක් ස්ථාපිත කිරීම.<br>5. ඵලදායීතාවය සහ අදාළත්වය පිළිබඳ වසර 2ක සමාලෝචනයක් පැවැත්වීම. | මධ්‍යකාලීන | අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව | සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව<br>සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව<br>වාණිජ මණ්ඩලය<br>ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය<br>ලංකා සේවාදායකයින්ගේ සම්මේලනය |

| | | | | | |
|---|---|---|---|---|---|
| 3 | සමාගම්වලට මෙම සංග්‍රහය ඵලදායී ලෙස තේරුම් ගැනීමට සහ ක්‍රියාත්මක කිරීමට උපකාර කිරීම සඳහා පුහුණු මෙවලම් සහ සම්පත් නිර්මාණය කිරීම. | 1. පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම.<br>2. නිශ්චිත කාල සීමාවක් තුළ සියලුම අන්තර්ගතයන් සහ පුහුණු මෙවලම් සංවර්ධනය කිරීම.<br>3. පුහුණු සැසිවල සමාගම්වලින් අවම වශයෙන් 70%ක සහභාගීත්වයක් ලබා ගැනීම. | මධ්‍යකාලීන | අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව | සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව<br>සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව<br>වාණිජ මණ්ඩලය<br>ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය<br>ලංකා සේවාදායකයින්ගේ සම්මේලනය |
| 4 | ආයතනික සුපිළිපන්නභාවය සහ දූෂණ විරෝධී සංග්‍රහය සම්මත කර ක්‍රියාත්මක කිරීම සඳහා සමාගම්වලට දිරිගැන්වීම් සකස් කිරීම. | 1. දිරිගැන්වීම් ක්‍රියාත්මක කිරීම සඳහා වන ව්‍යුහයක් සකස් කිරීම.<br>2. පළමු වසර තුළ දිරිගැන්වීමේ වැඩසටහන සඳහා සමාගම් 40ක සහභාගීත්වය සුරක්ෂිත කිරීම.<br>3. දිරිගැන්වීම් වැඩසටහනේ ඵලදායීතාවය පිළිබඳව නිත්‍ය කාල පරාසයන් තුළ ඇගයීම් සිදුකර, ව්‍යුහයට අවශ්‍ය සංශෝධන සිදු කිරීම.<br>4. සාර්ථක සමාගම් සඳහා දෘශ්‍යතාව සහ පිළිගැනීම ලබා දීම සඳහා වැඩසටහනක් ස්ථාපිත කිරීම. | මධ්‍යකාලීන | අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව | සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව<br>සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව<br>වාණිජ මණ්ඩලය<br>ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය<br>ලංකා සේවාදායකයින්ගේ සම්මේලනය |

| | | | | | |
|---|---|---|---|---|---|
| 5 | ආයතනික ආර්ථික කාර්යක්ෂමතාව සහ කීර්තිය සඳහා එහි වැදගත්කම ඉස්මතු කරමින්, පෞද්ගලික අංශයේ සමාගම් අතර සංග්‍රහය ප්‍රවර්ධනය කිරීම සඳහා වැඩසටහනක් දියත් කිරීම. | 1. වැඩසටහන සැලසුම් කර දියත් කිරීම.<br>2. සංග්‍රහය පිළිබඳ දැනුවත්භාවය අවම වශයෙන් 30%ක් විය යුතු අතර වැඩිවීමක් පෙන්නුම් කරමින්, වැඩසටහනට පෙර සහ පසු සමීක්ෂණ පැවැත්වීම.<br>3. වැඩසටහන සම්බන්ධ සිදුවීම් හෝ මුලපිරීම් සඳහා අවම වශයෙන් සමාගම් 50 ක් සම්බන්ධ වීම. | මධ්‍යකාලීන | අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව | සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව<br>සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව<br>වාණිජ මණ්ඩලය<br>ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය<br>ලංකා සේවාදායකයින්ගේ සම්මේලනය |
| 6 | සේවකයින්ට දූෂිත ක්‍රියාවන් වාර්තා කිරීම සඳහා ආරක්ෂිත වාර්තා කිරීමේ යාන්ත්‍රණ (අනන්‍යතාවය හෙළි නොවන වාර්තා කිරීමේ යාන්ත්‍රණ ඇතුළුව) ස්ථාපිත කිරීම. | 1. ආරක්ෂිත සහ රහසිගත වාර්තා කිරීමේ මාර්ග ස්ථාපිත කිරීම.<br>2. පරිශීලක ප්‍රවේශ්‍යතා අනුපාතය 100%ක් විය යුතු ය.<br>3. පළමු වසර තුළ වාර්තා කිරීමේ ප්‍රමාණය 25%කින් වැඩි කිරීම.<br>4. වාර්තා කිරීමේ යාන්ත්‍රණවල ඵලදායීතාවය සහ රහස්‍යභාවය සම්බන්ධයෙන් වාර්ෂික පරිශීලක සමීක්ෂණවල තෘප්තිමත්භාවයේ ප්‍රතිශතය අවම වශයෙන් 75%ක් විය යුතු ය. | කෙටිකාලීන | අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව<br>සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව | පෞද්ගලික අංශයේ සමාගම් |
| 7 | රාජ්‍ය පරිපාලනය සමඟ ගනුදෙනු කිරීමේ දී දේශීය හා විදේශීය සමාගම්වලට මුහුණ දීමට සිදුවන දූෂණ සහ වෙනත් අක්‍රමිකතා වාර්තා කිරීම සඳහා වේදිකාවක් සැපයීම සඳහා ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික ඔම්බුඩ්ස්මන් කාර්යාලයක් (Business Ombudsman) ස්ථාපිත කිරීම. | 1. උපදේශන ක්‍රියාවලියක් හරහා නීතිමය සහ මෙහෙයුම් රාමුවක් සකස් කිරීම.<br>2. ඔම්බුඩ්ස්මන් කාර්යාලය ස්ථාපිත කිරීම.<br>3. එම කාර්යාලයට අවශ්‍ය සියලුම සම්පත් සැපයීම.<br>4. පුළුල් දැනුවත් කිරීමේ වැඩසටහනක් දියත් කිරීම.<br>5. මෙහෙයුම් ආරම්භ කර පළමු වසර තුළ වාර්තා වූ අවස්ථා වලින් අවම වශයෙන් 60%ක විසඳුම් අනුපාතයක් ලබා ගැනීම. | මධ්‍යකාලීන | මුදල් අමාත්‍යාංශය | කැබිනට් මණ්ඩලය<br>මුදල් අමාත්‍යාංශය<br>සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව |



කඩුපුල් මල - සුපිළිපන් බව

# ආ. අධ්‍යාපනය සහ ප්‍රජා සහභාගීත්වය

## ආ. අධ්‍යාපනය සහ ප්‍රජා සහභාගීත්වය

**දෙවන උපාය මාර්ගික ප්‍රමුඛතා ක්ෂේත්‍රය: අධ්‍යාපනය සහ ප්‍රජා සහභාගීත්වය**

ජාතියක් ලෙස දූෂණයට එරෙහිව සටන් කිරීමේ දී, බහුපාර්ශ්වික ප්‍රවේශයක් අවශ්‍ය වේ - නෛතික හා ආයතනික ප්‍රතිසංස්කරණ පමණක් නොව අධ්‍යාපනය සහ ප්‍රජා සහභාගීත්වය තුළින් පුරවැසියන් සවිබල ගැන්වීම ද එහි ඇතුළත් වේ. මෙම අංශය, දූෂණය මුලිනුපුටා දැමිය හැකි විනිවිදභාවය, වගවීම සහ සදාචාරාත්මක පාලනය පිළිබඳ සංස්කෘතියක් ගොඩනැගීමේ දී මෙන්ම පාර්ශ්වකරුවන් අතර සදාචාරාත්මක දැනුවත්භාවය සහ අඛණ්ඩතාව සඳහා පදනම දැමීමේ දී ඉතා වැදගත් වේ.

දූෂණයේ හානිකර බලපෑම් පිළිබඳ ගැඹුරු අවබෝධයක් ප්‍රවර්ධනය කිරීමෙන්, පුද්ගලික හා සමාජීය මට්ටමින් එහි අහිතකර ප්‍රතිවිපාක හඳුනා ගැනීමට "අධ්‍යාපනය" පුද්ගලයන්ට උපකාරී වේ. තවද, දූෂිත නිලධාරීන් වගවීමට තබා ගැනීම සඳහා පුරවැසියන්ගේ අයිතිවාසිකම් සහ යාන්ත්‍රණ පිළිබඳ දැනුවත්භාවය අධ්‍යාපනය වැඩි කරයි. ඒ අනුව, වගවීම ඉල්ලා සිටීමට, දූෂිත ක්‍රියාවලට අභියෝග කිරීමට සහ සදාචාරාත්මක තීරණ ගැනීමේ ක්‍රියාවලීන්හි නිරත වීමට මහජනතාව වඩා හොඳින් සූදානම් වනු ඇත. මේ ආකාරයෙන්, අධ්‍යාපනය පුද්ගල දැනුවත්භාවය වැඩි කරනවා පමණක් නො ව, ක්‍රියාකාරී සහභාගීත්වය සහ යහපාලනය සඳහා උපදේශනය දිරිමත් කිරීමෙන් ප්‍රජාතන්ත්‍රවාදී ආයතන ද ශක්තිමත් කරයි.

අධ්‍යාපනය පුද්ගලයන් සවිබල ගන්වන අතරම, ප්‍රජා සහභාගීත්වය දූෂණයට විසඳුම් සෙවීම සඳහා සාමූහික බලවේගයක් නිර්මාණය කරයි. පුරවැසියන් උදාසීන හෝ නොසැලකිලිමත්වන පරිසරවල දූෂණය වර්ධනය වේ. ප්‍රජා සහභාගීත්වය සාමූහික. වගකීමක් පිළිබඳ හැඟීමක් ඇති කරමින්, යුක්තිය, විනිවිදභාවය සහ සදාචාරාත්මක පාලනය වැනි පොදු ඉලක්ක කරා එකට වැඩ කිරීමට පුද්ගලයන් දිරිමත් කරයි. මේ ආකාරයෙන්, ප්‍රජාවන්ට ප්‍රතිසංස්කරණ සඳහා ප්‍රබල බලවේගයක් ලෙස ක්‍රියා කළ හැකි අතර, දූෂිත ක්‍රියාවන් හෙළිදරව් කර විසඳුම් සෙවීම සහතික කළ හැකි ය.

මෙම තත්ත්වයන් තුළ, දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම විසින් 'අධ්‍යාපනය සහ ප්‍රජා සහභාගීත්වය' සිය දෙවන ප්‍රධාන උපාය මාර්ගික ප්‍රමුඛතා ක්ෂේත්‍රය ලෙස හඳුනාගෙන ඇති අතර, එහි සමස්ත උපාය මාර්ගික අරමුණ වන්නේ දැනුවත් සහභාගීත්වය සහ සදාචාරාත්මක ක්‍රියාකාරීත්වය තුළින් පුරවැසියන් සවිබල ගැන්වීම සහ දූෂණය අවම කිරීම සඳහා, වටිනාකම් පදනම් කරගත් අධ්‍යාපනය සහ ප්‍රජා සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීමයි.

පවතින සංස්කෘතිය සහ දූෂණය කෙරෙහි ඇති ආකල්ප වෙනස් කිරීමේ සහ දූෂණයට එරෙහිව සටන් කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගනිමින්, දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම, විධිමත් අධ්‍යාපන ක්‍රමය තුළ ළමයින්ට අඛණ්ඩතාව, විනිවිදභාවය සහ නීතියේ ආධිපත්‍යයේ වැදගත්කම ඉගැන්වීමට යෝජනා කරයි. සිවිල් වගකීම පිළිබඳ දැඩි හැඟීමක් ඇති කිරීමෙන් සහ මුල් අධ්‍යාපනය තුළින් අවංකභාවය සහ සාධාරණත්වය පිළිබඳ වටිනාකම් ඇති කිරීමෙන්, ළමයින් සුපිළිපන් සංස්කෘතියකට එලදායී ලෙස හඳුන්වා දෙන අතර, එය ශක්තිමත් සදාචාරාත්මක මූලධර්ම සහිත ආදර්ශවත් වැඩිහිටියන් ලෙස ඔවුන්ගේ වර්ධනයට දායක වේ. ඒ සමගම, සිවිල් සහභාගීත්වය පුද්ගලයන්ට පාලන ව්‍යුහයන් සමග අන්තර් ක්‍රියා කිරීමට සහ ඔවුන්ගේ ක්‍රියාකාරකම් නිරීක්ෂණය කිරීමට හැකියාව ලබා දෙයි, ඔවුන් දූෂිත ක්‍රියාවලට සම්බන්ධ නොවන බව සහතික කරයි.

එවැනි අරමුණක් සඳහා, දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම විසින් පහත **උප අරමුණු** අට **(08)** යටතේ ක්‍රියා මාර්ග යෝජනා කරයි:

1. පෞරුෂ සංවර්ධනයේ විවිධ අවධීන්හි දී සදාචාරාත්මක වටිනාකම් ඇති කිරීමට සහ වගකිවයුතු පුරවැසිභාවය ප්‍රවර්ධනය කිරීමට ළමයින්ට සහ තරුණයින්ට සුපිළිපන්න අධ්‍යාපනය ලබා දීම.

2. රාජ්‍ය නිලධාරීන් අතර විනිවිදභාවය, වගවීම සහ සදාචාරාත්මක භාවිතයන් ප්‍රවර්ධනය කිරීම සඳහා රාජ්‍ය අංශය තුළ දැනුවත් කිරීමේ මුලපිරීම් වැඩි දියුණු කිරීම.
3. විනිවිදභාවය සහ යහපාලනය ප්‍රවර්ධනය කිරීමේ දී සිවිල් සමාජයේ සහ පුරවැසියන්ගේ භූමිකාව ශක්තිමත් කිරීම තුළින් වගවීම සඳහා මහජන ඉල්ලුම පෝෂණය කිරීම.
4. සමාජය තුළ අඛණ්ඩතා සංස්කෘතියක් පෝෂණය කිරීම සහ සදාචාරාත්මක ප්‍රමිතීන් ප්‍රවර්ධනය කිරීම සඳහා මාධ්‍යවල භූමිකාව ශක්තිමත් කිරීම.
5. වටිනාකම් පදනම් කරගත් අධ්‍යාපන වැඩසටහන් හරහා, සුපිළිපන් සමාජයක් ගොඩනැගීම සඳහා පෞද්ගලික අංශයේ සහභාගීත්වය දිරිමත් කිරීම.
6. දූෂණ විරෝධී අවකාශයේ සහභාගීත්වය වැඩි දියුණු කිරීම සඳහා වටිනාකම් පදනම් කරගත් අධ්‍යාපන මුලපිරීම් හරහා තේරී පත් වූ මහජන නියෝජිතයින් අතර දැනුවත්භාවය ප්‍රවර්ධනය කිරීම.
7. අපරාධ යුක්ති පසිඳලීම ක්‍රියාවලියේ පාර්ශ්වකරුවන් අතර නීතිමය දැනුම හා අවබෝධය වැඩි දියුණු කිරීම.
8. දූෂණය, එහි හේතු, බලපෑම් සහ රටා විශ්ලේෂණය කරන පුළුල් පර්යේෂණ හරහා රට තුළ දූෂණය පිළිබඳ අවබෝධය වැඩි දියුණු කිරීම.

පුද්ගලයන් හා ප්‍රජාවන් තම අයිතිවාසිකම්, දූෂණයේ ප්‍රතිවිපාක සහ වෙනසක් ඇති කළ හැකි ක්‍රමවේද පිළිබඳව දැනුවත් වන විට, සියලු මට්ටම්වලින් දූෂණයට එරෙහි සටන ශක්තිමත් කිරීම සඳහා, පුද්ගලිකව හා සාමූහිකව ක්‍රියා කිරීමට පෙළඹෙනු ඇති අතර, එමඟින් සුපිළිපන් සමාජයක් ගොඩනැගීම සිදුවේ.

| උපාය මාර්ගික අරමුණ: පුරවැසියන් සවිබල ගැන්වීම හා දූෂණය අවම කිරීම සඳහා, දැනුම පදනම් කරගත් සහභාගීත්වය සහ සදාචාරාත්මක හැසිරීම් තුළින්, වටිනාකම් පදනම් කරගත් අධ්‍යාපනය හා ප්‍රජා සහභාගීත්වය ප්‍රවර්ධනය. | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| උප-අරමුණු 1: ළමා හා තරුණ පරපුරට සදාචාරාත්මක වටිනාකම් ඇති කිරීම සහ සංවර්ධනයේ ප්‍රාරම්භක අවධියේ දී වගකිවයුතු පුරවැසිභාවය ප්‍රවර්ධනය කිරීම සඳහා සුපිළිපන්න අධ්‍යාපනය ලබා දීම. | | | | | | | |
| No. | මිනුම්/ක්‍රියා මාර්ග | ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPIs) | කාල රාමුව | | | වගකිවයුතු (ප්‍රධාන) ආයතනය | ක්‍රියාත්මක කරන ආයතන |
| | | | කෙටි | මධ්‍ය | දීර්ඝ | | |
| 1 | ශ්‍රී ලංකාව සඳහා දූෂණ විරෝධී සහ සුපිළිපන්න අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම. | 1. කෙටුම්පත් ප්‍රතිපත්තිය සකස් කිරීම<br>2. පාර්ශ්වකරුවන්ගේ උපදේශන අවසන් කිරීම<br>3. කෙටුම්පත අවසන් කිරීම<br>4. ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ගය සකස් කිරීම | මධ්‍යකාලීන | | | අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය | අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය |
| 2 | ප්‍රාථමික, මධ්‍යම සහ උසස් පාසල් සඳහා පවතින විෂයමාලාවල පූර්ණ සමාලෝචනයක් සිදු කර සහභාගීත්ව අධ්‍යාපන ක්‍රම හරහා සුපිළිපන්න සහ දූෂණ විරෝධී පණිවිඩ ඇතුළත් කර ඇති බව සහතික කිරීම. | 1. පවතින විෂය මාලා 100%ක් සමාලෝචනය කිරීම<br>2. සහභාගීත්ව ක්‍රම හරහා දූෂණ විරෝධී පණිවිඩ විෂයමාලාවට ඇතුළත් කිරීම.<br>3. යාවත්කාලීන කරන ලද විෂයමාලා ක්‍රියාත්මක කිරීමට සම්බන්ධ ගුරුවරුන්ගෙන් අවම වශයෙන් 80%කට පුහුණුව ලබා දීම | දීර්ඝකාලීන | | | අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය | අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| 3 | විශ්වවිද්‍යාලවල විෂය නිර්දේශවලට දූෂණ විරෝධී අධ්‍යාපනය ඒකාබද්ධ කිරීම. | 1. පවතින විෂය මාලා 100%ක් සමාලෝචනය කිරීම<br>2. අවම වශයෙන් නව හෝ සංශෝධිත පාඨමාලා 5ක් හඳුන්වා දීම<br>3. පාඨමාලා පවත්වන පීඨ සාමාජිකයින්ගෙන් අවම වශයෙන් 80% කට පුහුණුව ලබා දීම<br>4. දූෂණ විරෝධී අධ්‍යාපනයේ අදාළත්වය සහ ගුණාත්මකභාවය පිළිබඳව අවම වශයෙන් 85%ක ශිෂ්‍ය තෘප්තිමත්භාවයක් ලබා දීම | මධ්‍යකාලීන | | | අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව |

| | | | | | |
|---|---|---|---|---|---|
| 4 | තාක්ෂණික ආයතන සහ වෘත්තීය පුහුණු ආයතනවල විෂය මාලාවට දූෂණ විරෝධී අධ්‍යාපනය ඒකාබද්ධ කිරීම. | 1. පවතින විෂයමාලා 100%ක් සමාලෝචනය<br>2. අවම වශයෙන් නව සංශෝධිත පාඨමාලා 3ක් හඳුන්වා දීම<br>3. පාඨමාලා පවත්වන උපදේශකයින්ගෙන් අවම වශයෙන් 80%කට පුහුණුව ලබා දීම<br>4. දූෂණ විරෝධී පාඨමාලා වල අදාළත්වය සහ ගුණාත්මකභාවය පිළිබඳව අවම වශයෙන් 85%ක ශිෂ්‍ය තෘප්තිමත්භාවයක් ලබා දීම | මධ්‍යකාලීන | අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය | ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු අධිකාරිය (NAITA) |
| 5 | විශ්වවිද්‍යාල උපාධි අපේක්ෂකයින් සඳහා වන ප්‍රාරම්භක වැඩසටහන්වලට දූෂණ විරෝධී සහ සුපිළිපන්න මොඩියුල හඳුන්වා දීම. | 1. පුළුල් සැසි සැලැස්මක් සකස් කර අවසන් කිරීම.<br>2. සියලුම දැනුවත් කිරීමේ මෙවලම් සකස් කිරීම.<br>3. සැසි සහභාගීත්ව අනුපාතය අවම වශයෙන් 90%ක් වීම.<br>4. සැසිවල ඵලදායීතාවය පිළිබඳ ප්‍රතිපෝෂණ ලේඛනගත කිරීම. | මධ්‍යකාලීන | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව |
| 6 | විෂය මාලාවට දූෂණ විරෝධී බව සහ සුපිළිපන් බව ඒකාබද්ධ කරන ආකාරය පිළිබඳව පෙර පාසල් සහ පාසල් ගුරුවරුන් සඳහා දැනුවත් කිරීමේ වැඩමුළු සහ ගුරු පුහුණු වැඩමුළු පැවැත්වීම. | 1. සියලුම ඉගැන්වීමේ මෙවලම් සකස් කිරීම.<br>2. පුහුණු කිරීමේ වැඩමුළු පැවැත්වීම.<br>3. සැසි සහභාගීත්වය අවම වශයෙන් 90%ක් වීම.<br>4. පුහුණු සම්පූර්ණ කිරීමේ අනුපාතය අවම වශයෙන් 95%ක් වීම.<br>5. සැසිවල ඵලදායීතාවය පිළිබඳ ප්‍රතිපෝෂණ ලේඛනගත කිරීම. | කෙටිකාලීන<br>දීර්ඝකාලීන | අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශ | අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශ |

| | | | | | |
|---|---|---|---|---|---|
| 7 | පාසල් බලධාරීන්ට දූෂණයට වැඩි අවදානමක් ඇති කාලවල දී, විශේෂයෙන් 1, 5 සහ 12 ශ්‍රේණිවලට සිසුන් ඇතුළත් කිරීමේ දී දූෂිත ක්‍රියාවලින් වැළකී සිටීමට අවශ්‍ය මාර්ගෝපදේශ සහ චක්‍රලේඛ නිකුත් කිරීම. | 1. මාර්ගෝපදේශ සහ චක්‍රලේඛ සංවර්ධනය කර බෙදා හැරීම.<br>2. දැනුවත් කිරීමේ මෙවලම් සංවර්ධනය කිරීම.<br>3. දැනුවත් කිරීමේ ව්‍යාපාරය ක්‍රියාත්මක කිරීම.<br>4. ඵලදායිතාව සහ අදාළත්වය සඳහා වාර්ෂික සමාලෝචනයක් පැවැත්වීම. | | අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශ | අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශ |
| 8 | සිසුන් අතර සුපිළිපන් බව සංස්කෘතියක් පෝෂණය කිරීම සඳහා පාසල්වල සුපිළිපන් සමාජ ස්ථාපිත කිරීම අඛණ්ඩව සිදු කිරීම. | 1. ඉලක්කගත පාසල්වලින් අවම වශයෙන් 80%ක ප්‍රමාණයක සුපිළිපන් සමාජ ස්ථාපිත කිරීම.<br>3. පාසල් තුළ අවම වශයෙන් 70%ක සාමාජිකත්ව අනුපාතයක් තිබීම.<br>3. සමාජ සාමාජිකයින්ගෙන් අවම වශයෙන් 75%ක් වාර්ෂිකව සුපිළිපන් බව සම්බන්ධ ක්‍රියාකාරකම් දෙකක හෝ වැඩි ගණනක සහභාගී වීම.<br>4. ගුරුවරුන් සහ පාසල් පරිපාලකයින් සුපිළිපන් සමාජ සාමාජිකයින්ට සහාය වීමට සහ උපදේශනය කිරීමට පුහුණු කිරීම. | කෙටිකාලීන මධ්‍යකාලීන | අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශ | අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශ |
| 9 | ආදර්ශමත් ලෙස ඉහළ සදාචාරාත්මක ප්‍රමිතීන් පෙන්නුම් කරන සුපිළිපන් සමාජවල පාසල් දරුවන් හඳුනාගෙන ත්‍යාග පිරිනැමීම | 1. විධිමත් පිළිගැනීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම.<br>2. සුපිළිපන් සමාජ පිළිගැනීමේ සහ ත්‍යාග ප්‍රදානෝත්සව සඳහා සහභාගී කර ගැනීම.<br>3. සුපිළිපන් බව සහ දූෂණ විරෝධී දැනුවත්භාවය ප්‍රවර්ධනය කරන වැඩසටහන් ශිෂ්‍යයන්ගේ නායකත්ව මූලිකත්වය මත දියත් කිරීම | මධ්‍යකාලීන | අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශ | අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශ |

| | | | | | |
|---|---|---|---|---|---|
| 10 | ශිෂ්‍යයින් නිර්මාණාත්මකව සම්බන්ධ කර ගැනීම සඳහා කලා සහ නාට්‍ය තුළින් දූෂණ විරෝධී ක්‍රියාකාරකම් සංවර්ධනය කිරීම. | 1. සැලසුම් කරන ලද සම-අධ්‍යාපනික දූෂණ විරෝධී ක්‍රියාකාරකම් (උදා: නාට්‍ය, විවාද, චිත්‍ර තරඟ, කතන්දර කීම.)<br>2. කලා සහ නාට්‍ය පදනම් කරගත් දූෂණ විරෝධී වැඩසටහන් පාසල් අධ්‍යාපනයට ඇතුළත් කිරීම.<br>3. පාසල්වලින් අවම වශයෙන් 60%ක් වත් අධ්‍යයන වර්ෂයකට අවම වශයෙන් එක් දූෂණ විරෝධී තේමාවට අනුකූලව නිර්මාණාත්මක ක්‍රියාකාරකමක් අනුගමනය කිරීම.<br>4. සිසුන් දූෂණ විරෝධී කලා සහ නාට්‍ය ක්‍රියාකාරකම්වලට සහභාගී කිරීම.<br>5. සිසුන් විසින් නිර්මාණය කරන ලද කලා සහ නාට්‍ය නිෂ්පාදන හරහා දූෂණ විරෝධී පණිවිඩ සමාජගත කිරීම. | කෙටිකාලීන දීර්ඝකාලීන් | අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශ | අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශ |
| 11 | පාසල්වල දූෂණ විරෝධී මාතෘකා යටතේ විවාද සහ තරග පැවැත්වීම | 1. පාසල්, දිස්ත්‍රික් සහ ජාතික මට්ටමින් වාර්ෂිකව පැවැත්වීම.<br>2. දූෂණ විරෝධී විවාද සහ තරඟ සඳහා සහභාගී කිරීම.<br>3. විවාද සහ තරඟ සඳහා තරඟ කිරීමට සිසුන් ලියාපදිංචි කිරීම.<br>4. සහභාගී වීමට පෙර සහ පසු දූෂණ විරෝධී මූලධර්ම පිළිබඳ දැනුම රඳවා ගැනීමේ දැනුම තක්සේරු කිරීම සහ තරඟයෙන් පසු සාමාන්‍යයෙන් 80%ක් වීම. | කෙටිකාලීන දීර්ඝකාලීන් | අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශ | අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශ |

| | | | | | |
|---|---|---|---|---|---|
| 12 | තරුණ කමිටු දූෂණ-වැළැක්වීමේ ක්‍රියාකාරකම්වලට සම්බන්ධ කර ගැනීම සඳහා උපාය මාර්ග සංවර්ධනය කිරීම. | 1. තරුණ කමිටු දූෂණ-වැළැක්වීමේ මුලපිරීම්වල නිරත වීම.<br>2. දූෂණ විරෝධී දැනුවත්භාවය සහ නායකත්වය පිළිබඳව තරුණ කමිටු සාමාජිකයින් සඳහා පුහුණු සැසි පැවැත්වීම.<br>3. තරුණ කමිටු විසින් සංවිධානය කරන ලද දූෂණ විරෝධී ව්‍යාපාර, වැඩමුළු සහ ප්‍රජා සහභාගීත්ව වැඩසටහන් පැවැත්වීම.<br>4. ප්‍රජා හෝ ආයතනික මට්ටමින් දූෂණ සම්බන්ධ ගැටලු විසඳන තරුණ නායකත්ව වැඩසටහන් පැවැත්වීම.<br>5. ප්‍රතිපත්ති සම්පාදකයින්, සිවිල් සමාජ සංවිධාන හෝ පෞද්ගලික අංශය සමඟ සෘජු සහභාගීත්වය ඇතුළත් තරුණ කමිටු ක්‍රියාකාරකම් දියත් කිරීම.<br>6. තරුණ මූලිකත්වය යටතේ දූෂණ විරෝධී දැනුවත් කිරීමේ වැඩසටහන් හරහා ප්‍රජා සාමාජිකයින් සහ සිසුන් දැනුවත් කිරීම. | කෙටිකාලීන මධ්‍යකාලීන | ශ්‍රී ලංකා ජාතික තරුණ සේවා සභාව. | ශ්‍රී ලංකා ජාතික තරුණ සේවා සභාව. |
| **උප අරමුණ 2:** රාජ්‍ය අංශය තුළ විනිවිදභාවය, වගවීම සහ සදාචාරාත්මක පිළිවෙත් රාජ්‍ය නිලධාරීන් අතර ප්‍රවර්ධනය කිරීම සඳහා, දැනුවත් කිරීමේ වැඩසටහන් වැඩිදියුණු කිරීම. | | | | | |
| 1 | රාජ්‍ය ආයතන තුළ ඉහළ මට්ටමේ දූෂණ විරෝධී වැඩසටහන් ආයතනික ප්‍රධානීන්ගේ අනුග්‍රහය යටතේ පැවැත්වීම. දූෂණයට එරෙහිව කිසිදු ඉවසීමක් නොදක්වන ප්‍රවේශයක් අවධාරණය කිරීම. | 1. රාජ්‍ය ආයතන දූෂණ විරෝධී වැඩසටහන් නිල වශයෙන් දියත් කිරීම.<br>2. ආයතනික ප්‍රධානීන්ගෙන් අවම වශයෙන් 80%ක් වැඩසටහන ප්‍රසිද්ධියේ අනුමත කර සහ අනුග්‍රහය දැක්වීම.<br>3. වැඩසටහන් දියත් කිරීමේ උත්සව, දැනුවත් කිරීමේ සැසි සහ පුහුණුව හරහා සේවකයින් සහභාගී කර ගැනීම.<br>4. ආයතන තුළ දූෂණ විරෝධී මුලපිරීම් ක්‍රියාත්මක කිරීම. | කෙටිකාලීන | රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය | රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය<br><br>ජනාධිපති ලේකම් කාර්යාලය<br><br>අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2 | සියලුම රාජ්‍ය නිලධාරීන් සඳහා රාජ්‍ය සේවා විභාග/කාර්යක්ෂමතා බාධක විභාගවලට අල්ලස් සහ දූෂණය සම්බන්ධ ප්‍රශ්න ඇතුළත් කිරීම | 1. රාජ්‍ය සේවා විභාගවල අල්ලස් සහ දූෂණය පිළිබඳ ප්‍රශ්න යම් ප්‍රතිශතයක් ඇතුළත් කිරීම.<br>2. දූෂණ විරෝධී මාතෘකා ඇතුළත් කිරීම සඳහා නිල වශයෙන් සංශෝධනය කරන ලද විභාග විෂය නිර්දේශ සහ අධ්‍යයන මාර්ගෝපදේශ.<br>3. විභාගවල දූෂණ සම්බන්ධ අන්තර්ගතය ඇතුළත් කිරීම වැඩිදියුණු කිරීම සඳහා පවත්වන ලද ප්‍රතිපෝෂණ සැසි හෝ පාර්ශ්වකරුවන්ගේ උපදේශන.<br>4. අදාළ විභාග කොටස්වල අල්ලස් දූෂණය සම්බන්ධ ප්‍රශ්න ඇතුළත් කිරීම. | මධ්‍යකාලීන | රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය | රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය |
| 3 | රාජ්‍ය නිලධාරීන් සඳහා හඳුන්වා දුන් දින 5ක දූෂණ විරෝධී සහ සුපිළිපන්න පුහුණු මොඩියුලය ක්‍රියාත්මක කිරීම | 1. විවිධ රාජ්‍ය ආයතන හරහා වාර්ෂිකව දින 5 පුහුණු සැසි පැවැත්වීම.<br>2. දින 5 පුහුණු වැඩසටහන සම්පූර්ණ කරන රාජ්‍ය නිලධාරීන් ගණන.<br>3. පුහුණුවෙන් අනතුරුව, සහභාගී වන්නන්ගේ දැනුම රඳවා ගැනීමේ මට්ටම සාමාන්‍යයෙන් 80%ක් ලෙස ඇගයීම්වලින් තහවුරු කර ගැනීම.<br>4. ප්‍රතිපත්තිමය හෝ නීතිමය වෙනස්කම්වලට අනුකූලව, පුහුණු මොඩියුල සම්පූර්ණයෙන්ම වාර්ෂිකව යාවත්කාලීන කිරීම.<br>5. පුහුණු ක්‍රියාත්මක කිරීම පහසු කිරීම සඳහා රාජ්‍ය ආයතන තුළ සංවර්ධනය කරන ලද පුහුණුකරුවන් ගණන පුළුල් කිරීම. | කෙටිකාලීන<br>දීර්ඝකාලීන | රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය | රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය<br><br>ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA) |

| | | | | | |
|---|---|---|---|---|---|
| 4 | සියලුම රාජ්‍ය නිලධාරීන්ගේ දූෂණ විරෝධී සහ සුපිළිපන් බව පිළිබඳ දැනුම සහ පිළිපැදීම් අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා, නිතිපතා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | 1. විවිධ රාජ්‍ය ආයතන හරහා වාර්ෂිකව දින 5 පුහුණු සැසි පැවැත්වීම.<br>2. දින 5 පුහුණු වැඩසටහන සම්පූර්ණ කරන රාජ්‍ය නිලධාරීන් ගණන.<br>3. පුහුණුවෙන් අනතුරුව, සහභාගී වන්නන්ගේ දැනුම රඳවා ගැනීමේ මට්ටම සාමාන්‍යයෙන් 80%ක් ලෙස ඇගයීම්වලින් තහවුරු කර ගැනීම.<br>4. ප්‍රතිපත්තිමය හෝ නීතිමය වෙනස්කම්වලට අනුකූලව, පුහුණු මොඩියුල සම්පූර්ණයෙන්ම වාර්ෂිකව යාවත්කාලීන කිරීම.<br>5. පුහුණු ක්‍රියාත්මක කිරීම පහසු කිරීම සඳහා රාජ්‍ය ආයතන තුළ සංවර්ධනය කරන ලද පුහුණුකරුවන් ගණන පුළුල් කිරීම. | කෙටිකාලීන දීර්ඝකාලීන | රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය | රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය<br><br>ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA) |
| 5 | අධ්‍යාපන අංශයේ දූෂණය අඩු කිරීම සඳහා පාසල් පරිපාලකයින් සඳහා විශේෂ දූෂණ විරෝධී පුහුණුවක් ක්‍රියාත්මක කිරීම. | 1. පුහුණුව සඳහා අවශ්‍ය වන සියලුම මෙවලම් සකසා නිම කිරීම.<br>2. පවත්වන ලද සැසි ගණන.<br>3. පුහුණු සහභාගීත්ව අනුපාතය අවම වශයෙන් 90%ක් වීම.<br>4. පුහුණු සම්පූර්ණ කිරීමේ අනුපාතය අවම වශයෙන් 95%ක් වීම.<br>5. පුහුණුවෙන් පසු දැනුම රැකගැනීමේ හැකියාව තක්සේරු කිරීම, සාමාන්‍ය වශයෙන් 80%ක සාධනීය ප්‍රතිඵලයක් නිරන්තරයෙන් පවත්වා ගෙන යාම. | කෙටිකාලීන මධ්‍යකාලීන | අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශ. | අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශ.<br><br>අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව |

| | | | | | |
|---|---|---|---|---|---|
| 6 | ව්‍යවස්ථාපිත මණ්ඩලවල සාමාජිකයින් සඳහා දැනුවත් කිරීමේ සහ පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම සහ, ඒ සමගම සේවා ස්ථානය තුළ පුහුණු අවස්ථා ද ලබා දීම. | 1. පුහුණුව සඳහා අවශ්‍ය වන සියලුම මෙවලම් සකසා නිම කිරීම.<br>2. පවත්වනු ලබන සැසි ගණන.<br>3. පුහුණු සහභාගීත්ව අනුපාතය අවම වශයෙන් 90%ක් වීම.<br>4. පුහුණු සම්පූර්ණ කිරීමේ අනුපාතය අවම වශයෙන් 95%ක් වීම.<br>5. දැනුම රඳවා ගැනීම සඳහා පුහුණුවෙන් පසු දැනුම් තක්සේරුව සාමාන්‍යයෙන් 80%ක් වීම. | කෙටිකාලීන<br>මධ්‍යකාලීන | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව |
| **උපඅරමුණ 3:** විනිවිදභාවය සහ යහපාලනය ප්‍රවර්ධනය කිරීමෙහි ලා සිවිල් සමාජය සහ පුරවැසියන්ගේ කාර්යභාරය ශක්තිමත් කිරීම මඟින් වගවීමේ වගකීම සඳහා මහජන උනන්දුව තීව්‍ර කිරීම. | | | | | |
| 1 | පුරවැසියන්ගේ අයිතිවාසිකම් සහ වගකීම් පිළිබඳව දැනුවත් කරමින්, දූෂණ විරෝධී නීති සහ වාර්තා කිරීමේ ක්‍රියා පටිපාටි පිළිබඳව අවබෝධයක් ලබා දීම සඳහා මහජන අධ්‍යාපන වැඩසටහන් දියත් කිරීම. | 1. අධ්‍යාපන වැඩසටහන් සැලසුම් කර දියත් කිරීම.<br>2. අධ්‍යාපන වැඩසටහන් මෙවලම් මඟින් ළඟා වූ පුරවැසියන් සංඛ්‍යාව, ප්‍රේක්ෂක විශ්ලේෂණ, සමාජ මාධ්‍ය ප්‍රතිචාර සහ බෙදාහැරීමේ වාර්තා මඟින් තීරණය කිරීම.<br>3. දූෂණ විරෝධී නීති සහ වාර්තා කිරීමේ ක්‍රියා පටිපාටි පිළිබඳ දැනුවත්භාවයේ අවම වශයෙන් 50%ක වැඩිවීමක ප්‍රතිඵලයක් සහිත ව්‍යාපාරයට පෙර සහ පසු සමීක්ෂණ පැවැත්වීම.<br>4. අධ්‍යාපන වැඩසටහන් පසු නිල මාර්ග හරහා ගොනු කරන ලද දූෂණ වාර්තා සංඛ්‍යාව වැඩි වීම.<br>5. රහස්‍ය තොරතුරු හෙළිදරව් කිරීමේ යාන්ත්‍රණයන් කෙරෙහි විශ්වාසය පළ කරන පුරවැසියන්ගේ ප්‍රතිශතය වැඩි කිරීම.<br>6. බලපෑම් තක්සේරුව සහ මහජන ඉල්ලුම මත පදනම්ව දියත් කරන ලද අඛණ්ඩ හෝ පසු විපරම් අධ්‍යාපන වැඩසටහන් ගණන.<br>7. රජයේ විනිවිදභාවය සහ දූෂණ විරෝධී ප්‍රයත්නයන් පිළිබඳ මහජන මතයේ වැඩිදියුණු වීම. | කෙටිකාලීන<br>දීර්ඝකාලීන | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2 | තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් (RTI) පනත පිළිබඳ මහජන දැනුවත්භාවය ඉහළ නැංවීම සඳහා, පුළුල් මාධ්‍ය හා ප්‍රචාරක වැඩසටහන් සංවර්ධනය කර ක්‍රියාත්මක කිරීම. එමෙන්ම, තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පනත පිළිබඳ නීතිය ඵලදායී ලෙස භාවිතා කරමින් තොරතුරු ලබා ගන්නේ කෙසේද යන්න පිළිබඳව මහජනයා සඳහා පුහුණු වැඩසටහන් ද සංවිධානය කිරීම. | 1. වැඩසටහන් සැලසුම් කර දියත් කිරීම.<br>2. අධ්‍යාපන වැඩසටහන් මෙවලම් මඟින් ළඟා වූ පුරවැසියන් සංඛ්‍යාව (ප්‍රේක්ෂක විශ්ලේෂණ, සමාජ මාධ්‍ය සම්බන්ධතා සහ බෙදාහැරීමේ වාර්තා) මඟින් මැනීම.<br>3. RTI පනත සහ තොරතුරු ලබා ගන්නේ කෙසේද යන්න පිළිබඳ දැනුවත්භාවයේ අවම වශයෙන් 50%ක වැඩිවීමක ප්‍රතිඵලයක් සහිත ව්‍යාපාරයට පෙර සහ පසු සමීක්ෂණ පැවැත්වීම.<br>4. RTI පනත භාවිතා කර තොරතුරු ලබා ගන්නේ කෙසේද යන්න පිළිබඳව සාමාන්‍ය මහජනතාව සඳහා පවත්වන ලද පුහුණු සැසි ගණන.<br>5. පුහුණුව ලබා මාස හයක් ඇතුළත සාර්ථකව RTI ඉල්ලීම් ඉදිරිපත් කරන පුහුණුව ලැබූ පුද්ගලයින්ගේ ප්‍රතිශතය.<br>6. අධ්‍යාපන වැඩසටහන්වලින් පසු මහජනයා විසින් ගොනු කරන ලද RTI ඉල්ලීම් සංඛ්‍යාවේ වැඩිවීම. | කෙටිකාලීන මධ්‍යකාලීන | තොරතුරු දැන ගැනීමේ කොමිෂන් සභාව (RTIC) | තොරතුරු දැන ගැනීමේ කොමිෂන් සභාව (RTIC) |

| | | | | | |
|---|---|---|---|---|---|
| 3 | දූෂණ විරෝධය, වැළැක්වීමේ යාන්ත්‍රණ සහ රාජ්‍ය සේවා වෙත ප්‍රවේශ වීම පිළිබඳව විවිධ තොරතුරු අඩංගු, ආබාධිත පුද්ගලයන්ට පහසුවෙන් තේරුම් ගත හැකි මාධ්‍ය ආකෘති (උදා: ගීත, සටන් පාඨ, ටෙලි නාට්‍ය, චිත්‍රපට, සමාජ මාධ්‍ය, පෝස්ටර්, අත් පත්‍රිකා, දැන්වීම් පුවරු සහ විද්‍යුත් දැන්වීම්) භාවිතා කරමින්, සකසා බෙදා හැරීම. | 1. විවිධ මාධ්‍ය මෙවලම් වර්ග නිර්මාණය කිරීම.<br>2. ප්‍රවේශ්‍යතා විශේෂාංග සමග නිර්මාණය කරන ලද මෙවලම්වල ප්‍රතිශතය.<br>3. ආබාධ සහිත පුද්ගලයින් විසින් සම-නිර්මාණය කරන ලද හෝ සමාලෝචනය කරන ලද මෙවලම් අවම වශයෙන් 50%ක් වීම.<br>4. සමානාත්මතාවය සහ පුළුල් ප්‍රවේශය සහතික කිරීම සඳහා මෙවලම් සංවර්ධනය කිරීමට විවිධ භාෂාවන් භවිත කිරීම.<br>5. විවිධ මාධ්‍ය ආකෘති හරහා ළඟා වූ මුළු ප්‍රේක්ෂක සංඛ්‍යාව.<br>6. දූෂණ විරෝධී අන්තර්ගතයට අදාළ ඩිජිටල් සහ සමාජ මාධ්‍ය වේදිකාවල අන්තර්ක්‍රියා ගණන.<br>7. රාජ්‍ය සේවා වෙත ප්‍රවේශ වීම පිළිබඳ දැනුවත්භාවයේ අවම වශයෙන් 40%ක වැඩිවීමක ප්‍රතිඵලයක් සහිත ව්‍යාපාරයට පෙර සහ පසු සමීක්ෂණ. | කෙටිකාලීන දීර්ඝකාලීන | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව |
| 4 | පුරවැසි ප්‍රඥප්තිය, ඔවුන්ගේ සේවා අයිතිවාසිකම්, රාජ්‍ය සේවා සඳහා ප්‍රවේශය සහ රාජ්‍ය නිලධාරීන්ගේ වගකීම් කෙරෙහි අවධානය යොමු කරමින් සාමාන්‍ය මහජනතාව සඳහා වැඩමුළු පැවැත්වීම. | 1. පවත්වන ලද වැඩමුළු ගණන.<br>2. වැඩමුළුවලට සහභාගී වූ මුළු සහභාගි වන්නන් ගණන.<br>3. වැඩමුළුවට සහභාගී වූවන්ගේ, සේවා සඳහා වන අයිතිවාසිකම් සහ රාජ්‍ය නිලධාරීන්ගේ වගකීම් පිළිබඳ දැනුම අවම වශයෙන් 40%කින් වර්ධනය වී ඇති බව තහවුරු කර ගැනීම සඳහා, වැඩමුළුවට පෙර සහ පසු සමීක්ෂණ පැවැත්වීම. | කෙටිකාලීන මධ්‍යකාලීන | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය.<br><br>අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව |

| | | | | | |
|---|---|---|---|---|---|
| 5 | විනිවිදභාවය සහ යහපාලනය සඳහා උපදේශකයින් ලෙස ඔවුන් සවිබල ගැන්වීම සඳහා සිවිල් සමාජ නියෝජිතයින් සඳහා වැඩමුළු සංවිධානය කිරීම. | 1. පවත්වන ලද වැඩමුළු ගණන.<br>2. පුහුණුව ලැබූ සිවිල් සමාජ නියෝජිතයින්ගේ මුළු සංඛ්‍යාව.<br>3. විනිවිදභාවය, යහපාලනය සහ දූෂණ විරෝධී රාමු පිළිබඳ ඔවුන්ගේ දැනුමේ අවම වශයෙන් 40%ක වැඩිවීමක ප්‍රතිඵලයක් සහිත වැඩමුළුවට පෙර සහ පසු සමීක්ෂණ.<br>4. වැඩමුළුවට සහභාගී වී මාස හයක් ඇතුළත උපදේශන ව්‍යාපාරවල හෝ දැනුවත් කිරීමේ ක්‍රියාකාරකම්වල නිරත වන සහභාගිවන්නන්ගේ ප්‍රතිශතය. | කෙටිකාලීන මධ්‍යකාලීන | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව |
| 6 | දූෂණය සහ මූලික මානව හිමිකම් සහ නිදහස උල්ලංඝනය කිරීම අතර සම්බන්ධතාවය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා තොරතුරු මෙවලම් සකස් කර දැනුවත් කිරීමේ වැඩසටහන් පැවත්වීම. | 1. නිෂ්පාදනය කරන ලද විවිධ මෙවලම් වර්ග ගණන.<br>2. පවත්වන ලද වැඩමුළු/දැනුවත් කිරීමේ සැසි ගණන.<br>3. පුහුණුව ලැබූ පුද්ගලයින්ගේ මුළු සංඛ්‍යාව.<br>4. විවිධ මාධ්‍ය ආකෘති හරහා ළඟා වූ මුළු ප්‍රේක්ෂක සංඛ්‍යාව.<br>5. වැඩසටහන් මඟින්, දූෂණය සහ මූලික මානව හිමිකම් හා නිදහස කඩවීම් අතර සම්බන්ධය අවබෝධ කර ගැනීම අවම වශයෙන් 40%කින් වැඩි වී ඇති බවට තහවුරු කරගැනීම සඳහා, වැඩසටහනට පෙර සහ පසු සමීක්ෂණ සිදු කිරීම . | කෙටිකාලීන මධ්‍යකාලීන | ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව (HRCSL) | ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව (HRCSL)<br><br>අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව |

| | | | | | |
|---|---|---|---|---|---|
| **උපඅරමුණ 4:** අඛණ්ඩතා සංස්කෘතියක් පෝෂණය කිරීම සහ සමාජය තුළ සදාචාරාත්මක ප්‍රමිතීන් ප්‍රවර්ධනය කිරීම සඳහා මාධ්‍යයේ භූමිකාව ශක්තිමත් කිරීම. | | | | | |
| 1 | දූෂණ විරෝධී වැඩසටහන් පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සහ සදාචාරාත්මක ප්‍රමිති ප්‍රවර්ධනය කිරීම සඳහා, ඉලක්කගත මහජන මාධ්‍ය ව්‍යාපාර දියත් කිරීම පිණිස සමාජ මාධ්‍ය සහ අනෙකුත් මාධ්‍ය භාවිතා කිරීම. | 1. වැඩසටහන් සැලසුම් කර දියත් කර ඇත.<br>2. වැඩසටහන් මෙවලම් හරහා ළඟා වූ පුරවැසියන් සංඛ්‍යාව, ප්‍රේක්ෂක විශ්ලේෂණ, සමාජ මාධ්‍ය ප්‍රතිචාර සහ බෙදාහැරීමේ වාර්තා ඇසුරෙන් තීරණය කිරීම.<br>3. දූෂණ විරෝධී වැඩසටහන් මඟින් දියත් කළ ප්‍රයත්නයන්හි ප්‍රතිඵලයක් ලෙස, දූෂණ විරෝධී වැඩසටහන් පිළිබඳ දැනුවත්භාවය අවම වශයෙන් 50%කින් වර්ධනය වී ඇති බව තහවුරු කර ගැනීම සඳහා, වැඩසටහට පෙර සහ පසු සමීක්ෂණ සිදු කිරීම.<br>4. වැඩසටහනන් පසු නිල නාලිකා හරහා ගොනු කරන ලද දූෂණ වාර්තා සංඛ්‍යාව වැඩි වීම.<br>5. රජයේ විනිවිදභාවය සහ දූෂණ විරෝධී ප්‍රයත්නයන් පිළිබඳ මහජන මතයේ වැඩිදියුණු වීම. | කෙටිකාලීන<br>මධ්‍යකාලීන | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව<br><br>රාජ්‍ය සහ පෞද්ගලික මාධ්‍ය ආයතන. |
| 2 | ශ්‍රී ලංකා මාධ්‍ය ආයතනය හරහා, දූෂණ විරෝධී වාර්තාකරණය සහ ගවේෂණාත්මක මාධ්‍ය වාර්තාකරණ ශිල්පීය ක්‍රම කෙරෙහි අවධානය යොමු කරමින් මාධ්‍ය සංවිධාන සහ මාධ්‍යවේදීන් සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම. | 1. සකසන ලද පුහුණු මොඩියුල ගණන.<br>2. පවත්වන ලද වැඩමුළු ගණන.<br>3. පුහුණුව ලැබූ මාධ්‍යවේදීන්ගේ මුළු සංඛ්‍යාව.<br>4. වැඩමුළුව මඟින්, දූෂණ විරෝධී වාර්තාකරණය සහ ගවේෂණාත්මක මාධ්‍ය වාර්තාකරණ ශිල්පීය ක්‍රම පිළිබඳ දැනුම අවම වශයෙන් 40%කින් වැඩි වූ බව තහවුරු කර ගැනීම සඳහා, වැඩමුළුවට පෙර සහ පසු සමීක්ෂණ සිදු කිරීම.<br>5. පුහුණුවෙන් මාස හයක් ඇතුළත පුහුණුව ලැබූ මාධ්‍යවේදීන් විසින් නිෂ්පාදනය කරන ලද විමර්ශන වාර්තා හෝ ලිපි ගණන.<br>6. පුහුණුවෙන් වසරකට පසු දූෂණ විරෝධී වාර්තාකරණයේ නිරතව සිටින පුහුණුව ලැබූ මාධ්‍යවේදීන්ගේ ප්‍රතිශතය. | මධ්‍යකාලීන | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව<br><br>ජනමාධ්‍ය අමාත්‍යාංශය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| 3 | පුවත්පත්, රූපවාහිනී නාලිකා සහ සබැඳි වේදිකා ඇතුළු ප්‍රධාන මාධ්‍ය හවුල්කරුවන් හඳුනාගෙන, අවබෝධතා ගිවිසුම් (MOUs) අත්සන් කිරීමෙන් දූෂණ විරෝධී මුලපිරීම් පිළිබඳ සහයෝගීතා විධිමත් කිරීම. | 1. දූෂණ විරෝධී මුලපිරීම් පිළිබඳ සහයෝගීතාව සහ සාකච්ඡා සඳහා හඳුනාගත් ප්‍රධාන මාධ්‍ය සංවිධාන ගණන.<br>2. දූෂණ විරෝධී මුලපිරීම් සඳහා මාධ්‍ය සංවිධාන සමඟ අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම් ගණන.<br>3. අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීමෙන් පසු ආරම්භ කරන ලද සහයෝගීතා මාධ්‍ය ව්‍යාපාර ගණන.<br>4. මුද්‍රිත, රූපවාහිනී සහ මාර්ගගත මාර්ග ඔස්සේ දූෂණ විරෝධී ගැටලු පිළිබඳ මාධ්‍ය ආවරණය වැඩි කිරීම.<br>5. දූෂණ විරෝධී තේමා ඔවුන්ගේ කතුවැකි අන්තර්ගතයට හෝ වැඩසටහන්කරණයට ඒකාබද්ධ කරන මාධ්‍ය හවුල්කරුවන්ගේ ප්‍රතිශතය.<br>6. දූෂණ විරෝධී වැඩසටහන් පිළිබඳ මහජන දැනුම අවම වශයෙන් 40%කින් වැඩි වූ බව තහවුරු කර ගැනීම සඳහා, මාධ්‍ය ආවරණයට පෙර සහ පසු සමීක්ෂණ සිදු කිරීම. | මධ්‍යකාලීන | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | ජනමාධ්‍ය අමාත්‍යාංශය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| **උපඅරමුණ 5:** වටිනාකම් පදනම් කරගත් අධ්‍යාපන මූලපිරීම් හරහා අඛණ්ඩතා සමාජයක් ස්ථාපිත කිරීම සඳහා පෞද්ගලික අංශය සම්බන්ධ කර ගැනීම. | | | | | |
| 1 | පෞද්ගලික අංශය සඳහා ඉලක්කගත දැනුවත් කිරීමේ වැඩසටහන් සංවර්ධනය කර ක්‍රියාත්මක කිරීම. | 1. දැනුවත් කිරීමේ මෙවලම්/වැඩසටහන් ගණන.<br>2. පවත්වන ලද වැඩමුළු/දැනුවත් කිරීමේ සැසි ගණන.<br>3. පුහුණුව ලැබූ පුද්ගලයින්ගේ මුළු සංඛ්‍යාව.<br>4. වැඩමුළුවට සහභාගී වූවන්ගේ දැනුම අවම වශයෙන් 50%කින් වර්ධනය වූ බව තහවුරු කරගැනීම සඳහා, වැඩමුළුවට පෙර සහ පසු සමීක්ෂණ සිදු කිරීම.<br>5. දැනුවත් කිරීමේ කටයුතු හේතුවෙන් දූෂණ විරෝධී ප්‍රතිපත්ති අනුගමනය කරන සමාගම් ගණන. | කෙටිකාලීන මධ්‍යකාලීන | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව |
| 2 | ක්‍රීඩා අංශය සඳහා නව වැරදි පිළිබඳ ඉලක්කගත දැනුවත් කිරීමේ වැඩසටහන් සංවර්ධනය කර ක්‍රියාත්මක කිරීම. | 1. දැනුවත් කිරීමේ මෙවලම්/වැඩසටහන් ගණන.<br>පවත්වන ලද වැඩමුළු/දැනුවත් කිරීමේ සැසි ගණන.<br>2. පුහුණුව ලැබූ පුද්ගලයින්ගේ මුළු සංඛ්‍යාව.<br>3. වැඩමුළුවට සහභාගී වූවන්ගේ දැනුම අවම වශයෙන් 50%කින් වර්ධනය වූ බව තහවුරු කරගැනීම සඳහා, වැඩමුළුවට පෙර සහ පසු සමීක්ෂණ සිදු කිරීම.<br>4. ක්‍රීඩා සංවිධාන ඔවුන්ගේ පුහුණු වැඩසටහන්වලට දූෂණ විරෝධී දැනුවත්කිරීම් ඒකාබද්ධ කිරීම | ’ | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව |

| | | | | | |
|---|---|---|---|---|---|
| 3 | සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව (SEC), ආනයන හා අපනයන දෙපාර්තමේන්තුව, ආයෝජන මණ්ඩලය (BOI) වැනි නියාමන අධිකාරීන්ගේ නියාමනයට යටත් වන අය සඳහා දූෂණ ක්‍රියා යනු මොනවාද යන්න පිළිබඳව දැනුවත් කිරීම සඳහා දැනුවත් කිරීමේ සැසි සංවිධානය කිරීම | 1. දැනුවත් කිරීමේ මෙවලම්/වැඩසටහන් ගණන.<br>2. සැසි සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකාරීව සහයෝගයෙන් කටයුතු කරන නියාමන අධිකාරීන් ගණන.<br>3. පවත්වන ලද වැඩමුළු/දැනුවත් කිරීමේ සැසි ගණන.<br>4. පුහුණුව ලැබූ පුද්ගලයින්ගේ මුළු සංඛ්‍යාව.<br>5. දැනුමේ අවම වශයෙන් 40%ක වැඩිවීමක ප්‍රතිඵලයක් සහිත සැසියට පෙර සහ පසු සමීක්ෂණ.<br>6. සහභාගී වීමෙන් පසු අභ්‍යන්තර අනුකූලතා යාන්ත්‍රණ ක්‍රියාත්මක කරන නියාමනයට යටත් වන අය ගණන.<br>7. පුහුණුවෙන් පසු නියාමන අධිකාරීන් වෙත ඉදිරිපත් කරන ලද දූෂණ සම්බන්ධ විමසීම් හෝ වාර්තාවල වැඩිවීම. | කෙටිකාලීන මධ්‍යකාලීන | සියලුම නියාමන අධිකාරීන්. | සියලුම නියාමන අධිකාරීන්.<br><br>අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව |

| | | | | | |
|---|---|---|---|---|---|
| 4 | ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනතේ, 1995 අංක 15 දරණ පනතේ 5 වන වගන්තියෙහි දක්වා ඇති ව්‍යවසායකයන් සහ පෞද්ගලික අංශයේ අනෙකුත් සංවිධාන, වාණිජ මණ්ඩල, දූෂණ වැළැක්වීම සහ සදාචාරාත්මක භාවිතයන් පෞද්ගලික අංශය තුළ ප්‍රවර්ධනය කිරීම සඳහා, භූමිකා, වගකීම් සහ සහයෝගීතා වැඩසටහන් විස්තර කරමින් අවබෝධතා ගිවිසුම් (MOUs) අත්සන් කිරීම මඟින් ප්‍රතිපත්තිගරුක හවුල්කරුවන් ලෙස නිල වශයෙන් නම් කිරීම. | 1. අඛණ්ඩතා හවුල්කාරිත්වයන් පිළිබඳ සහයෝගීතාව සහ සාකච්ඡා සඳහා හඳුනාගත් ආයතන ගණන.<br>2. දූෂණ විරෝධී වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා මෙම ආයතන සමඟ ඇති කරගනු ලබන අවබෝධතා ගිවිසුම් (MOUs) ගණන.<br>3. අවබෝධතා ගිවිසුම් (MOUs) අත්සන් කිරීමෙන් අනතුරුව, ආයතනික ප්‍රතිපත්තිගරුකභාවය, විනිවිදභාවය සහ දූෂණ විරෝධී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා දියත් කළ ඒකාබද්ධ වැඩසටහන් ගණන.<br>4. හවුල්කාරිත්ව ව්‍යවසායකයන් ඔවුන්ගේ ආයතනික පාලන රාමු තුළට දූෂණ විරෝධී ප්‍රතිපත්ති ඒකාබද්ධ කරන ප්‍රතිශතය.<br>5. අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් වැඩි දියුණු කිරීම සහ දූෂණයට අදාළ අවදානම් අවම කිරීම පිළිබඳව වාර්තා කරන ප්‍රතිපත්තිගරුක හවුල්කරුවන්ගේ ප්‍රතිශතය. | කෙටිකාලීන<br>මධ්‍යකාලීන | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව<br><br>ජනාධිපති ලේකම් කාර්යාලය. |
| **උප අරමුණ 06:** දූෂණ විරෝධී ක්ෂේත්‍රයෙහි නිරත වීම වැඩි දියුණු කිරීම සඳහා, වටිනාකම් පදනම් කරගත් අධ්‍යාපනික වැඩසටහන් මඟින් තේරී පත් වූ නියෝජිතයින් අතර දැනුවත්භාවය ප්‍රවර්ධනය කිරීම | | | | | |
| 1 | පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ පාර්ලිමේන්තු අධීක්ෂණ කමිටු සාමාජිකයින් සඳහා නීතිමය විධිවිධාන, ගෝලීය මනා භාවිතාවන් සහ දූෂණ විරෝධයට අදාළ ඔවුන්ගේ රාජකාරි කෙරෙහි අවධානය යොමු කරමින්, හඳුන්වාදීමේ සහ වරින් වර දැනුවත් කිරීමේ වැඩමුළු සංවිධානය කිරීම. | 1. ප්‍රමිතිගත වැඩමුළු මෙවලම් සකස් කිරීම.<br>2. පවත්වන ලද පුහුණු සැසි ගණන.<br>3. පුහුණු සහභාගීත්ව අනුපාතය අවම වශයෙන් 90%ක් වීම<br>4. පුහුණුව සම්පූර්ණ කිරීමේ අනුපාතය අවම වශයෙන් 95%ක් වීම<br>5. ක්‍රියාකාරී සහ මූලික අංශ පිළිබඳ දැනුම රඳවා ගැනීම සහ අවබෝධය පිළිබඳ පුහුණුවෙන් පසු දැනුම තක්සේරුව සාමාන්‍යයෙන් 80%ක් වීම. | කෙටිකාලීන<br>මධ්‍යකාලීන | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | පාර්ලිමේන්තුව.<br><br>අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2 | පළාත් සභා සහ පළාත් පාලන තේරී පත් වූ නියෝජිතයන් සඳහා නීතිමය විධිවිධාන, ගෝලීය මනා භාවිතාවන් සහ දූෂණයට එරෙහිව සටන් කිරීමේ ඔවුන්ගේ වගකීම් ආවරණය කරමින්, හඳුන්වාදීමේ සහ වරින් වර දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම. | 1. ප්‍රමිතිගත වැඩමුළු මෙවලම් සකස් කිරීම.<br>2. පවත්වන ලද පුහුණු සැසි ගණන.<br>3. පුහුණු සහභාගීත්ව අනුපාතය අවම වශයෙන් 90%ක් වීම.<br>4 පුහුණුව සම්පූර්ණ කිරීමේ අනුපාතය අවම වශයෙන් 95%ක් වීම.<br>5. ක්‍රියාකාරී සහ මූලික අංශ පිළිබඳ දැනුම රඳවා ගැනීම සහ අවබෝධය පිළිබඳ පුහුණුවෙන් පසු දැනුම තක්සේරුව සාමාන්‍යයෙන් 80%ක් වීම | කෙටිකාලීන මධ්‍යකාලීන | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | සියලුම පළාත් සභා සහ පළාත් පාලන අධිකාරීන්<br>ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනය (SLILG)<br>අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව |
| යෝජනාව 7: අපරාධ නඩු විභාග ක්‍රියාවලියට සම්බන්ධ පාර්ශ්වකරුවන්ගේ අවබෝධය වැඩි දියුණු කිරීම. | | | | | |
| 1 | අදාළ නඩු විභාග කිරීමේ ඔවුන්ගේ අවබෝධය සහ හැකියාව වැඩි දියුණු කිරීම සඳහා නවතම ජාත්‍යන්තර සහ දූෂණ විරෝධී ජාතික නීති, භාවිතයන් සහ ප්‍රවණතා පිළිබඳ ඔවුන්ගේ දැනුම යාවත්කාලීන කිරීම සඳහා විනිසුරුවරුන් සඳහා හඳුන්වාදීමේ සහ වරින් වර ප්‍රබෝධමත් පුහුණු සැසි ක්‍රියාත්මක කිරීම. | 1. ප්‍රමිතිගත වැඩමුළු මෙවලම් සකස් කිරීම.<br>2. පවත්වන ලද පුහුණු සැසි ගණන.<br>3. පුහුණු සහභාගීත්ව අනුපාතය අවම වශයෙන් 90%ක් වීම.<br>4 පුහුණුව සම්පූර්ණ කිරීමේ අනුපාතය අවම වශයෙන් 95%ක් වීම.<br>5. පුහුණුවෙන් පසු දැනුම රඳවා ගැනීම සහ මෙහෙයුම්මය හා විෂයානුබද්ධ අංශ පිළිබඳ අවබෝධය සඳහා සිදුකරන තක්සේරුවේ සාමාන්‍ය ලකුණු 80%ක් වීම.<br>6. පුහුණුවෙන් පසු, දූෂණ නඩු කටයුතු සම්බන්ධයෙන් ඉහළ විශ්වාසයක් පළ කරන විනිසුරුවරුන්ගේ ප්‍රතිශතය තක්සේරු කිරීම.<br>7. පුහුණුවේ දී ඉගෙන ගත් වැඩිදියුණු කළ නඩු කළමනාකරණ ශිල්පීය ක්‍රම හේතුවෙන් දූෂණයට අදාළ නඩු ප්‍රමාදයන් අඩු වීම. | කෙටිකාලීන මධ්‍යකාලීන | අධිකරණ සේවා කොමිෂන් සභාව (JSC)<br>විනිසුරු ආයතනය. | අධිකරණ සේවා කොමිෂන් සභාව (JSC)<br>විනිසුරු ආයතනය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2 | වගවීම පිළිබඳ සංස්කෘතියක් පෝෂණය කිරීම සඳහා අධිකරණ ක්ෂේත්‍රය තුළ සුපිළිපන්න බවට අදාළ අත්දැකීම් සහ මනා භාවිතාවන් බෙදා ගැනීම අරමුණු කරගත් සැසි පැවැත්වීම. | 1. පවත්වන ලද පුහුණු සැසි ගණන.<br>2. පුහුණු සහභාගීත්ව අනුපාතය අවම වශයෙන් 90%ක් වීම.<br>3. ක්‍රියාකාරී සහ මූලික අංශ පිළිබඳ දැනුම රඳවා ගැනීම සහ අවබෝධය පිළිබඳ පුහුණුවෙන් පසු දැනුම තක්සේරුව සාමාන්‍යයෙන් 80%ක් වීම.<br>4. නිත්‍ය අධිකරණ අධ්‍යාපන වැඩසටහන්වලට ඇතුළත් සැසි ගණන. | කෙටිකාලීන මධ්‍යකාලීන | අධිකරණ සේවා කොමිෂන් සභාව (JSC)<br><br>විනිසුරු ආයතනය. | අධිකරණ සේවා කොමිෂන් සභාව (JSC)<br><br>විනිසුරු ආයතනය. |
| 3 | පොලිස් බලකාය තුළ දූෂණය අඩු කිරීම සඳහා පොලිස් නිලධාරීන් සඳහා විශේෂ දූෂණ විරෝධී පුහුණුවක් ක්‍රියාත්මක කිරීම. | 1. ප්‍රමිතිගත වැඩමුළු මෙවලම් සකස් කිරීම.<br>2. පවත්වන ලද පුහුණු සැසි ගණන.<br>3. පුහුණු සහභාගීත්ව අනුපාතය අවම වශයෙන් 90%ක් වීම.<br>4. පුහුණුව සම්පූර්ණ කිරීමේ අනුපාතය අවම වශයෙන් 95%ක් වීම.<br>5. ක්‍රියාකාරී සහ මූලික අංශ පිළිබඳ දැනුම රඳවා ගැනීම සහ අවබෝධය පිළිබඳ පුහුණුවෙන් පසු දැනුම තක්සේරුව සාමාන්‍යයෙන් 80%ක් වීම.<br>6. පොලිස් ඇකඩමි විෂයමාලාවලට ඇතුළත් කරන ලද පුහුණු මොඩියුල ගණන.<br>7. වසරින් වසර දූෂණ සිදුවීම් අඩුවීම. | කෙටිකාලීන | ශ්‍රී ලංකා පොලීසිය. | ශ්‍රී ලංකා පොලීසිය.<br><br>අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව |

| යෝජනාව 8: දූෂණයේ හේතු, බලපෑම් සහ රටා විශ්ලේෂණය කරන පුළුල් පර්යේෂණ මුලපිරීම් හරහා රට තුළ දූෂණය පිළිබඳ අවබෝධය වැඩි දියුණු කිරීම. | | | | | |
|---|---|---|---|---|---|
| 1 | අනුමත ක්‍රමවේදයක් භාවිතා කරමින් ශ්‍රී ලංකාවේ දූෂණය පිළිබඳ ප්‍රමිතිගත වාර්ෂික සමීක්ෂණයක් පවත්වා එහි ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීම. | 1. ප්‍රමිතිගත සමීක්ෂණ ක්‍රමවේදයක් සංවර්ධනය කර අනුමත කරගනී.<br>2. ප්‍රධාන ජන විකාශන සහ අංශ නියෝජනය සහතික කරමින් වාර්ෂිකව සමීක්ෂණය කරන ලද ප්‍රතිචාර දැක්වූවන් ගණන.<br>3. සමීක්ෂණයේ භූගෝලීය ආවරණය.<br>4. නියමිත කාල රාමුව තුළ දත්ත විශ්ලේෂණය සම්පූර්ණ කිරීම.<br>5. ප්‍රධාන දූෂණ ප්‍රවණතා සහ සොයා ගැනීම් හඳුනාගෙන වාර්තා කරන ලද ගණන.<br>6. වාර්ෂිකව ප්‍රකාශයට පත් කරන ලද සමීක්ෂණ සොයාගැනීම්.<br>7. සමීක්ෂණ ප්‍රතිඵල හේතුවෙන් සිදු වූ ප්‍රතිපත්තිමය වෙනස්කම් හෝ දූෂණ විරෝධී වැඩසටහන් ගණන. | කෙටිකාලීන දීර්ඝකාලීන | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව |
| 2 | විරෝධී දූෂණ ප්‍රයත්නයන් කෙරෙහි අවධානය යොමු කළ ගුණාත්මක පර්යේෂණ සිදු කර ප්‍රකාශයට පත් කර එහි ප්‍රතිඵලයක් ලෙස ලැබෙන නිර්දේශ පිළිබඳ පසු විපරම් සහතික කිරීම. | 1. අවම වශයෙන් 90% පර්යේෂණ සම්පූර්ණ කිරීම<br>2. පර්යේෂණ සොයාගැනීම්වල ගුණාත්මකභාවය සහ අදාළත්වය.<br>3. පර්යේෂණ සොයාගැනීම් ප්‍රකාශයට පත් කර බෙදා හැරීම.<br>4. සිදු කරන ලද පර්යේෂණ සහ සකසන ලද නව දූෂණ විරෝධී ප්‍රතිපත්ති අතර ධනාත්මක සහසම්බන්ධය. | මධ්‍යකාලීන දීර්ඝකාලීන | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව |

| | | | | | |
|---|---|---|---|---|---|
| 3 | අධ්‍යයන හා අනෙකුත් පර්යේෂණ ආයතන විසින් සිදුකරන ස්වාධීන දූෂණ සම්බන්ධ අධ්‍යයනයන් සඳහා පර්යේෂණ ප්‍රදාන නිර්මාණය කර එවැනි අධ්‍යයනයන්හි සොයා ගැනීම් සහ නිර්දේශ දූෂණ විරෝධී උපාය මාර්ග සංවර්ධනය කිරීමේ දී හෝ පිරිපහදු කිරීමේ දී භාවිතා කිරීම. | 1. පිරිනමන ලද පර්යේෂණ ප්‍රදාන ගණන.<br>2. පර්යේෂණ ව්‍යාපෘතිවලින් අවම වශයෙන් 80%ක් විවිධ සහ තීරණාත්මක දූෂණ අංශ කෙරෙහි අවධානය යොමු කරයි.<br>3. පැහැදිලි අරමුණු සහ ශක්‍ය ක්‍රමවේදයන් සහිත ප්‍රධාන දූෂණ විරෝධී ගැටලු ආමන්ත්‍රණය කරමින් අවම වශයෙන් 90%ක පර්යේෂණ යෝජනා උසස් තත්ත්වයේ පැවතීම.<br>4. පිරිනමන ලද පර්යේෂණ ව්‍යාපෘතිවලින් අවම වශයෙන් 90%ක් එකඟ වූ කාල රාමුව තුළ සම්පූර්ණ කිරීම.<br>5. පර්යේෂණ සොයාගැනීම්වලින් අවම වශයෙන් 50%ක් දූෂණ විරෝධී ප්‍රයත්නයන්හි සැලකිය යුතු ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටි වෙනස්කම් සඳහා දායක වීම. | මධ්‍යකාලීන දීර්ඝකාලීන | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව |



හොට සහ ගෙල - තීක්ෂණභාවය

# ඇ. ආයතනික ශක්තිමත් කිරීම සහ ක්‍රියාත්මක කිරීම

## ඇ. ආයතනික ශක්තිමත් කිරීම සහ ක්‍රියාත්මක කිරීම

### තෙවන උපාය මාර්ගික ප්‍රමුඛතා ක්ෂේත්‍රය: ආයතනික ශක්තිමත් කිරීම සහ ක්‍රියාත්මක කිරීම

**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සහ අනෙකුත් නීතිය ක්‍රියාත්මක කරන ආයතන ශක්තිමත් කිරීම.**

දූෂණයට එරෙහිව සටන් කිරීමෙහි ලා, දූෂණ ක්‍රියාවන් විමර්ශනය කිරීමට, නඩු පැවරීමට හා දූෂණය අධෛර්යමත් කිරීමට හැකි, ශක්තිමත්, දක්ෂ හා ස්වාධීන නීතිය ක්‍රියාත්මක කරන ආයතන තිබීම අත්‍යවශ්‍යය. මෙම ආයතන ශක්තිමත් කිරීම දූෂිත පුද්ගලයන් නීතියේ රැහැනට හසුකර ගැනීමට පමණක් නො ව, වගවීම, විනිවිදභාවය හා අවංකභාවය පිළිබඳ සංස්කෘතියක් ගොඩනැගීමට ද අත්‍යවශ්‍ය වේ. ඵලදායී ලෙස නීතිය ක්‍රියාත්මක කිරීම, දූෂණය අධෛර්යමත් කරවන අතර, එය පුද්ගලයන් හා ආයතන දූෂණයේ නිරත වීමෙන් වළක්වයි. නීතිය ක්‍රියාත්මක කරන ආයතන ශක්තිමත්, ප්‍රමාණවත් සම්පත් සහිත හා විනිවිදභාවයකින් යුක්ත වන විට, ඒවා සාධාරණ, වගවීමෙන් යුතු හා දූෂණයෙන් තොර සමාජයක් බිහිකිරීමේ සටනේ දී අත්‍යවශ්‍ය මෙවලම් බවට පත්වනු ඇත.

දූෂණයට අදාළ කරුණු විමර්ශනය කිරීම සහ නඩු පැවරීම බොහෝ විට සංකීර්ණ වන අතර මූල්‍ය අපරාධ, ව්‍යාපාරික ගිණුම්කරණය, මුදල් විශුද්ධිකරණය, වත්කම් නැවත ලබාගැනීම සහ දූෂිත ජාලයන්හි සංකීර්ණ ක්‍රියාකාරීත්වය වැනි ක්ෂේත්‍ර ගණනාවක විශේෂිත දැනුම හා ප්‍රවීණත්වය අවශ්‍ය වේ. ඒ අනුව, නීතිය ක්‍රියාත්මක කරන ආයතන ශක්තිමත් කිරීමේ දී, විමර්ශකයින්ට සවිස්තරාත්මක විමර්ශන සිදුකිරීම සඳහා අවශ්‍ය විශේෂඥ දැනුම, මෙවලම් සහ සම්පත්වලින් මැනවින් පුහුණු කර තිබිය යුතු ය. නවීන තාක්ෂණය, දත්ත විශ්ලේෂණ මෙවලම් සහ ජාත්‍යන්තර සහයෝගීතාව සඳහා ආයෝජනය කිරීම ද අත්‍යවශ්‍ය වේ. දූෂණ ක්‍රියාවලට සම්බන්ධ විය හැකි දේශපාලන බලවතුන්ගේ හෝ බලවත් පුද්ගලයන්ගේ බලපෑමට නීතිය ක්‍රියාත්මක කරන ආයතන නතු විය හැකි බැවින්, එම ආයතන ස්වාධීනව හා බාහිර බලපෑම්වලින් තොරව කටයුතු කිරීම සහතික කිරීම නීතිය ක්‍රියාත්මක කිරීම ශක්තිමත් කිරීමෙහි ලා තවත් අංගයකි. මෙම ස්වාධීනත්වය ඉතා වැදගත් වන්නේ එය විමර්ශකයින්ට සහ නඩු පවරන්නන්ට පළිගැනීම් හෝ දේශපාලන ප්‍රතිවිපාකවලට බියෙන් තොරව දූෂණ නඩු විභාග කිරීමට ඉඩ සලසන බැවිනි. නීතිය ක්‍රියාත්මක කරන ආයතන දේශපාලනමය ඇඟිලි ගැසීම්වලින් ස්වාධීනව කටයුතු කරන විට, ප්‍රතිවිපාක පිළිබඳ බියකින් තොරව ඉහළ පෙළේ විමර්ශන සිදු කළ හැකි ය. එමෙන්ම, දූෂණ විරෝධී කොමිෂන් සභා, ජාතික පොලිස් බලකාය හෝ අධිකරණ වැනි ආයතනවල ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා වන නීතිමය ප්‍රතිසංස්කරණ, එම ආයතනවල අපක්ෂපාතීව කටයුතු කිරීමේ හැකියාව කෙරෙහි විශ්වාසය ඇති කිරීමට අත්‍යවශ්‍ය වේ. (මෙම කරුණ උපාය මාර්ගික ප්‍රමුඛතා අංක හතර යටතේ සාකච්ඡා කෙරේ.)

නීතිමය ආරක්ෂාවලට අමතරව, විනිවිදභාවයෙන් යුත් නායකත්ව තෝරාගැනීම, වගවීමේ ක්‍රමවේදයන් සහ කාර්ය සාධන ඇගයීම් වැනි ක්‍රමවේදයන් තුළින් නීතිය ක්‍රියාත්මක කරන ආයතනවල අභ්‍යන්තර ව්‍යුහයන් ශක්තිමත් කිරීම, ඔවුන්ගේ මෙහෙයුම් යුක්තිය සහ දූෂණ මර්දන ක්‍රියා මාර්ග කෙරෙහි අවධානය යොමු කිරීමට උපකාරී වේ. මෙය එම ආයතනවල විශ්වසනීයත්වය සහ යුක්තිය ඉටුකිරීමේ හැකියාව පිළිබඳ මහජන විශ්වාසය වැඩි දියුණු කරනු ඇත. නීතිය ක්‍රියාත්මක කිරීමේ මෙහෙයුම්වල නිතිපතා විගණන, නඩු පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සහ ස්වාධීන අධීක්ෂණය වැනි විනිවිදභාවයෙන් යුත් ක්‍රියාවලීන් සහ වගවීමේ යාන්ත්‍රණයන් මඟින්, මහජනතාවගේ විශ්වාසය ගොඩනැගීමටත්, සුපිළිපන්න බවින් යුත් සංස්කෘතියක් ඇති කිරීමටත් උපකාරී වේ. තවද, නඩු කඩිනමින් හා ඵලදායී ලෙස හැසිරවීම සහතික කිරීම සඳහා අපරාධ යුක්ති පද්ධතිය තුළ නීතිය ක්‍රියාත්මක කරන ආයතන අතර අන්තර් ආයතනික සම්බන්ධීකරණය වැඩිදියුණු කිරීම අත්‍යවශ්‍ය වේ. මෙමඟින් නඩු පැවරීමේ දුෂ්කරතා මැඩපැවැත්විය හැකි පරිදි ශක්තිමත් නඩු ගොඩනැගීමේ මෙවලම් සැපයීම, සාක්ෂිකරුවන්, තොරතුරු ලබා දෙන්නන් සහ නඩුවට සම්බන්ධ වූවන් සඳහා ප්‍රමාණවත් ආරක්ෂාව සැපයීම ද සිදු කෙරේ. නීතිය ක්‍රියාත්මක කරන ආයතනවලට ජාත්‍යන්තර පාර්ශ්වකරුවන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට හැකිවන පරිදි ධාරිතා සංවර්ධන වැඩසටහන් සඳහා ආයෝජනය කිරීමෙන්, ගෝලීය වශයෙන් දූෂණයට එරෙහිව සටන් කිරීමේ හැකියාව සැලකිය යුතු ලෙස ඉහළ නංවනු ඇත. පුහුණු වැඩසටහන්, තොරතුරු බෙදා ගැනීම සහ ඒකාබද්ධ මෙහෙයුම් හරහා, නීතිය ක්‍රියාත්මක කරන ආයතනවලට ජාතික දේශසීමා ඉක්මවා ක්‍රියාත්මක වන දූෂණය ආමන්ත්‍රණය කළ හැකි අතර දූෂිත ක්‍රියාකාරීන් ඔවුන් සිටින ස්ථානය කුමක් වුවත් ඔවුන් වගකිව යුතු බව සහතික කළ හැකි ය.

ඉහත පසුබිම යටතේ, දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සහ අනෙකුත් නීති ක්‍රියාත්මක කිරීමේ ආයතනවල ආයතනික ශක්තිමත් කිරීම එහි තුන්වන උපාය මාර්ගික ප්‍රමුඛතා ක්ෂේත්‍රය ලෙස දක්වා ඇති අතර, එහි සමස්ත උපාය මාර්ගික අරමුණ වන්නේ "දූෂණයට එරෙහිව ඵලදායී ලෙස සටන් කිරීම සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සහ අනෙකුත් නීති ක්‍රියාත්මක කිරීමේ ආයතනවල ආයතනික ධාරිතාව වැඩි දියුණු කිරීමයි."

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සහ අනෙකුත් නීතිය ක්‍රියාත්මක කරන ආයතනවලට ඵලදායී ලෙස හා කිසිදු බියකින් තොරව කටයුතු කිරීමට ඉඩ සලසමින්, අවශ්‍ය සම්පත්, මෙහෙයුම් ස්වාධීනත්වය සහ දේශපාලනමය මැදිහත්වීම්වලින් නීතිමය ආරක්ෂාව සැපයිය යුතු බව හඳුනා ගනිමින්, දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම මඟින් පහත **උප අරමුණු තුන** යටතේ ක්‍රියා මාර්ග යෝජනා කරයිඃ

1ඃ 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතට අනුකූලව ඉලක්කගත පුහුණුව, සම්පත් වෙන් කිරීම් සහ විශේෂිත ඒකක ස්ථාපිත කිරීම තුළින් දූෂණයට එරෙහිව ප්‍රතිචාර දැක්වීම සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවෙහි හැකියාවන් සහ ඵලදායීතාවය වැඩි දියුණු කිරීම.

2ඃ දූෂණය හඳුනාගැනීම, විමර්ශනය කිරීම සහ වැළැක්වීම සඳහා ඔවුන්ගේ ධාරිතාවය වැඩි දියුණු කිරීම සඳහා අනෙකුත් නීතිය ක්‍රියාත්මක කරන ආයතන සහ නියාමන ආයතන ශක්තිමත් කිරීම.

3ඃ දූෂණයට එරෙහි සටනේ දී නීතිය ක්‍රියාත්මක කරන සහ නියාමන ආයතන අතර සහයෝගීතාවය සහ තොරතුරු බෙදාගැනීම වර්ධනය කිරීම සඳහා අන්තර් ආයතන සබඳතා ශක්තිමත් කිරීම.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සහ අනෙකුත් නීතිය ක්‍රියාත්මක කරන ආයතන ශක්තිමත් කිරීම දූෂණයට එරෙහි සටනේ දී ඉතාමත් වැදගත් වේ. ඒ අනුව, විමර්ශන කටයුතු ශක්තිමත් කිරීම, එම ආයතනවල ස්වාධීනත්වය තහවුරු කිරීම, නඩු පැවරීමේ කටයුතු විධිමත් කිරීම සහ මහජන විශ්වාසය ගොඩනැගීම යන කරුණු තුළින් දූෂණය වැළැක්වීමේ හා එයට එරෙහිව කටයුතු කිරීමේ ප්‍රධාන කාර්යභාරය ඉටු කරනු ලැබේ.

| උප-අරමුණ 1: 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතට අනුකූලව ඉලක්කගත පුහුණුව, සම්පත් වෙන් කිරීම් සහ විශේෂිත ඒකක ස්ථාපිත කිරීම තුළින් දූෂණයට එරෙහිව ප්‍රතිචාර දැක්වීම සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවෙහි හැකියාවන් සහ ඵලදායීතාවය වැඩි දියුණු කිරීම. | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| අංකය | වැඩ පිළිවෙළ / ක්‍රියාව අංකය. | ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPIs) | කාල රාමුව | | | වගකිවයුතු (ප්‍රමුඛ) ආයතනය | ක්‍රියාත්මක කිරීමේ ආයතන |
| | | | කෙටි | මධ්‍ය | දීර්ඝ | | |
| 1 | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවෙ විමර්ශන කටයුතු ප්‍රාදේශීය මට්ටමින් සිදුකිරීම තුළින් දූෂණ ගැටලුවලට ප්‍රවේශ වීමේ හැකියාව හා ප්‍රතිචාර දැක්වීමේ හැකියාව වැඩිදියුණු කිරීම සඳහා විමධ්‍යගත කිරීමේ උපාය මාර්ගයක් සකස් කිරීම. | 1. විමධ්‍යගත කිරීමේ උපාය මාර්ගය සකස් කිරීම.<br>2. පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡා පැවැත්වීම.<br>3. විමධ්‍යගත කිරීමේ උපාය මාර්ගය අවසන් කිරීම.<br>4. ප්‍රාදේශීය කාර්යාල පිහිටුවා ක්‍රියාත්මක කිරීම.<br>5. ප්‍රවේශ වීමේ හැකියාව සහ ප්‍රතිචාර දැක්වීමේ හැකියාව පිළිබඳව පරිශීලක තෘප්තිමත්භාවය පිළිබඳ සමීක්ෂණයක් පැවැත්වීම. | කෙටිකාලීන | | | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව |
| 2 | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවෙහි මෙහෙයුම් ඵලදායීතාවය ශක්තිමත් කිරීම හා දූෂණයට ඵලදායී ලෙස මුහුණදීමේ හැකියාව වර්ධනය කිරීම සඳහා ශක්තිමත් ආයතනික උපාය මාර්ගික සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කිරීම. | 1. ආයතනික උපාය මාර්ගික සැලැස්ම සකස් කිරීම.<br>2. පළමු වසර තුළ සිදුකරනු ලබන විමර්ශන හා නඩු පැවරීම් ගණනෙහි වර්ධනයක් ඇති කිරීම. | කෙටිකාලීන | | | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව |
| 3 | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවෙහි තාක්ෂණික ධාරිතාව වර්ධනය කිරීම සඳහා පුහුණු අවශ්‍යතා තක්සේරු කිරීමක් සිදුකර වාර්ෂික පුහුණු උපාය මාර්ගයක් සකස් කිරීම. | 1. පුහුණු අවශ්‍යතා තක්සේරුවක් සිදුකිරීම.<br>2. වාර්ෂික පුහුණු උපාය මාර්ගය සකස් කිරීම.<br>3. අවම වශයෙන් පුහුණු වැඩසටහන් 90%ක් වත් පැවැත්වීම. | කෙටිකාලීන<br>මධ්‍යකාලීන | | | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව |

| | | | | | |
|---|---|---|---|---|---|
| 4 | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිලධාරීන්ගේ විවිධ කාණ්ඩ සඳහා සම්මත පුහුණු මොඩියුලයන් සකස් කර ක්‍රියාත්මක කිරීම හා ඒවා නිතිපතා යාවත්කාලීන කිරීම | 1. සම්මත පුහුණු මොඩියුලයන් සකස් කිරීම.<br>2. නිතිපතා යාවත්කාලීන කිරීම. | කෙටිකාලීන | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව |
| 5 | නවු මෙහෙයවන නිලධාරීන්ගේ නවු හැසිරවීමේ නිපුණතා සහ ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා නියමිත කාල පරාසයන් තුළ විශේෂිත පුහුණු සැසි පැවැත්වීම. | 1. පවත්වන ලද පුහුණු සැසි ගණන.<br>2. පුහුණු සහභාගීත්ව අනුපාතය අවම වශයෙන් 90%ක් ලෙස පවත්වාගෙන යාම.<br>3. පුහුණුව සාර්ථකව නිම කිරීමේ අනුපාතය අවම වශයෙන් 95%ක් ලෙස පවත්වාගෙන යාම.<br>4. පුහුණුවෙන් පසු දැනුම තක්සේරු කිරීමේ දී කාර්යමය හා විෂයානුබද්ධ කරුණු පිළිබඳ අවබෝධය සහ දැනුම රඳවා ගැනීම සාමාන්‍යයෙන් 80%ක් ලෙස පවත්වාගෙන යාම. | කෙටිකාලීන<br>මධ්‍යකාලීන | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව |
| 6 | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විමර්ශකයින් සඳහා, විශේෂිත හා අනෙකුත් විමර්ශන ක්‍රමවේදයන් සහ උපකරණ භාවිතය පිළිබඳ ඉලක්කගත පුහුණුවක් ලබා දීම. | 1. පවත්වන ලද පුහුණු සැසි ගණන.<br>2. පුහුණු සහභාගීත්ව අනුපාතය අවම වශයෙන් 90%ක් ලෙස පවත්වාගෙන යාම.<br>3. පුහුණුව සාර්ථකව නිම කිරීමේ අනුපාතය අවම වශයෙන් 95%ක් ලෙස පවත්වාගෙන යාම.<br>4. පුහුණුවෙන් පසු දැනුම තක්සේරු කිරීමේ දී මෙහෙයුම්මය හා විෂයානුබද්ධ කරුණු පිළිබඳ අවබෝධය සහ දැනුම රඳවා ගැනීම සාමාන්‍යයෙන් 80%ක් ලෙස පවත්වාගෙන යාම. | කෙටිකාලීන | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව |

| | | | | | |
|---|---|---|---|---|---|
| 7 | විමර්ශනය සඳහා, මහජනතාවට ප්‍රවේශ විය හැකි දේශපාලනිකව නිරාවරණය වූ පුද්ගලයින්ට (PEP) එරෙහිව පවතින සංකීර්ණ නඩුවල සංකීර්ණතාවය සහ මහජන පැතිකඩ තීරණය කිරීම සඳහා නිර්ණායක හඳුනාගැනීම සහ මෙම නඩු අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවෙහි විශේෂිත කණ්ඩායම් වෙත කඩිනමින් පැවරීම සහතික කිරීම සඳහා පද්ධතියක් සකස් කිරීම. | 1. නිර්ණායක තහවුරු කරමින් නිගමනයකට එළඹීම.<br>2. වසරක් ඇතුළත නඩු පැවරීමේ කාර්යක්ෂමතාව 50%කින් වැඩිදියුණු කිරීම.<br>3. නඩු වල ප්‍රතිඵල පිළිබඳ ගුණාත්මක හා ප්‍රමාණාත්මක ඇගයීම් සිදුකිරීම. | කෙටිකාලීන | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව |
| 8 | පැමිණිලි හැසිරවීම සඳහා සම්මත මෙහෙයුම් පටිපාටි (SOPs) සංවර්ධනය කර ක්‍රියාත්මක කිරීම. | 1. (SOPs) සංවර්ධනය කිරීම.<br>2. පැමිණිලි භාරගන්නා කාර්ය මණ්ඩලය සඳහා පුහුණුවක් පැවැත්වීම.<br>3. පැමිණිලි හැසිරවීමේ ඵලදායීතාවය තක්සේරු කිරීම සඳහා වාර්ෂික සමාලෝචනයක් පැවැත්වීම. | කෙටිකාලීන | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව |
| 9 | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව තුළ, ආබාධිත පුද්ගලයින්ට පහසුකම් සැලසෙන පරිදි යටිතල පහසුකම් සහ මෘදුකාංග වැඩිදියුණු කිරීමේ සැලැස්මක් සඳහා අනුමැතිය ලබා ගැනීම. එමගින් එහි පහසුකම් නවීකරණය කිරීම, උපකරණ යාවත්කාලීන කිරීම සහ අවශ්‍ය නිරීක්ෂණ හා විශ්ලේෂණ උපකරණ ලබා ගැනීම. | 1. සැලැස්ම සකස් කිරීම.<br>2. ප්‍රමාණවත් අයවැයක් වෙන් කිරීම.<br>3. හඳුනාගත් නවීකරණ කටයුතු හා වැඩිදියුණු කිරීම් සිදුකිරීම.<br>4. 75%ක පරිශීලක තෘප්තිමත්භාවය අගය සපුරා ගැනීම. | කෙටිකාලීන | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව |

| | | | | | |
|---|---|---|---|---|---|
| 10 | අභ්‍යන්තර කටයුතු ඒකකය, මානව සම්පත් ඒකකය, සාක්ෂිකරුවන් සහ වින්දිතයින් ආරක්ෂා කිරීමේ ඒකකය, බුද්ධි ඒකකය, ඩිජිටල් ව්‍යවහාරික විමර්ශන ඒකකය, පර්යේෂණ සහ ප්‍රතිපත්ති සැලසුම් ඒකකය, පුහුණු ඒකකය, ජාත්‍යන්තර ඒකකය සහ මාධ්‍ය ඒකකය ඇතුළු අමතර ඒකක අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව තුළ ස්ථාපිත කිරීම. | 1. සියලුම ඒකක ස්ථාපිත කිරීම.<br>2. නව ඒකකවල කාර්ය මණ්ඩලයට අදාළ සියලු පුහුණු පැවැත්වීම. | කෙටිකාලීන මධ්‍යකාලීන | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව |
| 11 | වින්දිතයින්, සාක්ෂිකරුවන් සහ තොරතුරු ලබා දෙන්නන් සඳහා සහාය සහ ආරක්ෂාව සැපයීම සම්බන්ධ කටයුතු හැසිරවීම සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව තුළ වෙනම ඒකකයක් ස්ථාපිත කිරීම:<br>i. මෙම ඒකකයේ ක්‍රියාකාරකම් සඳහා මග පෙන්වීමක් ලබා දීම සහ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ හි සමස්ත අරමුණු සමග පෙළ ගැස්වීම සහතික කිරීම සඳහා ඒකකය සඳහා පුළුල් ආයතනික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම.<br>වින්දිතයින්, සාක්ෂිකරුවන් සහ තොරතුරු ලබා දෙන්නන් සඳහා සහාය සහ ආරක්ෂාව සැපයීම සම්බන්ධයෙන් ඒකකයේ විධානය, කාර්යයන් සහ වගකීම් නිර්වචනය කිරීම සහ ඒකකයට අදාළ සහාය සේවා, ආරක්ෂණ ක්‍රියා මාර්ග සහ සන්නිවේදන ක්‍රියා පටිපාටි පැහැදිලිව දක්වා තිබීම. | 1. ඒකකය ස්ථාපිත කර ක්‍රියාත්මක කිරීම.<br>2. නව ඒකකවල කාර්ය මණ්ඩලයට අදාළ සියලු පුහුණු පැවැත්වීම.<br>3. මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහනක් ආරම්භ කිරීම. | කෙටිකාලීන | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ii. වින්දිතයින්ට සහාය, නීතිමය ආරක්ෂාව සහ හදිසි අවස්ථා කළමනාකරණය පිළිබඳ විශේෂඥ දැනුමකින් යුත් කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සහ පුහුණු කිරීම.<br><br>ඵලදායී සහාය සහ ආරක්ෂණ ක්‍රියා මාර්ග ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා ක්‍රියා පටිපාටි සහ සම්පත් සංවර්ධනය කිරීම.<br><br>iii. වින්දිතයින් සහ තොරතුරු ලබා දෙන්නන් සඳහා සහාය දැක්වීමේ ජාල ශක්තිමත් කිරීම සඳහා රාජ්‍ය නොවන සංවිධාන, නීති ආධාර සංවිධාන සහ නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන සමඟ ඇතිවිය හැකි හවුල්කාරිත්වයන් හඳුනා ගැනීම.<br><br>iv. මෙම ඒකකය හරහා වින්දිතයින්, සාක්ෂිකරුවන් සහ තොරතුරු ලබා දෙන්නන්ට ලබා ගත හැකි සේවාවන් පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 12 | දත්ත මත පදනම් වූ තීරණ ගැනීම සඳහා සහය වීමෙන් විමර්ශන කටයුතුවල ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා මෙහෙයුම් විශ්ලේෂණ ඒකකයක් ස්ථාපිත කිරීම. | 1. ඒකකය ස්ථාපනය කර ක්‍රියාත්මක කිරීම.<br>2. නව ඒකකවල කාර්ය මණ්ඩලයට අදාළ සියලු පුහුණු පැවැත්වීම.<br>3. දත්ත ඒකාබද්ධ කිරීම සම්පූර්ණ කිරීම.<br>1. විමර්ශන ප්‍රතිඵල අවම වශයෙන් 75%කින් වැඩි දියුණු කිරීම. | කෙටිකාලීන මධ්‍යකාලීන | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව |
| 13 | රාජ්‍ය නිලධාරීන් අතර වගවීම ඉහළ නැංවීම සඳහා වත්කම්, බැරකම් සහ අභිලාෂයන් ප්‍රකාශ කිරීමේ කාර්යාලය ක්‍රියාත්මක කිරීම. | 1. කාර්යාලය ස්ථාපිත කර ක්‍රියාත්මක කිරීම.<br>2. නව ඒකකවල කාර්ය මණ්ඩලයට අදාළ සියලු පුහුණු පැවැත්වීම.<br>3. ප්‍රකාශයන් ඉදිරිපත් කිරීමේ දී 100ක අනුකූලතා අනුපාතයක් ලබා ගැනීම. | කෙටිකාලීන මධ්‍යකාලීන | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව |
| 14 | අල්ලස් නඩු සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාවලීන් විධිමත් කිරීම සඳහා පැහැදිලි නඩු පැවරීමේ මාර්ගෝපදේශ සැකසීම. | 1. මාර්ගෝපදේශ සකස් කර අනුමත කිරීම.<br>2. නඩු පවරන්නන් සඳහා අදාළ සියලුම පුහුණු වැඩසටහන් සම්පූර්ණ කිරීම. | කෙටිකාලීන | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව |
| 15 | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සඳහා චර්යාධර්ම පද්ධතියක් හඳුන්වා දීම. | 1. වැඩ කරන කණ්ඩායමක් පත් කිරීම.<br>2. මුල් කෙටුම්පත සකස් කිරීම.<br>3. පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡා පැවැත්වීම.<br>4. චර්යාධර්ම පද්ධතිය අවසන් කොට සම්මත කිරීම. | කෙටිකාලීන | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව |

| | | | | | |
|---|---|---|---|---|---|
| 16 | කාර්ය මණ්ඩල සහ මෙහෙයුම් අවශ්‍යතා සපුරාලීම සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සඳහා පුළුල් මානව සම්පත් ප්‍රතිපත්තියක් නිර්මාණය කිරීම. | 1. මානව සම්පත් ප්‍රතිපත්තිය සකස් කිරීම.<br>2. පුහුණු හා සංවර්ධන වැඩසටහන් වලින් අවම වශයෙන් 80%ක් ක්‍රියාත්මක කිරීම. | කෙටිකාලීන | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව |
| 17 | කොමිෂන් සභාවේ කටයුතු සඳහා සහාය වීම පිණිස අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව තුළ අරමුදලක් ස්ථාපිත කර ක්‍රියාත්මක කිරීම. | 1. අරමුදල ස්ථාපනය කිරීම.<br>2. ගණකාධිකාරීවරුන් සඳහා 100%ක පුහුණුවක් පැවැත්වීම.<br>3. අරමුදල භාවිතය පිළිබඳ බලපෑම් ඇගයීම වසර 1කට පසු සිදුකිරීම. | කෙටිකාලීන | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව |
| 18 | නිල භාෂා තුනෙන්ම දූෂණය සම්බන්ධ පැමිණිලි ඉදිරිපත් කිරීම පහසු කරවන, ආබාධිත පුද්ගලයින්ට හිතකර ජංගම යෙදුමක් හඳුන්වා දීමෙන් මහජන සහභාගීත්වය සහ වාර්තා කිරීමේ හැකියාව වැඩිදියුණු කිරීම. | 1. ජංගම යෙදුම (Mobile App) සකසා ක්‍රියාත්මක කිරීම.<br>2. යෙදුම හරහා ඉදිරිපත් කරන ලද පැමිණිලි අනුපාතය ඉහළ නැංවීම.<br>3. අවම වශයෙන් 75%ක පරිශීලක තෘප්තිමත් අනුපාතයක් ලබා ගැනීම. | කෙටිකාලීන | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව |
| 19 | දූෂණ මර්දන කටයුතුවල දී සිවිල් සමාජ සංවිධාන සමඟ සහයෝගීතාවය වර්ධනය කිරීම සඳහා සිවිල් සමාජය හා පෞද්ගලික අංශය නියෝජනය කරන සම්බන්ධීකාරකවරයෙකු පත් කිරීම. | 1. සම්බන්ධීකාරකවරයා පත් කිරීම.<br>2. සහයෝගීතාවයේ බලපෑම මැන බැලීම. | කෙටිකාලීන | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව |
| 20 | පාර්ශ්වකරුවන් අතර සම්බන්ධීකරණය වූ විමර්ශන සහ තොරතුරු තහවුරු කිරීම් සඳහා පහසුකම් සැලසීම සඳහා යාන්ත්‍රණයක් සකසා ගැනීම. | 1. යාන්ත්‍රණය සකසා ගැනීම.<br>2. පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්ව අනුපාතය අවම වශයෙන් 70%ක් වත් පවත්වා ගැනීම.<br>3. සම්බන්ධීකරණය වූ විමර්ශන ගණන. | කෙටිකාලීන | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව |

| | | | | | |
|---|---|---|---|---|---|
| 21 | තොරතුරු දැනගැනීමේ අයිතිය වඩාත් හොඳින් ක්‍රියාත්මක කරමින්, මහජනතාවට අදාළ තොරතුරු සක්‍රීයව ලබා දීම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් සිදු කිරීම. | 1. අවම වශයෙන් 75%ක සක්‍රීය හෙළිදරව් කිරීමේ අනුපාතයක් ලබා ගැනීම.<br>2. අවම වශයෙන් 80%ක පරිශීලක තෘප්තිමත් අනුපාතයක් ලබා ගැනීම. | කෙටිකාලීන | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව |
| උප අරමුණ 2: දූෂණය හඳුනාගැනීම, විමර්ශනය කිරීම හා වැළැක්වීම සඳහා අනෙකුත් නීතිය ක්‍රියාත්මක කරන ආයතන සහ නියාමන ආයතනවලට ඇති හැකියාව ශක්තිමත් කිරීම | | | | | |
| 1 | පාර්ලිමේන්තු අධීක්ෂණ කමිටුවල ක්‍රියාකාරිත්වය තුළ සදාචාරාත්මක ප්‍රමිතීන් හා විනිවිදභාවය තහවුරු කිරීම සඳහා විශේෂිත මාර්ගෝපදේශ සැකසීම. | 1. මාර්ගෝපදේශ සකස් කර අනුමත කිරීම.<br>2. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට මාර්ගෝපදේශ පිළිබඳ සම්පූර්ණ පුහුණුවක් ලබා දීම. | කෙටිකාලීන | පාර්ලිමේන්තුව | පාර්ලිමේන්තුව |
| 2 | නීතිපති දෙපාර්තමේන්තුවේ නඩු මෙහෙයවන නිළධාරීන්, මෑත කාලීන ජාත්‍යන්තර හා ජාතික දූෂණ නීති, ක්‍රියා පටිපාටි සහ ප්‍රවණතා පිළිබඳව දැනුම යාවත්කාලීන කිරීම තුළින්, අදාළ නඩු කටයුතු හැසිරවීමේ හැකියාව සහ මූලික අවබෝධය වර්ධනය කිරීම සඳහා පුහුණු සැසි පැවැත්වීම. | 1. පවත්වන ලද පුහුණු සැසි ගණන.<br>2. පුහුණුවට සහභාගීවීමේ අනුපාතය අවම වශයෙන් 90%ක් ලෙස පවත්වාගෙන යාම.<br>3. පුහුණුව සාර්ථකව නිම කිරීමේ අනුපාතය අවම වශයෙන් 95%ක් ලෙස පවත්වාගෙන යාම.<br>4. පුහුණුවෙන් පසු දැනුම තක්සේරු කිරීමේ දී ක්‍රියාකාරී අංශ හා විෂයානුබද්ධ කරුණු පිළිබඳ අවබෝධය සහ දැනුම රඳවා ගැනීම සාමාන්‍යයෙන් 80%ක් ලෙස පවත්වාගෙන යාම. | කෙටිකාලීන<br>දීර්ඝකාලීන | නීතිපති දෙපාර්තමේන්තුව | නීතිපති දෙපාර්තමේන්තුව |

| | | | | | |
|---|---|---|---|---|---|
| 3 | රේගු දෙපාර්තමේන්තුව, සුරාබදු දෙපාර්තමේන්තුව සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වැනි ප්‍රධාන ආදායම් උපයන අංශ සඳහා, දූෂණ විරෝධී සවිස්තරාත්මක පුහුණු වැඩසටහන් පැවැත්වීම. | 1. පවත්වන ලද පුහුණු සැසි ගණන<br>2. පුහුණුවට සහභාගීවීමේ අනුපාතය අවම වශයෙන් 90%ක් ලෙස පවත්වාගෙන යාම.<br>3. පුහුණුව සාර්ථකව නිම කිරීමේ අනුපාතය අවම වශයෙන් 95%ක් ලෙස පවත්වාගෙන යාම.<br>4. පුහුණුවෙන් පසු දැනුම තක්සේරු කිරීමේ දී මෙහෙයුම් හා විෂයානුබද්ධ කරුණු පිළිබඳ අවබෝධය සහ දැනුම රඳවා ගැනීම සාමාන්‍යයෙන් 80%ක් ලෙස පවත්වාගෙන යාම. | කෙටිකාලීන<br>මධ්‍යකාලීන | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව<br><br>සියලුම ප්‍රධාන ආදායම් උපයන ආයතන |
| 4 | සැක සහිත මූල්‍ය ගනුදෙනු, අවසාන ප්‍රතිලාභීන් සහ මහජනතාවට ප්‍රවේශ විය හැකි දේශපාලනිකව නිරාවරණය වූ පුද්ගලයින් (PEP) හඳුනා ගැනීම පිළිබඳව මූල්‍ය ආයතන (FI) මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීන් (DNFBs) සහ රක්ෂණකරුවන්ට පුහුණුව ලබා දීම. | 1. පවත්වන ලද පුහුණු සැසි ගණන.<br>2. පුහුණුවට සහභාගීවීමේ අනුපාතය අවම වශයෙන් 90%ක් ලෙස පවත්වාගෙන යාම.<br>3. පුහුණුව සාර්ථකව නිම කිරීමේ අනුපාතය අවම වශයෙන් 95%ක් ලෙස පවත්වාගෙන යාම.<br>4. පුහුණුවෙන් පසු දැනුම තක්සේරු කිරීමේ දී මෙහෙයුම් හා විෂයානුබද්ධ කරුණු පිළිබඳ අවබෝධය සහ දැනුම රඳවා ගැනීම සාමාන්‍යයෙන් 80%ක් ලෙස පවත්වාගෙන යාම. | කෙටිකාලීන<br>මධ්‍යකාලීන | මූල්‍ය බුද්ධි ඒකකය | මූල්‍ය බුද්ධි ඒකකය<br><br>අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව |

| | | | | | |
|---|---|---|---|---|---|
| 5 | සුරැකුම්පත් අංශයේ මූල්‍ය අපරාධ හඳුනාගැනීමේ සහ වැළැක්වීමේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා, මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ (AML) පුහුණුව වැඩි දියුණු කිරීම. | 1. පවත්වන ලද පුහුණු සැසි ගණන.<br>2. පුහුණුවට සහභාගීවීමේ අනුපාතය අවම වශයෙන් 90%ක් ලෙස පවත්වාගෙන යාම.<br>3. පුහුණුව සාර්ථකව නිම කිරීමේ අනුපාතය අවම වශයෙන් 95%ක් ලෙස පවත්වාගෙන යාම.<br>4. පුහුණුවෙන් පසු දැනුම තක්සේරු කිරීමේ දී මෙහෙයුම්මය හා විෂයානුබද්ධ කරුණු පිළිබඳ අවබෝධය සහ දැනුම රඳවා ගැනීම සාමාන්‍යයෙන් 80%ක් ලෙස පවත්වාගෙන යාම. | කෙටිකාලීන<br>මධ්‍යකාලීන | මූල්‍ය බුද්ධි ඒකකය | මූල්‍ය බුද්ධි ඒකකය<br>අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව |
| 6 | මූල්‍ය ගනුදෙනු අධීක්ෂණය කිරීමේ කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාවය වැඩිදියුණු කිරීම සඳහා, මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ (AML) අධීක්ෂණය සඳහා ස්වයංක්‍රීය පද්ධති ක්‍රියාත්මක කිරීම. | 1. ස්වයංක්‍රීය පද්ධතිය සංවර්ධනය කර ක්‍රියාත්මක කිරීම.<br>2. ගනුදෙනු අධීක්ෂණ කාර්යක්ෂමතාවය අවම වශයෙන් 75%කින් වැඩිදියුණු කිරීම.<br>3. සැක සහිත ක්‍රියාකාරකම් හඳුනාගැනීමේ අනුපාතය අවම වශයෙන් 75%ක් ලබා ගැනීම. | කෙටිකාලීන | මූල්‍ය බුද්ධි ඒකකය | මූල්‍ය බුද්ධි ඒකකය |
| 7 | ඉලක්කගත පුහුණු සැසි මඟින්, විමර්ශකයින්, නඩු පවරන්නන්, අධිකරණය සහ මූල්‍ය බුද්ධි ඒකකය (FIU) යන ආයතනවල නිලධාරීන්ගේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ (AML) සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීමේ (CFT) හැකියාවන් ශක්තිමත් කිරීම. | 1. පවත්වන ලද පුහුණු සැසි ගණන.<br>2. පුහුණුවට සහභාගීවීමේ අනුපාතය අවම වශයෙන් 90%ක් ලෙස පවත්වාගෙන යාම.<br>3. පුහුණුව සාර්ථකව නිම කිරීමේ අනුපාතය අවම වශයෙන් 95%ක් ලෙස පවත්වාගෙන යාම.<br>4. පුහුණුවෙන් පසු දැනුම තක්සේරු කිරීමේ දී මෙහෙයුම්මය හා විෂයානුබද්ධ කරුණු පිළිබඳ අවබෝධය සහ දැනුම රඳවා ගැනීම සාමාන්‍යයෙන් 80%ක් ලෙස පවත්වාගෙන යාම. | කෙටිකාලීන<br>දීර්ඝකාලීන | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | මූල්‍ය බුද්ධි ඒකකය<br>නීතිපති දෙපාර්තමේන්තුව<br>අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව<br>අධිකරණ සේවා කොමිෂන් සභාව<br>ශ්‍රී ලංකා විනිසුරුවරුන්ගේ ආයතනය |

| | | | | | |
|---|---|---|---|---|---|
| 8 | දූෂණය හඳුනාගැනීම හා විමර්ශනය කිරීමේ හැකියාව වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා පොලීසියේ මූල්‍ය අපරාධ විමර්ශන නිලධාරීන් සඳහා විශේෂිත පුහුණු සැසි පැවැත්වීම. | 1. පවත්වන ලද පුහුණු සැසි ගණන<br>2. පුහුණුවට සහභාගීවීමේ අනුපාතය අවම වශයෙන් 90%ක් ලෙස පවත්වාගෙන යාම.<br>3. පුහුණුව සාර්ථකව නිම කිරීමේ අනුපාතය අවම වශයෙන් 95%ක් ලෙස පවත්වාගෙන යාම.<br>4. පුහුණුවෙන් පසු දැනුම තක්සේරු කිරීමේ දී මෙහෙයුම්මය හා විෂයානුබද්ධ කරුණු පිළිබඳ අවබෝධය සහ දැනුම රඳවා ගැනීම සාමාන්‍යයෙන් 80%ක් ලෙස පවත්වාගෙන යාම. | කෙටිකාලීන<br>මධ්‍යකාලීන | ශ්‍රී ලංකා පොලීසිය | ශ්‍රී ලංකා පොලීසිය<br>අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව |
| 9 | රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලීන්හි අධීක්ෂණය සහ වගවීම වැඩි දියුණු කිරීම සඳහා ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව (NPC), විමර්ශන බලධාරියා ලෙස නම් කිරීම. | 1. ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව නම් කිරීම.<br>2. විමර්ශන කටයුතු පිළිබඳව ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවෙහි කාර්ය මණ්ඩලයට විමර්ශන පිළිබඳව සියලුම පුහුණුව ලබා දීම.<br>3. සිදුකරන ලද විමර්ශන ගණන.<br>4. සිදුකරන ලද විමර්ශනවල සොයාගැනීම් සහ ප්‍රතිඵල පිළිබඳව මහජන වාර්තා ගණන. | කෙටිකාලීන<br>මධ්‍යකාලීන | ජනාධිපති ලේකම් කාර්යාලය | ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව |
| 10 | අල්ලස් සහ දූෂණ නඩු වඩාත් ඵලදායී ලෙස හැසිරවීම සඳහා විශේෂ මහාධිකරණ පද්ධතිය ශක්තිමත් කිරීම හා ක්‍රියාත්මක කිරීම. | 1. විශේෂ අධිකරණ පිහිටුවා ක්‍රියාත්මක කිරීම.<br>2. නඩු විභාග කිරීමේ කාලය අවම වශයෙන් 50%කින් අඩු කිරීම. | කෙටිකාලීන | අධිකරණ අමාත්‍යාංශය | අධිකරණ අමාත්‍යාංශය |
| 11 | අධිකරණය නිලධාරීන් බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ ක්‍රියා පටිපාටීන් ශක්තිමත් කිරීම. | 1. බඳවා ගැනීමේ නිර්ණායක සකස් කිරීම.<br>2. පුහුණු හා සංවර්ධන වැඩසටහන් ගණන ක්‍රියාත්මක කිරීම. | කෙටිකාලීන<br>මධ්‍යකාලීන | අධිකරණ සේවා කොමිෂන් සභාව | අධිකරණ සේවා කොමිෂන් සභාව |

| | | | | | |
|---|---|---|---|---|---|
| 12 | සුදුසුකම් ලත් නිලධාරීන් ආකර්ෂණය කර ගැනීම සහ රඳවා ගැනීම සඳහා අධිකරණ නිලධාරීන්ගේ වැටුප් වරින් වර සමාලෝචනය කර අවශ්‍ය නම් වැඩි කිරීම සඳහා යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම. | 1. නිල වැටුප් සමාලෝචන ක්‍රියාවලියක් ස්ථාපිත කිරීම.<br>2. අධිකරණ නිලධාරීන් රඳවා ගැනීමේ අනුපාතය අවම වශයෙන් 50%කින් වැඩි කිරීම.<br>3. අධිකරණ නිලධාරීන්ගේ තෘප්තිමත් අනුපාතය අවම වශයෙන් 80%ක් ලබා ගැනීම. | කෙටිකාලීන<br>දීර්ඝකාලීන | අධිකරණ සේවා කොමිෂන් සභාව | අධිකරණ සේවා කොමිෂන් සභාව<br><br>මුදල් අමාත්‍යාංශය |
| උප අරමුණ 3: දූෂණයට එරෙහි සටනේ දී නීතිය ක්‍රියාත්මක කරන ආයතන සහ නියාමන ආයතන අතර සහයෝගීතාවය සහ තොරතුරු හුවමාරුව ප්‍රවර්ධනය කිරීම සඳහා අන්තර්-ආයතනික සම්බන්ධතා ශක්තිමත් කිරීම. | | | | | |
| 1 | දූෂණ මර්දන කටයුතු සඳහා නීතිය ක්‍රියාත්මක කිරීමේ අරමුණු ඉටු කරගැනීම පිණිස තොරතුරු හුවමාරු කර ගැනීමේ සහයෝගීතාවය සඳහා වූ පැහැදිලි ප්‍රතිපත්තිමය රාමුවක් සකස් කිරීම. මෙමඟින් පහත ක්‍රමවේදයන් එකක් හෝ කිහිපයක් මඟින් රහස්‍යභාවය සුරැකෙන පරිදි තොරතුරු හුවමාරු කර ගත හැක:<br>a. ලේඛන හා දත්ත ගබඩාවලට සෘජු ප්‍රවේශය ලබා ගැනීම.<br>b. තොරතුරු අනිවාර්යයෙන් හුවමාරු කරගැනීම.<br>c. ස්වයංසිද්ධව තොරතුරු හුවමාරු කරගැනීම.<br>d. ඉල්ලීමක් මත තොරතුරු හුවමාරු කරගැනීම. | 1. ප්‍රතිපත්ති රාමුව කෙටුම්පත් කිරීම.<br>2. පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡා පැවැත්වීම.<br>3. ප්‍රතිපත්තිමය රාමුව අවසන් කොට සම්මත කිරීම..<br>4. තොරතුරු හුවමාරු ප්‍රොටෝකෝල ක්‍රියාත්මක කිරීම. | කෙටිකාලීන | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව<br><br>නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව<br><br>සියළුම දූෂණයට එරෙහි ආයතන |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2 | ආයතන අතර තොරතුරු රැස් කිරීම සඳහා පොදු තාක්ෂණික වේදිකාවක් ස්ථාපිත කිරීමෙන් දත්ත සමුදායන්හි අන්තර් සම්බන්ධතාවය තහවුරු කිරීම. | 1. පොදු තාක්ෂණික වේදිකාවක් සංවර්ධනය කිරීම.<br>2. අවම වශයෙන් 90%ක ආයතන සහභාගීත්ව අනුපාතයක් ලබා ගැනීම.<br>3. පරිශීලක සහාය පුහුණුව 100%ක් පැවැත්වීම. | කෙටිකාලීන | ඩිජිටල් ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය | ඩිජිටල් ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය |
| 3 | අන්තර් ආයතනික සම්බන්ධීකරණය පිළිබඳ මාධ්‍ය සාකච්ඡා පැවැත්වීම සඳහාත්, අදාළ මාතෘකා පිළිබඳව නියමිත පරිදි දැනුම් දීම් සිදුකිරීම සඳහාත්, දූෂණ මර්දනයට අදාළ ආයතනවලින් සමන්විත ප්‍රකාශකයන්ගේ මණ්ඩලයක් ස්ථාපනය කිරීම. | 1. මණ්ඩලය පත් කිරීම.<br>2. මාධ්‍ය සාකච්ඡා පැවැත්වීමේ වාර ගණන තීරණය කිරීම<br>3. අවම වශයෙන් 75%ක මහජන සහභාගීත්ව අනුපාතයක් ලබා ගැනීම. | කෙටිකාලීන | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | සියලුම දූෂණ විරෝධී ආයතන |
| 4 | ශ්‍රී ලංකාවේ මූල්‍ය බුද්ධි ඒකකයේ හැකියාවන් ශක්තිමත් කිරීම, ජාත්‍යන්තර තොරතුරු හුවමාරු කර ගැනීමට සහ එහි අධීක්ෂණ කටයුතු ඵලදායී ලෙස ඉටු කිරීමට ප්‍රමාණවත් සම්පත් ඇති බව තහවුරු කිරීම. | 1. අවශ්‍ය සම්පත් වෙන් කිරීම.<br>2. කාර්ය මණ්ඩල පුහුණු හා සංවර්ධන වැඩසටහන් සම්පූර්ණ ලෙස ක්‍රියාත්මක කිරීම.<br>3. ජාත්‍යන්තර දැනුම හුවමාරු කිරීම් සිදු කිරීම.<br>4. සැක සහිත ගනුදෙනු විශ්ලේෂණය කර ප්‍රතිචාර දැක්වීමේ සංඛ්‍යාව වැඩි කිරීම. | කෙටිකාලීන | මහ බැංකුව | මූල්‍ය බුද්ධි ඒකකය |
| 5 | දූෂණ හා මුදල් විශුද්ධිකරණ විමර්ශන කටයුතුවල දී ජාත්‍යන්තර පාර්ශ්වකරුවන් සමඟ සහයෝගීතාවය ශක්තිමත් කිරීම, තොරතුරු හුවමාරුව සහ ඒකාබද්ධ මෙහෙයුම් වැඩිදියුණු කිරීම | 1. අවශ්‍ය සහයෝගී ජාත්‍යන්තර පාර්ශ්වකරුවන් හඳුනාගැනීම.<br>2. ජාත්‍යන්තර සහයෝගිතා ගිවිසුම් අවසන් කිරීම.<br>3. පුහුණු හා ධාරිතා සංවර්ධන කටයුතු ගණනාවක් පැවැත්වීම. | කෙටිකාලීන<br>දීර්ඝකාලීන | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව<br>මූල්‍ය බුද්ධි ඒකකය | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව<br>මූල්‍ය බුද්ධි ඒකකය<br>අධිකරණ අමාත්‍යාංශය<br>නීතිපති දෙපාර්තමේන්තුව |



නිය - දරාගැනීමේ ශක්තිය

# ඇ. නීතිය සහ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ

## ඈ. නීතිය සහ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ

**හතරවන උපාය මාර්ගික ප්‍රමුඛතා ක්ෂේත්‍රය: නීති සහ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණය**

ඕනෑම සාර්ථක දූෂණ විරෝධී උපාය මාර්ගයක හරය ශක්තිමත් නීති පද්ධතියකි. එමනිසා, දූෂණයට එරෙහිව සටන් කිරීම සඳහා වන වඩාත් තීරණාත්මක උපාය මාර්ගයක් වන්නේ පුළුල් නීති සහ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණයි. එවැනි ප්‍රතිසංස්කරණ දූෂණයට විසඳුම් සෙවීම සඳහා පමණක් නොව, දූෂණය සිදුවීම වැළැක්වීම සඳහා නෛතික හා ආයතනික රාමුවක් නිර්මාණය කිරීම සඳහා ද අත්‍යවශ්‍ය වේ. ප්‍රතිසංස්කරණ මගින් හිදැස් වසා දැමීම, විනිවිද ක්‍රියාවලීන් නිර්මාණය කිරීම සහ දූෂණ විරෝධය පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වීම සහතික කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතු ය. තවද, දූෂණ විරෝධී නීති සහ අනෙකුත් නීතිය බලාත්මක කිරීමේ ආයතනවල ස්වාධීනත්වය සහ සවිබල ගැන්වීම මෙම නීති මගින් සහතික කළ යුතු ය (ඉහත උපාය මාර්ගික ප්‍රමුඛතා අංශ 3 සම්පූර්ණ කරමින්).

නීතිමය යාන්ත්‍රණයන්ගෙන් ඔබ්බට, දූෂණය වටා ඇති සංස්කෘතිය වෙනස් කිරීමේ දී ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. විනිවිදභාවය, සුපිළිපන්නබව සහ මහජන සහභාගීත්වය ප්‍රවර්ධනය කරන ප්‍රතිපත්ති වෙනස්කම් මගින් දූෂණය මුල් බැස ගැනීමට ඇති ඉඩකඩ අඩු වාතාවරණයක් ඇති කළ හැකි ය. ඒ හා සමානව, රජයේ ක්‍රියාකාරකම් නිරීක්ෂණය කිරීම සඳහා සිවිල් සමාජ සංවිධානවල (CSOs) සහ මාධ්‍යවල සහභාගීත්වය දිරිමත් කරන ප්‍රතිපත්ති දූෂණය මැඩපැවැත්වීමට උපකාරී වේ.

ඒ අනුව, දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම විසින් 'නීති සහ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ' එහි සිව්වන උපාය මාර්ගික ප්‍රමුඛතා ක්ෂේත්‍රය ලෙස හඳුනාගෙන ඇති අතර එහි සමස්ත උපාය මාර්ගික අරමුණ වන්නේ 'ආයතන තුළ සහ සමාජයේ විනිවිදභාවය, වගවීම සහ සුපිළපන්බව ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ දූෂණ විරෝධී නීති සහ ප්‍රතිපත්ති ශක්තිමත් කිරීම සහ නැවත තහවුරු කිරීම'යි.

ඉහත උපාය මාර්ගික අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා, දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම පහත **උප අරමුණු තුන (03)** යටතේ ක්‍රියා මාර්ග යෝජනා කරයි:

1. දූෂණ විරෝධී නීති ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය සංශෝධන ක්‍රියාත්මක කිරීම.
2. දූෂණ විරෝධී ක්‍රියා මාර්ගවල ඵලදායිතාව වැඩි දියුණු කිරීම සඳහා ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ ආරම්භ කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
3. ජාත්‍යන්තර දූෂණ විරෝධී බැඳීම් සහ ප්‍රමිතීන්ට අනුකූල වීම සහතික කිරීම.

මේ අනුව, සාධාරණ, වඩා විනිවිද පෙනෙන සහ වගවිය හැකි පාලන පද්ධති නිර්මාණය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රයත්නයේ මුල්ගල වන්නේ පුළුල් නීති සහ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ වන අතර එමගින් දූෂණය අඩු කර දිගුකාලීන සමාජ හා ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය කරනු ඇත. මෙම ප්‍රතිසංස්කරණ සියලුම සමාජ අංශවල සහාය ඇතිව ශක්තිමත් දේශපාලන කැමැත්තක පසුබිමක ක්‍රියාත්මක කළ යුතු අතර වෙනස්වන තත්වයන්ට අනුකූලව අඛණ්ඩව අනුවර්තනය කළ යුතුය.

| උපාය මාර්ගික අරමුණ: ශ්‍රී ලංකාවේ ආයතන තුළ සහ සමාජය තුළ විනිවිදභාවය, වගවීම සහ සුපිළිපන්න බව ප්‍රවර්ධනය කිරීම සඳහා දූෂණ විරෝධී නීති සහ ප්‍රතිපත්ති ශක්තිමත් කිරීම සහ තහවුරු කිරීම. | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| උප අරමුණ 1: දූෂණ විරෝධී නීති ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය සංශෝධන ක්‍රියාත්මක කිරීම. | | | | | | | |
| No. | පියවර/ක්‍රියාව | ප්‍රධාන කාර්යසාධක දර්ශකය | කාල රාමුව | | | වගකිවයුතු ආයතන | ක්‍රියාත්මක කරන ආයතන |
| | | | කෙටි | මධ්‍ය | දිර්ඝ | | |
| 1 | දූෂණ වාර්තා දිරිමත් කරමින්, හෙළි කරන්නන් පළිගැනීම්වලින් ආරක්ෂා කිරීමට උපදේශාත්මක ක්‍රියාවලියක් ඔස්සේ විශේෂ නීතියක් කෙටුම්පත් කර සම්මත කිරීම. | 1. නීති කෙටුම්පත් කිරීම.<br>2. පාර්ශ්වකරුවන් සඳහා උපදේශන පැවැත්වීම.<br>3. කෙටුම්පත අවසන් කර සම්මත කිරීම.<br>4. නීති සම්පාදනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් දියත් කිරීම. | කෙටිකාලීන | | | අධිකරණ අමාත්‍යාංශය | අධිකරණ අමාත්‍යාංශය,<br>නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව |
| 2 | මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීමට අදාළ විධිවිධාන හඳුන්වා දීම සඳහා 2021 අංක 19 දරණ සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත සහ ලියාපදිංචි කොටස් සහ සුරැකුම්පත් ආඥාපනත උපදේශාත්මක ක්‍රියාවලියක් හරහා සමාලෝචනය කිරීම. | 1. සමාලෝචන කමිටුවක් පත් කිරීම.<br>2. මූලික සමාලෝචනය සම්පූර්ණ කිරීම.<br>3. පාර්ශ්වකරුවන් සඳහා උපදේශන සම්පූර්ණ කිරීම.<br>4. අවශ්‍ය සංශෝධන ඇතුළත් කර නීති සම්පාදනය කිරීම.<br>5. සම්පාදිත නීතිය පිළිබඳ දැනුවත් කිරීම. | මධ්‍යකාලීන | | | අධිකරණ අමාත්‍යාංශය<br>සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව | සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව<br>අධිකරණ අමාත්‍යාංශය,<br>නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව |
| 3 | නියාමනය නොකළ, අවිධිමත් සහ ප්‍රමාණවත් ලෙස නියාමනය නොකළ මූල්‍ය ආයතනවල අධීක්ෂණය ක්‍රියාවලි, සම්බාධක බලාත්මක කිරීම සහ ගනුදෙනු නිරීක්ෂණය හා වාර්තා කිරීම වැඩිදියුණු කිරීම සඳහා නියාමන රාමුව වැඩි දියුණු කිරීම. | 1. නීතිමය සහ ප්‍රතිපත්තිමය රාමුව සකස් කිරීම.<br>2. කෙටුම්පත අවසන් කර සම්මත කරගැනීම.<br>3. නීතිමය සහ ප්‍රතිපත්තිමය රාමුව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් දියත් කිරීම.<br>4. ආයතනික අනුකූලතා අනුපාතය වැඩි කිරීම<br>5. බලාත්මක කිරීමේ ක්‍රියා මාර්ග ගණනය. | මධ්‍යකාලීන | | | අධිකරණ අමාත්‍යාංශය | අධිකරණ අමාත්‍යාංශය<br>මහ බැංකුව<br>නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව |

| | | | | | |
|---|---|---|---|---|---|
| 4 | ප්‍රතිලාභී හිමිකාරිත්ව අවශ්‍යතා මූල්‍ය ක්‍රියාකාරී කාර්ය සාධක බලකායේ (FATF) ප්‍රමිතීන්ට අනුකූල කිරීම සඳහා සමාගම් පනත සමාලෝචනය කර අවශ්‍ය නම් සංශෝධනය කිරීම. | 1. සමාලෝචන කමිටුවක් පත් කිරීම.<br>2. මූලික සමාලෝචනය සම්පූර්ණ කිරීම.<br>3. පාර්ශ්වකරුවන් සඳහා උපදේශන සම්පූර්ණ කිරීම.<br>4. අවශ්‍ය සංශෝධන ඇතුළත් කර නීති සම්පාදනය කිරීම.<br>5. සම්පාදිත නීතිය පිළිබඳ දැනුවත් කිරීම. | මධ්‍යකාලීන | අධිකරණ අමාත්‍යාංශය | අධිකරණ අමාත්‍යාංශය<br>සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව<br>නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව |
| 5 | ප්‍රචාරක දායකත්වයේ ප්‍රමාණය සහ මූලාශ්‍ර හෙළිදරව් කිරීමේ ලේඛනයක් ඇතුළත් කිරීමේ අවශ්‍යතාවය තීරණය කිරීම සඳහා මැතිවරණ නීති සමාලෝචනය කිරීම. | 1. සමාලෝචන කමිටුවක් පත් කිරීම.<br>2. මූලික සමාලෝචනය සම්පූර්ණ කිරීම.<br>3. පාර්ශ්වකරුවන් සඳහා උපදේශන සම්පූර්ණ කිරීම.<br>4. අවශ්‍ය සංශෝධන ඇතුළත් කර නීති සම්පාදනය කිරීම.<br>5. සම්පාදිත නීතිය පිළිබඳ දැනුවත් කිරීම. | මධ්‍යකාලීන | අධිකරණ අමාත්‍යාංශය | අධිකරණ අමාත්‍යාංශය<br>මැතිවරණ කොමිෂන් සභාව<br>නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව |
| 6 | අපරාධවලින් උපයාගත් දේපළ පනත ඒකාබද්ධ කොට සම්මත කරගනිමින් ගෝලීය මනා භාවිතාවන්ට අනුකූල වන පරිදි සකස් කළ පුළුල් නීති සම්පාදනය කිරීම | 1. නීති කෙටුම්පත් කිරීම<br>2. පාර්ශ්වකරුවන් සඳහා උපදේශන පැවැත්වීය.<br>3. කෙටුම්පත අවසන් කර සම්මත කිරීම.<br>4. නීති සම්පාදනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් දියත් කිරීම. | කෙටිකාලීන | අධිකරණ අමාත්‍යාංශය | අධිකරණ අමාත්‍යාංශය<br>මූල්‍ය බුද්ධි ඒකකය<br>නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව |

| | | | | | |
|---|---|---|---|---|---|
| 7 | රාජ්‍ය ආයතනවල මූල්‍ය කටයුතු සඳහා අධීක්ෂණ යාන්ත්‍රණ වැඩි දියුණු කිරීම සඳහා ජාතික විගණන පනතේ ඵලදායී ක්‍රියාත්මක කිරීම සමාලෝචනය කර ශක්තිමත් කිරීම. | 1. සමාලෝචන කමිටුවක් පත් කිරීම.<br>2. මූලික සමාලෝචනය සම්පූර්ණ කිරීම.<br>3. පාර්ශ්වකරුවන් සඳහා උපදේශන සම්පූර්ණ කිරීම.<br>4. අවශ්‍ය සංශෝධන ඇතුළත් කර නීති සම්පාදනය කිරීම.<br>5. සම්පාදිත නීතිය පිළිබඳ දැනුවත් කිරීම. | මධ්‍යකාලීන | අධිකරණ අමාත්‍යාංශය | අධිකරණ අමාත්‍යාංශය<br>විගණන සේවා කොමිෂන් සභාව<br>නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව |
| 8 | දූෂණ විරෝධී ප්‍රයත්නවල අන්‍යෝන්‍ය නීති ආධාර සඳහා නීතිමය, ආයතනික සහ මෙහෙයුම් රාමුව ශක්තිමත් කිරීම සඳහා යෝජනාවක් සකස් කිරීම. | 1. නීතිමය සහ ප්‍රතිපත්තිමය රාමුව සකස් කිරීම.<br>2. පාර්ශ්වකරුවන් සඳහා උපදේශන පැවැත්වීම<br>3. කෙටුම්පත අවසන් කර සම්මත කරගැනීම. | මධ්‍යකාලීන | අධිකරණ අමාත්‍යාංශය | අධිකරණ අමාත්‍යාංශය<br>නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව |
| 9 | රාජ්‍ය ප්‍රතිපත්ති මූලධර්ම තුළ දූෂණයෙන් නිදහස් වීමේ අයිතිය හඳුනා ගන්නා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විධිවිධානයක් ඇතුළත් කිරීමට යෝජනා කිරීම. | 1. යෝජනා කෙටුම්පත සම්පූර්ණ කරගැනීම.<br>2. පාර්ශ්වකරුවන් සඳහා උපදේශන පැවැත්වීම.<br>3. අවශ්‍ය පරිදි යෝජනාව සංශෝධනය කරගැනීම.<br>4. යෝජනාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කරගැනීම. | මධ්‍යකාලීන | අධිකරණ අමාත්‍යාංශය | අධිකරණ අමාත්‍යාංශය<br>නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව |
| උප අරමුණ 2: දූෂණ විරෝධී ක්‍රියා මාර්ගවල ඵලදායිතාව වැඩි දියුණු කිරීම සඳහා ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ ආරම්භ කිරීම සහ ක්‍රියාත්මක කිරීම. | | | | | |
| 1 | 2023 අංක 9 දරණ දූෂණ විරෝධී පනත ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ගෝපදේශ සකස් කිරීම. | 1. අවශ්‍ය මාර්ගෝපදේශ කෙටුම්පත් කිරීම.<br>2. පාර්ශ්වකරුවන් සඳහා උපදේශන පැවැත්වීම.<br>3. කෙටුම්පත අවසන් කර සම්මත කරන ගැනීම.<br>4. මාර්ගෝපදේශ භාවිතය පිළිබඳ 100%ක පුහුණුවක් පැවැත්වීම. | කෙටිකාලීන | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2 | සුපිළිපන්බව සහ වගවීම වැඩිදියුණු කිරීම සඳහා පාර්ලිමේන්තු ස්ථාවර නියෝග සංශෝධනය කිරීම. විශේෂයෙන් පාර්ලිමේන්තු විසුරුවා හැරීමේ කාල සීමාව තුළ රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාවේ (COPA), පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COPE) කටයුතුවලට බාධා ඇතිවීම වැළැක්වීම. | 1. සමාලෝචන කමිටුවක් පත් කිරීම.<br>2. මූලික සමාලෝචනය සම්පූර්ණ කිරීම.<br>3. පාර්ශ්වකරුවන් සඳහා උපදේශන සම්පූර්ණ කිරීම.<br>4. අවශ්‍ය සංශෝධන ඇතුළත් කර නීති සම්පාදනය කිරීම.<br>5. සංශෝධිත ස්ථාවර නියෝග පිළිබඳ 100%ක පුහුණුවක් පැවැත්වීම. | කෙටිකාලීන | පාර්ලිමේන්තුව | පාර්ලිමේන්තුව |
| උප අරමුණ 3: ජාත්‍යන්තර දූෂණ විරෝධී වගකීම් සහ ප්‍රමිති වලට අනුකූල වීම සහතික කිරීම. | | | | | |
| 1 | දූෂණයට එරෙහිව සටන් කිරීමේ සහයෝගීතා ප්‍රයත්න වැඩි දියුණු කිරීම සඳහා කලාපීය, ජාත්‍යන්තර සංවිධාන සහ දූෂණ විරෝධී ඒජන්සි සමග හවුල්කාරිත්වයන් ගොඩනඟා ගැනීම. | 1. හවුල්කාරිත්ව ගිවිසුම් පිහිටුවීම.<br>2. තොරතුරු හුවමාරු කරගන්නා යාන්ත්‍රණයක් සකස් කිරීම. | කෙටිකාලීන<br>දීර්ඝකාලීන | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව |
| 2 | දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ (UNCAC) වගකීම් නිසි පරිදි ඉටු කරන්නේදැයි වරින් වර ඇගයීමකට ලක් කර අනුකූලතාවය තහවුරු කර ගැනීම සඳහා ක්‍රියාත්මක කිරීමේ දී ඇතිවන අඩුපාඩු හඳුනාගෙන ඒවා නිවැරදි කිරීම. | 1. කාලානුරූපී ඇගයීම් සඳහා ඉදිරිපත් කිරීම.<br>2. නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම. | කෙටිකාලීන<br>දීර්ඝකාලීන | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව |

| | | | | | |
|---|---|---|---|---|---|
| 3 | පාරිභෝගික නිසි සැලකිල්ල, විද්‍යුත් ගනුදෙනුවල මුදල් වටිනාකම් හුවමාරු සේවා සහ අභ්‍යන්තර පාලනයන් කෙරෙහි අවධානය යොමු කරමින් මූල්‍ය ක්‍රියාකාරීත්ව කාර්ය සාධක බලකාය (FATF) ඇගයීමේ දී හඳුනාගත් පවතින ගැටලු විසඳීම සඳහා අඛණ්ඩව කටයුතු කිරීම. | 1. අවම වශයෙන් ගැටලු 75%ක් විසඳීම.<br>2. නිසි ක්‍රියා මාර්ග ක්‍රියාත්මක කිරීම වැඩිදියුණු කිරීම.<br>3. අවම වශයෙන් 70%ක පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් සම්පූර්ණ කිරීම. | කෙටිකාලීන දීර්ඝකාලීන | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | මහ බැංකුව<br>මූල්‍ය බුද්ධි ඒකකය<br>අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව |



ඇස් - සුපරීක්ෂාකාරීත්වය

# දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය සහ ඇගයීම

# 07. දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය සහ ඇගයීම.

දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්මේ (NACAP) ඵලදායීතාවය රඳා පවතින්නේ එම ක්‍රියාකාරී සැලැස්ම සාර්ථකව ක්‍රියාත්මක කිරීම මත පමණක් නො ව, ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම පිළිබඳ ශක්තිමත් අධීක්ෂණයක් මත ද වේ. දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්මහි අවධාරණය කරන ලද සමස්ත සමාජ ප්‍රවේශය මගින්, දූෂණය මුල් බැස ගැනීම වැළැක්වීම සඳහා සියලුම අංශයන්හි අඛණ්ඩ සහයෝගීතාවයක් අවශ්‍ය බව හඳුනා ගනී. රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ සෑම ආයතනයකටම, මෙම ක්‍රියාකාරී සැලැස්ම සම්පූර්ණයෙන් පිළිගෙන ක්‍රියාත්මක කිරීමේ දී, ඉහත උපාය මාර්ගවල දක්වා ඇති පරිදි සුපිළිපන්න බව සහ දූෂණ විරෝධී මුලපිරීම් ක්‍රියාවට නැංවීමේ තීරණාත්මක කාර්යභාරයක් පැවරේ.

ඒ සමගම, ඵලදායී අධීක්ෂණය මගින්, දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්මහි හඳුනාගෙන ඇති ක්‍රියාත්මක කරන ආයතන විසින් තම උපාය මාර්ග කාර්යක්ෂමව හා ඵලදායීව ක්‍රියාත්මක කිරීම සහතික කරන අතර, එමගින් දූෂණ විරෝධී රාමුව ශක්තිමත් කරනු ලැබේ. මෙම ක්‍රියාවලිය මගින්, ස්ථාපිත ඉලක්ක සහ නිර්ණායකයන්ට සාපේක්ෂව එම ආයතනවල කාර්යසාධනය නිතිපතා ඇගයීමට ලක් කිරීම සිදු කෙරේ. අධීක්ෂණය මගින්, ප්‍රගතිය නිරීක්ෂණය කිරීම, අභියෝග හඳුනා ගැනීම සහ කඩිනම් මැදිහත්වීම් සිදු කිරීම තුළින් සම්පත් වෙන් කිරීම උපරිම කිරීමට සහ මෙහෙයුම් ක්‍රියාවලීන් වැඩිදියුණු කිරීමට සහාය වේ. ආයතන ඔවුන්ගේ ක්‍රියාකාරකම් සහ ප්‍රතිඵල සඳහා වගකිව යුතු බැවින් ඵලදායී අධීක්ෂණය වගවීම දිරිමත් කරයි. මෙම විනිවිදභාවය දූෂණ විරෝධී රාමුව කෙරෙහි මහජන විශ්වාසය ගොඩනැගීම පමණක් නො ව, ආයතන තුළ සුපිළිපන්න බව සහ සදාචාරාත්මක හැසිරීම් සඳහා කැපවීමක් දිරිමත් කරයි. අවසාන වශයෙන්, ශක්තිමත් අධීක්ෂණය, දූෂණයට එරෙහි සටනේ දී මතුවන අභියෝගයන්ට වඩාත් ඔරොත්තු දෙන සහ ප්‍රතිචාර දැක්වීමේ හැකියාවකින් යුතුව, සමස්ත දූෂණ විරෝධී රාමුවේ ඵලදායීතාවය තවදුරටත් ශක්තිමත් කරයි. එමනිසා, මෙම කොටස විශේෂයෙන්ම දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්මහි අධීක්ෂණය සහ ඇගයීම කෙරෙහි අවධානය යොමු කරයි.

## අ. අධීක්ෂණයේ සහ ඇගයීම්වල අරමුණු

අධීක්ෂණය සහ ඇගයීම්, වැදගත් අරමුණු කිහිපයක් ඉටු කරයි:

- කාර්යක්ෂමව ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා පැහැදිලි ඉලක්ක සහ දර්ශක ස්ථාපිත කිරීම.
- ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳව වරින් වර අධීක්ෂණය කිරීම මගින් ක්‍රියාකාරකම් නියමිත වේලාවට නිම කිරීම සහ කිසියම් බාධක හෝ අභියෝග හඳුනාගෙන ඒවාට විසඳුම් ලබා දීම සහතික කරයි.
- විශේෂයෙන් හැසිරීම්, ක්‍රියාවලීන් හෝ ප්‍රතිඵලවල අපේක්ෂිත වෙනස්කම් හරහා දූෂණය අඩු කිරීම කෙරෙහි ඒවායේ බලපෑම අනුව, විවිධ උපාය මාර්ගවල කාර්යක්ෂමතාව ඇගයීමට ලක් කරයි.
- නිතිපතා ප්‍රගතිය සහ ප්‍රතිඵල පිළිබඳව වාර්තා කිරීම, සාක්ෂි මත පදනම් වූ තීරණ ගැනීම පහසු කිරීම සහ අනාගත දූෂණ විරෝධී ප්‍රයත්නයන් දැනුවත් කිරීම හා වැඩිදියුණු කිරීම සඳහා ප්‍රතිපෝෂණ යාන්ත්‍රණ නිර්මාණය කිරීම මගින් වගවීම සහ ඉගෙනීම දිරිමත් කිරීම.
- අධීක්ෂණ හා ඇගයීම් ක්‍රියාවලියට රජය, සිවිල් සමාජය සහ පෞද්ගලික අංශය ඇතුළු විවිධ පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය හරහා පාර්ශ්වකරුවන් සම්බන්ධ කර ගැනීමෙන් විවිධ දෘෂ්ටිකෝණයන් සහ සහයෝගය සහතික කිරීම.


## ආ. අධීක්ෂණ ව්‍යුහය සහ කණ්ඩායම

ජනාධිපතිවරයා විසින් ජාතික මෙහෙයුම් කමිටුවක් පත් කරනු ලබන අතර, එය ජනාධිපති ලේකම් කාර්යාලය යටතේ කැඳවනු ලැබේ. මෙහෙයුම් කමිටුවේ එක් සාමාජිකයෙකු අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවෙහි අධ්‍යක්ෂ ජනරාල්වරයා වනු ඇත. මෙම ජාතික මෙහෙයුම් කමිටුව, දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්මහි සමස්ත අධීක්ෂණය සහ ඇගයීම සඳහා වගකීම පැවරෙන අවසාන බලයලත් ඒකකය වනු ඇත.

දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සඳහා ස්ථාපිත කර ඇති ස්ථිර ඒකකය හරහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්මෙහි ඵලදායී ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කර ජාතික මෙහෙයුම් කමිටුවට ප්‍රගතිය වාර්තා කරනු ඇත. ඒ අනුව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින්ඃ පහත ක්‍රියාමාර්ග ගත යුතුය.

- වාර්තා කිරීමේ වාර ගණන පිළිබඳ තොරතුරු ඇතුළුව ප්‍රධාන සහ ක්‍රියාත්මක කරන ආයතන සඳහා පැහැදිලි වාර්තාකරණ මාර්ගෝපදේශ සකස් කිරීම.
- යෝජිත ක්‍රියාත්මක කිරීමේ දී ඇතිවන බාධක සහ අභියෝග හඳුනාගැනීම සහ අත්දැකීම් හුවමාරු කර ගැනීම සඳහා පාර්ශ්වකරුවන් සඳහා වරින් වර රැස්වීම් සහ සාකච්ඡා පැවැත්වීම.
- ක්‍රියාත්මක කිරීමේ දී මෙන්ම ප්‍රගතිය අධීක්ෂණය කිරීම සහ වාර්තා කිරීමේ දී ප්‍රධාන සහ ක්‍රියාත්මක කරන ආයතන සඳහා තාක්ෂණික සහාය ලබා දීම.
- වාර්තා කරන ලද දත්තවල ගුණාත්මකභාවය, නිරවද්‍යතාවය, විශ්වසනීයත්වය, අපක්ෂපාතී බව සහ කාලෝචිත බව සහතික කිරීම සඳහා වරින් වර දත්ත තත්ත්ව සමාලෝචන පැවැත්වීම.
- අනාගත ක්‍රියා මාර්ග සහ උපාය මාර්ග දැනුවත් කිරීම සඳහා සාර්ථකත්වයන් සහ මනා භාවිතාවන් පිළිබඳ උදාහරණ ලේඛනගත කිරීම.

මීට අමතරව, ස්වාධීන කොමිසමක් ලෙස අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් පාර්ලිමේන්තුවට ද වෙන වෙනම වාර්තා කරනු ඇත.



දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්මෙහි හඳුනාගෙන ඇති "වගකිවයුතු (ප්‍රධාන) ආයතනය" අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත වාර්තා කිරීමේ මූලික වගකීම දරයි. දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්මෙහි හඳුනාගෙන ඇති "ක්‍රියාත්මක කරන ආයතන" ප්‍රධාන ආයතනයට වරින් වර වාර්තා කිරීමේ වගකීම දරයි. මෙම ආයතනවල අභ්‍යන්තර කටයුතු ඒකක (IAU), ආයතනික ප්‍රතිපත්ති සහ භාවිතයන් දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම සමඟ පෙළගැස්වීමෙන් දූෂණ විරෝධී ජාතික ඉලක්ක සහ උපාය මාර්ගයන්ට පූර්ණ අනුකූලතාවයක් සහතික කිරීමේ කාර්යය භාරව සිටී. ආයතන තුළ දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සඳහා අභ්‍යන්තර කටයුතු ඒකකය ප්‍රධාන සම්බන්ධීකාරකයන් ලෙස කටයුතු කරනු ඇත. වගකිවයුතු (ප්‍රධාන) ආයතනවල අභ්‍යන්තර කටයුතු ඒකක (IAU), දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම යටතේ ඔවුන්ගේ කාර්යයේ ප්‍රගතිය පිළිබඳව ක්‍රියාත්මක කරන ආයතනවලින් (පහත දැක්වෙන කොටසේ හඳුනාගෙන ඇති පරිදි) වරින් වර වාර්තා කැඳවීමේ අතිරේක කාර්යය දරයි.

## ඈ. දර්ශක සහ වාර්තාකරණය

දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්මහි අධීක්ෂණය සහ ඇගයීම සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවෙහි ස්ථාපිත කරන ස්ථිර ඒකකය විසින් දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්මහි අරමුණු සමඟ පෙළගැසෙන විශේෂිත අධීක්ෂණ සහ ඇගයීම් දර්ශක සකස් කරනු ලබන අතර, එමගින් ප්‍රගතිය සහ ඵලදායීතාවය පිළිබඳ සවිස්තරාත්මක තක්සේරුවක් සිදු කිරීමට හැකි වේ. මෙම ඒකකය විසින් පැහැදිලි සහ මැනිය හැකි දර්ශක නිර්මාණය කිරීමෙන් ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය අඛණ්ඩව නිරීක්ෂණය කිරීම පහසු කරනු ලබන අතර, එමඟින් පාර්ශ්වකරුවන්ට සාර්ථකත්වයන් සහ වැඩිදියුණු කළ යුතු ක්ෂේත්‍ර හඳුනා ගැනීමට හැකි වේ.

ආයතන විසින් පහත පරිදි වසරකට වරක් දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම පිළිබඳව වාර්තා කළ යුතු ය:

i. ක්‍රියාත්මක කරන ආයතන විසින් අදාළ ප්‍රධාන ආයතන වෙත වසරකට දෙවරක්, ජුනි සහ නොවැම්බර් මාසවල දී වාර්තා කළ යුතු ය.

ii. ප්‍රධාන ආයතන විසින් දෙසැම්බර් මාසයේ දී අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත වාර්ෂිකව වාර්තා කළ යුතු ය.

iii. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් පෙර දින දර්ශික වර්ෂයේ දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්මහි ප්‍රගතිය පිළිබඳව මාර්තු මාසයේ දී පාර්ලිමේන්තුවට වාර්ෂිකව වාර්තා කළ යුතු ය. ක්‍රියාත්මක කරන ආයතන විසින් අදාළ ප්‍රධාන ආයතන වෙත වසරකට දෙවරක්, ජුනි සහ නොවැම්බර් මාසවල දී වාර්තා කළ යුතු ය.

iv. ප්‍රධාන ආයතන විසින් දෙසැම්බර් මාසයේ දී අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත වාර්ෂිකව වාර්තා කළ යුතු ය.

v. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් පෙර දින දර්ශික වර්ෂයේ දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්මහි ප්‍රගතිය පිළිබඳව මාර්තු මාසයේ දී පාර්ලිමේන්තුවට වාර්ෂිකව වාර්තා කළ යුතු ය.

## ඇ. ක්‍රියාත්මක කිරීමෙන් පසු අධීක්ෂණය සහ ඇගයීම

දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්මෙහි ක්‍රියාත්මක කිරීමෙන් පසු අධීක්ෂණය හා ඇගයීම (Monitoring and Evaluation) මගින්, යොදාගත් උපාය මාර්ගවල දිගුකාලීන බලපෑම සහ ඵලදායීතාවය තක්සේරු කිරීම අත්‍යවශ්‍ය වේ. මෙම අදියර මඟින්, අපේක්ෂිත ඉලක්ක සපුරා ඇත්ද සහ දූෂණය ඵලදායී ලෙස අවම කර ඇත්ද යන්න තීරණය කිරීම සඳහා මුල පිරීම්වල ප්‍රතිඵල ක්‍රමානුකූලව සමාලෝචනය කරනු ලැබේ. ස්ථාපිත දර්ශක ඔස්සේ රැස් කරන ලද දත්ත විශ්ලේෂණය කිරීමෙන්, සාර්ථක වූ උපාය මාර්ග මොනවාද සහ ගැළපීම් අවශ්‍ය වන්නේ කුමන උපාය මාර්ගවලට ද යන්න හඳුනා ගැනීමට පාර්ශ්වකරුවන්ට හැකියාව ලැබේ. මීට අමතරව, ක්‍රියාත්මක කිරීමෙන් පසු අධීක්ෂණය හා ඇගයීම මඟින්, ඉගෙන ගත් පාඩම් රැස් කිරීමට ඉඩ සැලසෙන අතර, එමඟින් දූෂණ විරෝධී ප්‍රයත්නයන්හි අඛණ්ඩ වැඩිදියුණු කිරීම් ප්‍රවර්ධනය කෙරේ. ඒ අනුව, 2029 දී එහි ක්‍රියාත්මක කිරීමේ කාලය අවසන් වන විට, දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්මෙහි

සවිස්තරාත්මක ඇගයීමක්/සමාලෝචනයක් සිදු කරනු ලැබේ. මෙම ඇගයීම/සමාලෝචනය මඟින්, දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම යටතේ ක්‍රියාත්මක කරන ලද උපාය මාර්ග සහ මුලපිරීම් පිළිබඳව සවිස්තරාත්මක ඇගයීමක් සිදු කරනු ලබන අතර, ඒවායේ ඵලදායීතාවය සහ දූෂණය අවම කිරීම කෙරෙහි ඇති සමස්ත බලපෑම තක්සේරු කරනු ලැබේ. මෙම ඇගයීම/සමාලෝචනය මඟින්, ගුණාත්මක සහ ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණය කිරීම තුළින්, දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්මෙහි ශක්තීන් සහ දුර්වලතා පිළිබඳව වටිනා තොරතුරු සම්පාදනය කෙරේ. අනාගත දූෂණ විරෝධී ප්‍රයත්නයන් සඳහා තොරතුරු සැපයීමෙන්, මනා භාවිතාවන් සහ වැඩිදියුණු කළ යුතු ක්ෂේත්‍ර හඳුනා ගැනීමට ද එය උපකාරී වනු ඇත. මෙම ක්‍රමානුකූල සමාලෝචනය මඟින්, ප්‍රතිඵලවල දිගුකාලීන තිරසාර බව අවබෝධ කර ගැනීමටත්, අනාගතයේ දී දූෂණයට එරෙහිව කටයුතු කිරීමේ දී වඩාත් ඵලදායී උපාය මාර්ග සංවර්ධනයට ඉවහල් වන ලෙස ඉගෙන ගත් පාඩම් දායක වන බව සහතික කිරීමටත් උපකාරී වනු ඇත.

| උපාය මාර්ගික අරමුණ 1: මුලපිරීම් සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ ආයතන වෙත නිශ්චිත සහ ප්‍රමාණවත් අයවැයක් වෙන් කිරීම සහතික කිරීම මඟින් දූෂණ විරෝධී ප්‍රයත්නයන් සඳහා තිරසාර මෙහෙයුම් පරිසරයක් ස්ථාපිත කිරීම. | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| No. | වැඩ පිළිවෙළ / ක්‍රියාව අංකය | ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPIs) | කාල රාමුව | | | වගකිවයුතු (ප්‍රමුඛ) ආයතනය | ක්‍රියාත්මක කිරීමේ ආයතන |
| | | | කෙටි | මධ්‍ය | දීර්ඝ | | |
| 1 | දූෂණ විරෝධී මුලපිරීම් සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ආයතන වෙත නිශ්චිත සහ ප්‍රමාණවත් අයවැයක් වෙන් කිරීම සහතික කිරීම | 1. වාර්ෂිකව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත වෙන් කරන ලද අයවැයෙන් 100%ක් නිකුත් කිරීම.<br>2. වසරකට අරමුදල් සපයනු ලබන දූෂණ විරෝධී වැඩසටහන් ගණන.<br>3. පසුගිය වර්ෂවලට සාපේක්ෂව දූෂණ විරෝධී මුලපිරීම් සඳහා අයවැය වෙන් කිරීම්වල වැඩි වීමක්. | කෙටිකාලීන<br>දීර්ඝකාලීන | | | පාර්ලිමේන්තුව | පාර්ලිමේන්තුව<br>මුදල් අමාත්‍යාංශය |
| 2 | දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්මේ (NAP) ක්‍රියාකාරකම් සඳහා සහාය වීම පිණිස සෑම සැලසුම් වර්ෂයකදීම අවශ්‍ය වන අයවැය වෙන් කිරීම්වල ඇස්තමේන්තුගත විෂය පථය තක්සේරු කිරීම සහ නිර්වචනය කිරීම | 1. අයවැය තක්සේරු වාර්තාව වාර්ෂිකව සම්පූර්ණ කර ඉදිරිපත් කිරීම.<br>2. ඇස්තමේන්තුගත අයවැය අවශ්‍යතා සහ සත්‍ය වෙන් කිරීම් අතර 20%ට අඩු වෙනසක්.<br>3. අයවැය සැලසුම් කිරීම සඳහා සිදු කරන ලද පාර්ශ්වකරුවන්ගේ සාකච්ඡා ගණන. | කෙටිකාලීන<br>දීර්ඝකාලීන | | | මුදල් අමාත්‍යාංශය | සියලුම ක්‍රියාත්මක කරන ආයතන |

| | | | | | |
|---|---|---|---|---|---|
| 3 | දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්මෙහි දක්වා ඇති ක්‍රියාකාරකම් සඳහා සහාය වීම පිණිස ජාතික අයවැය තුළ ක්‍රියාත්මක කරන ආයතන වෙත ප්‍රමාණවත් මූල්‍ය සම්පත් අනුමත කර වෙන් කිරීම | 1. සියලුම මූල්‍ය සම්පත් නියමිත වේලාවට අනුමත කර වෙන් කිරීම 100%ක්.<br>2. දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම අවශ්‍යතාවලට අනුකූලව සම්පූර්ණ අයවැය වෙන් කිරීම් ලැබෙන ආයතන ගණන.<br>3. වෙන් කරන ලද අයවැය තුළ ක්‍රියාත්මක කරන ලද සැලසුම්ගත දූෂණ විරෝධී ක්‍රියාකාරකම් ගණන. | කෙටිකාලීන<br>දීර්ඝකාලීන | පාර්ලිමේන්තුව | මුදල් අමාත්‍යාංශය |
| උපාය මාර්ගික අරමුණ 2: දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්මේ ඵලදායීතාවය සහ බලපෑම තක්සේරු කිරීම සඳහා ශක්තිමත් අධීක්ෂණ සහ ඇගයීම් රාමුවක් ක්‍රියාත්මක කිරීම | | | | | |
| 1 | දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්මෙහි අධීක්ෂණය සහ ඇගයීම සඳහා කේන්ද්‍රස්ථානය ලෙස ජාතික මෙහෙයුම් කමිටුව පත් කිරීම. | 1. ජාතික මෙහෙයුම් කමිටුව පත් කිරීම.<br>2. අධීක්ෂණ සහ ඇගයීම් රාමුවක් සකස් කිරීම. | කෙටිකාලීන | ජනාධිපති ලේකම් කාර්යාලය<br>අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | ජනාධිපති ලේකම් කාර්යාලය<br>අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව |
| 2 | දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්මෙහි 'වගකිවයුතු ආයතන' ලෙස නම් කර ඇති ආයතන වෙත, 'ක්‍රියාත්මක කරන ආයතන' වෙතින් ක්‍රියාත්මක කිරීම් පිළිබඳ යාවත්කාලීන තොරතුරු ලබා ගැනීමේ වගකීම සහ, නියමිත කාල පරාසයන් තුළ දී මෙම සොයාගැනීම් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත වාර්තා කිරීමේ වගකීම පැවරීම | 1. සියලුම වගකිවයුතු ආයතන සම්පූර්ණයෙන්ම නියමිත වේලාවට වාර්තා ඉදිරිපත් කිරීම.<br>2. කාර්තුවකට ක්‍රියාත්මක කරන ආයතනවලින් ලැබෙන යාවත්කාලීන තොරතුරු ගණන.<br>3. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත වාර්තා කරන ලද ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතියේ ප්‍රතිශතය. | කෙටිකාලීන | ජනාධිපති ලේකම් කාර්යාලය<br>අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | සියළුම ක්‍රියාත්මක කරන ආයතන |

| | | | | | |
|---|---|---|---|---|---|
| 3 | දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය කිරීම සහ සොයාගැනීම් ජාතික මෙහෙයුම් කමිටුවට සහ පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව තුළ ස්ථිර ඒකකයක් ස්ථාපිත කිරීම. එම ඒකකයේ රාජකාරිවලට ඇතුළත් වන්නේ:<br><br>අ. දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම සඳහා ක්‍රියාත්මක කිරීමේ දර්ශක අවසන් කර සම්මත කර ගැනීම.<br><br>ආ. දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම හා සම්බන්ධ ආයතනික ක්‍රියාකාරී සැලසුම්වල වාර්ෂික ප්‍රගතිය ඇගයීම.<br><br>ඇ. ප්‍රමාදයන් හෝ අනුකූල නොවීම් සම්බන්ධයෙන් හඳුනාගත් ආයතන සමඟ අභියෝගවලට මුහුණදීම සඳහා උපදේශන සැසි පැවැත්වීම.<br><br>ඉ. දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම පිළිබඳව වාර්ෂික තක්සේරුවක් සිදු කිරීම. සෑම වසරකම මාර්තු මස අවසානය වන විට, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් පසුගිය වසරේ දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම. | 1. සියලුම ක්‍රියාත්මක කිරීමේ දර්ශක සම්පූර්ණයෙන් අවසන් කර අනුමත කිරීම.<br><br>2. සියලුම මූලික දත්ත එකතු කිරීම.<br><br>3. සියලුම ආයතන සම්පූර්ණ වාර්ෂික ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීම.<br><br>4. අවධානයට ලක් වූ ආයතන සමඟ පවත්වන ලද උපදේශන සැසි ගණන.<br><br>5. වාර්ෂික දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ තක්සේරු වාර්තා ප්‍රකාශයට පත් කිරීම.<br><br>6. මහජන අදහස් තක්සේරු කිරීමේ යාන්ත්‍රණ ස්ථාපිත කිරීම.<br><br>7. පාර්ලිමේන්තුවට සහ ජාතික මෙහෙයුම් කමිටුවට ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තා ගණන. | කෙටිකාලීන | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව<br><br>සහ<br><br>සියළුම ක්‍රියාත්මක කරන ආයතන |

| | | | | | |
|---|---|---|---|---|---|
| | පිළිබඳව ප්‍රසිද්ධියේ වාර්තා කළ යුතු අතර, එහි හොඳ සහ නරක භාවිතයන් ඉස්මතු කරමින්, අනුකූල නොවන ආයතන සහ එහි ප්‍රධානීන් හඳුනාගත යුතු ය.<br>ඊ. දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මහජනතාවගේ ආකල්ප පිළිබඳ ස්වාධීන තක්සේරුවක් සඳහා යාන්ත්‍රණයක් සකස් කිරීම.<br>උ. දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පාර්ලිමේන්තුවට සහ ජාතික මෙහෙයුම් කමිටුවට වාර්තා කිරීම. | | | | |
| 4 | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවෙහි ස්ථිර ඒකකයට, තොරතුරු ඉල්ලා සිටීමේ සහ ලබා ගැනීමේ බලය, සම්බන්ධීකරණ රැස්වීම්වලට සහභාගී වීමට ආයතනවලට නියෝග කිරීමේ බලය සහ වගකිවයුතු ආයතනවලින් ක්‍රියාත්මක කිරීමේ වාර්තා ඉදිරිපත් කරවන බලය ලබා දීම. | 1. තොරතුරු ඉල්ලීම්වලට ආයතනවලින් අවම වශයෙන් 80%ක් ප්‍රතිචාර දැක්වීම.<br>2. වගකිවයුතු ආයතන විසින් සහභාගී වූ සම්බන්ධීකරණ රැස්වීම් ගණන.<br>3. වගකිවයුතු ආයතනවලින් අවම වශයෙන් 80%ක් නියමිත වේලාවට ක්‍රියාත්මක කිරීමේ වාර්තා ඉදිරිපත් කිරීම. | කෙටිකාලීන | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | සියළුම ක්‍රියාත්මක කරන ආයතන |

| | | | | | |
|---|---|---|---|---|---|
| 5 | වගකිවයුතු ආයතන, ක්‍රියාත්මක කරන ආයතනවලින් යාවත්කාලීන තොරතුරු ලබා ගන්නා බවත්, මෙම සොයාගැනීම් ජාතික මෙහෙයුම් කමිටුවට නිතිපතා වාර්තා කරන බවත් සහතික කිරීම. | 1. සියලුම වගකිවයුතු ආයතන 100%ක්, ක්‍රියාත්මක කරන ආයතනවලින් යාවත්කාලීන තොරතුරු ඉල්ලා සිටීම.<br><br>2. ජාතික මෙහෙයුම් කමිටුවට වාර්ෂිකව ඉදිරිපත් කරන වාර්තා ගණන. | කෙටිකාලීන දීර්ඝකාලීන | ජනාධිපති ලේකම් කාර්යාලය<br><br>අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | සියළුම ක්‍රියාත්මක කරන ආයතන |
| 6 | අධීක්ෂණ සහ ඇගයීම් ක්‍රියාවලීන්ට සම්බන්ධ කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම. | 1. සියලුම පුහුණු මෙවලම් සම්පාදනය කිරීම.<br><br>2. පැවැත්වූ පුහුණු සැසි ගණන.<br><br>3. පුහුණුවට සහභාගී වීමේ අනුපාතය අවම වශයෙන් 90%ක් වීම.<br><br>4. පුහුණුව සාර්ථකව නිම කිරීමේ අනුපාතය අවම වශයෙන් 95%ක් වීම.<br><br>5. පුහුණුවෙන් පසු දැනුම තක්සේරු කිරීම්වල දී මෙහෙයුම්මය සහ විෂයානුබද්ධ අංශ පිළිබඳ අවබෝධය සහ දැනුම රඳවා ගැනීම සාමාන්‍යයෙන් 80%ක් වීම. | කෙටිකාලීන මධ්‍යකාලීන | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | සියළුම ක්‍රියාත්මක කරන ආයතන |
| 7 | දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්මෙහි අඛණ්ඩ ප්‍රගතිය පිළිබඳව නිතිපතා සමාලෝචනයක් සිදු කර, අදාළ ආයතන වෙත නිරීක්ෂණ, නිර්දේශ සහ යෝජනා ඉදිරිපත් කිරීම. | 1. වාර්ෂිකව සිදු කරන ප්‍රගති සමාලෝචන සංඛ්‍යාව.<br><br>2. අවම වශයෙන් නිර්දේශවලින් 80%ක් ක්‍රියාත්මක කිරීම.<br><br>3. අදාළ පාර්ශ්වකරුවන් සමඟ බෙදාගත් වාර්තා ගණන. | කෙටිකාලීන මධ්‍යකාලීන | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව<br><br>ජාතික මෙහෙයුම් කමිටුව | සියළුම ක්‍රියාත්මක කරන ආයතන |

| | | | | | |
|---|---|---|---|---|---|
| 8 | දූෂණ විරෝධී ක්‍රියා මාර්ගවල ඵලදායීතාවය පිළිබඳව සිවිල් සමාජය, පෞද්ගලික අංශය සහ මහජනතාවගෙන් ප්‍රතිපෝෂණ ලබාගැනීම සඳහා යාන්ත්‍රණ ස්ථාපිත කිරීම සහ ප්‍රතිපත්තිමය වෙනස්කම් සඳහා එම ප්‍රතිපෝෂණ භාවිත කිරීම. | 1. ස්ථාපිත කරන ලද ප්‍රතිපෝෂණ යාන්ත්‍රණ ගණන.<br>2. ලැබුණු ප්‍රතිපෝෂණයෙන් අවම වශයෙන් 70%ක් විශ්ලේෂණය කර ප්‍රතිපත්තිවලට ඇතුළත් කිරීම.<br>3. දූෂණ විරෝධී ප්‍රයත්නයන් සම්බන්ධයෙන් මහජන තෘප්තිමත්භාවය අවම වශයෙන් 70%ක් වීම. | කෙටිකාලීන<br>දීර්ඝකාලීන | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව<br>ජාතික මෙහෙයුම් කමිටුව | සියළුම ක්‍රියාත්මක කරන ආයතන |
| 9 | රජයේ ආයතන ඇගයීම සඳහා වාර්ෂික සුපිළිපන්න දර්ශකයක් නිර්මාණය කිරීම. | 1. වාර්ෂික සුපිළිපන්න දර්ශකය සකස් කර ප්‍රකාශයට පත් කිරීම.<br>2. සුපිළිපන්න දර්ශකය යටතේ ඇගයීමට ලක් කරන ආයතන ගණන.<br>වසරින් වසර ආයතන ලකුණු වල අවම වශයෙන් 30%ක වෙනසක්. | කෙටිකාලීන<br>මධ්‍යකාලීන | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | සියළුම ක්‍රියාත්මක කරන ආයතන |
| 10 | දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම පිළිබඳව ප්‍රතිපෝෂණ ලබා ගැනීම සඳහා සිවිල් සමාජය, අංශ නියෝජිතයින් සහ කලාපීය නියෝජිතයින් සමඟ අඛණ්ඩව සාකච්ඡා පැවැත්වීම සඳහා යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම සහ මෙම ප්‍රතිපෝෂණය ප්‍රතිපත්තිමය වෙනස්කම් සඳහා යොදා ගැනීම. | 1. වාර්ෂිකව පවත්වනු ලබන සාකච්ඡා ගණන.<br>2. සාකච්ඡාවලින් ලැබෙන නිර්දේශවලින් අවම වශයෙන් 70%ක් ප්‍රතිපත්තියට ඇතුළත් කිරීම.<br>3. සම්බන්ධ කරගත් කලාපීය නියෝජිතයින් ගණන. | කෙටිකාලීන | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව<br>ජාතික මෙහෙයුම් කමිටුව | සියළුම ක්‍රියාත්මක කරන ආයතන |
| 11 | වාර්ෂික අධීක්ෂණ වාර්තා සහ අවසාන ඇගයීම් වාර්තා සකස් කර ඒවා අන්තර්ජාලය හරහා ප්‍රකාශයට පත් කිරීම. | 1. වාර්ෂිකව ප්‍රකාශයට පත් කරන ලද අධීක්ෂණ වාර්තා ගණන.<br>2. සියලුම ඇගයීම් වාර්තා මහජනතාවට ලබා දීම.<br>3. වාර්තා සඳහා අන්තර්ජාලය හරහා පිවිසීම්/බාගත කිරීම් ගණන. | කෙටිකාලීන<br>දීර්ඝකාලීන | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව<br>ජාතික මෙහෙයුම් කමිටුව | සියළුම ක්‍රියාත්මක කරන ආයතන |

# කෘතවේදීත්වය

අතීතයේ සිටම මානවයා සිය ස්නේහයෙන් පිරි කෘතවේදීත්වය ගහ කොළ සතාසිවුපාවන් වැනි ප්‍රාණීය සංස්කාරයන්ට පමණක් නො ව ධරණීයතලය සිසාරා යන සියුම් වායු අංශුන්ට ද පුද කළේය.එසේම ඉවසීමෙන් පොළොව මූර්තිමත් කරන ගොවීන්ට සහ එහිලා කැපවෙන සියලු සහෘදයන්, ජීවිත කැන්වසය ආදරයෙන් පින්තාරු කරන මව පියා ඇතුළු සියලුම ළබැඳියන්ට ද අනේකවාරයක් සිය ස්තුතිය පළ කළේය.

ඉතිහාසය පුරාම, විද්‍යාඥයන් ඔවුන්ගේ පූර්වගාමීන්ට සහ ඔවුන්ගේ සොයා ගැනීම්වලට ගැඹුරු කෘතඥතාව පළ කර ඇති අතර, ඔවුන් ගොඩනගාගත් අත්තිවාරම පිළිගෙන ඇත. වඩාත්ම කැපිපෙනෙන උදාහරණය වන්නේ ඇල්බට් අයිස්ටයින් ය. ඔහු ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරන ලද්දේ, අයිසැක් නිව්ටන්ගේ කෘති ඔහුගේ න්‍යායන් සඳහා ආප්තය සැපයූ බවයි. ඔහුගේ සුප්‍රසිද්ධ ප්‍රකාශයක් වනුයේ "මම, යෝධයන්ගේ උරහිස් මතින් නැගී සිටියෙමි"යන්නයි. මෙම හැඟීම විද්‍යාත්මක ක්ෂේත්‍ර හරහා දෝංකාර දෙන අතර, සෑම සොයාගැනීමක්ම පෙර සිටි අයගේ කුතුහලය සහ තීක්ෂණ බුද්ධියට ස්තුතිවන්නට ගොඩනගා ඇති පියවරකි.

ගැඹුරු ගුණධර්මයක්වන කෘතවේදීතාව, විවිධ ආගමික මතවාදයන් හරහා ගම්‍යමාන වන තර එය බොහෝවිට අධ්‍යාත්මික වර්ධනයට මාර්ගයක් ලෙස සැලකේ. බුදුදහම තුළ කෘතවේදීතාව සිහිකල්පනාව වර්ධනය කරයි. වර්තමාන මොහොත සහ සියලු ජීවීන් අගය කිරිම දිරිමත් කරයි. බුදුහිමියන් ආචාර්යවරුන්ට, දෙමාපියන්ට මෙන්ම තමන්ට බුද්ධත්වයට පත්වීමට සෙවණදුන් ඇසතු බෝරුකට පවා අනිමිස ලෝචන පූජාවෙන් කෘතවේදීත්වය පළ කළේය. ක්‍රිස්තියානි දහම තුළ ස්තුතිය දීම යනු නිහතමානිකමේ පිළිබිඹු වක් වන අතර හින්දු ආගම යෝග කර්ම උගන්වනුයේ පරාර්ථකාමී ක්‍රියාව දිව්‍යමය දේ කෙරෙහි කෘතඥපූර්වක භක්තිය සමඟ බැඳී ඇති බවයි. ඉස්ලාමයේ, "මිනිසුන්ට කෘතඥ නොවන තැනැත්තා දෙවියන් වහන්සේට කෘතඥ වන්නේ නැත." යනුවෙන් දැක්වේ. මෙම විශ්වාසයන් තුළ ආචාරශිලී බව ඉක්මවා යන පූජනීයත්වයක් උරුමකොට ගනී.

රටක් සමෘද්ධිමත් වන්නේ එහි ජනතාව, ගැඹුරු, අන්තර් සම්බන්ධිත සහ කරුණාවෙන් පදනම් වූ බලවත් ගසක මුල් මෙන් වූ විට ය. ගෞරවයේ මෘදු කලාව වන ආචාරශීලීත්වය විශ්වාසය සහ අවබෝධය එය පෝෂණය කරන පසයි. මෙම සාරවත් භූමියේ, අනෙකුත් වටිනාකම් වන අවංකබව, දයානුකම්පාව, ඉවසීම සහ සුපිළිපන්බව යන ගුණාංග හොඳින් සකස් කරන ලද උද්‍යානයක පුෂ්පයන් මෙන් ය. ජාතියක් සමෘද්ධි වන්නේ සිනහවක නිහඬ හුවමාරුව, සහකම්පනය සහ අවබෝධය තුළ ය. මෙම පිළිබිඹුවේ කැඩපත වන්නේ තුති පිදීමයි.

මෙම සමස්ත සැකැස්ම සමාජය පිරිපහදු කළ කතිකාවක් වැනි ය. තුන්කල් දක්නා නුවණින් යුතු සියලුම පාර්ශවකරුවන්ගේ දූරදර්ශි අදහස් එක පිඩකට ගොනුකර ගන්නට දිගු කාලයක් තිස්සේ මේ වෙනුවෙන් දහදිය හෙළූ ධූරාවලි අනුගතවීමකින් තොරව සියලු මිනිසුන්ගේ කැපවීම සහ බුද්ධිමය දායකත්වය මත ය. එබැවින් මෙම කර්තව්‍යය ඔවුන් තම දෙවුර මත දරා සිටියේ පහන් සිතින් මිස නැවත යමක් බලාපොරොත්තුවෙන් නුවුවද, ඔවුනට කෘතවේදීත්වය පිදීම අපගේ යුතුකමයි.

මෙම දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම නිර්මාණය කිරීමේදී ගොනුකරගත් අදහස් හා යෝජනා මෙන්ම මිඩංගු කළ කාලය තක්සේරු කළ නොහැකි අමිල වටිනාකමකින් යුක්ත ය. ශ්‍රී ලාංකීය අනාගතය නව මානයකට ඔසවා තැබීමට ඔවුන් කරන ලද දායකත්වය වෙනුවෙන් මේ අන්දමින් මතක සටහන් තබමු.

ශ්‍රී ලංකා දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම 2025-2029 සකස් කිරීමෙහි ලා අදහස් දක්වමින් මෙන්ම අනුමත කිරීමෙහි ලා සිය දායකත්වය ලබාදුන් රාජ්‍ය තන්ත්‍රයේ නීති හදන තැන, නිතිය ක්‍රියාත්මක කරන තැන මෙන්ම යුක්තිය පසිදලන තැන, ගරු ජනාධිපතිතුමා ප්‍රධාන කැබිනට් මණ්ඩලයට ගරු කතානායකතුමා ප්‍රමුඛ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට, ගරු අගවිනිසුරුතුමා ප්‍රමුඛ විනිසුරු මඩුල්ලට කෘතවේදී වෙමු.

මෙම සැලැස්ම සකස් කිරීමෙහි ලා රාජ්‍ය අංශයේ ප්‍රධාන මග පෙන්වන්නා වෙමින් ජනාධිපති ලේකම්තුමා ප්‍රධාන කාර්ය මණ්ඩලය අභ්‍යන්තර සබඳතා කමිටු පිහිටුවීම මුල්කොට ගනිමින් ලබාදුන් මහඟු දායකත්වය ශ්‍රී ලංකාව පුරා රාජ්‍ය ආයතනහි දූෂණ විරෝධී සංස්කෘතියක් බිහිකිරීමට මුලාරම්භයක් විය. රාජ්‍ය පරිපාලන පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය මෙන්ම සියලු අමාත්‍යංශ, දෙපාර්තමේන්තු සංස්ථා, මණ්ඩලවල නිලධාරින් ද, ස්වාධින කොමිෂන් සභා ද, ගරු නීතිපතිතුමා සහ නිලධාරීන්, මහා භාණ්ඩාගාරයේ නිලධාරින් මෙන්ම රටපුරා රාජ්‍ය අංශයේ අදහස් තොරතුරු එක්රැස් කිරීමේ දී සහය දුන් රාජ්‍ය අංශයේ සියලු ආයතන සහ නිලධාරීන් කෘතවේදීව සිහිපත්කරමු.

තම වගකීම වටහා ගනිමින් අදහස් ලබාදීමට, ලබා ගැනීමට සහ සියලුම සාකච්ඡාවන්ට සම්බන්ධ වූ සියලු ආගමික ප්‍රධානීන්ට, විදේශීය රාජ්‍ය නියෝජිතයන්ට, විශේෂඥයන්ට, පෞද්ගලික අංශයේ පාර්ශ්වකරුන්ට, සිවිල් සමාජ, ප්‍රජාපාදක සංවිධාන, මාධ්‍ය, වෘත්තීය සංවිධාන, ජාත්‍යන්තර සංවිධාන, කලාකරුවන්, අධ්‍යයන අංශ, විශ්වවිද්‍යාල, තරුණ ප්‍රජාව, විශේෂ අවශ්‍යතා ඇති ප්‍රජාව හා දරුවන්, ඇතුළු සමස්ත මහජනතාව හා පාර්ශ්වකරුවන් තම වටිනා කාලය දූෂණ විරෝධී සංස්කෘතියක්, සුපිළිපන් දේශයක් බිහිකර ගැනීමෙහි ලා විවෘත මනසකින් දක්වන ලද අදහස් හා සියලු ආකාරයෙන් වූ දායකත්වය කෘතවේදීව සිහිපත් කරමු.

මහජනතාව දැනුවත් කිරීමෙහි ලා මාධ්‍ය විසින් ලබා දෙන ලද දායකත්වයත්, මුද්‍රිත මාධ්‍ය, විද්‍යුත් මාධ්‍ය හා සමාජ මාධ්‍ය හරහා දැනුවත් වී ලිපි මඟින්, ඍජුව සම්බන්ධ වෙමින් තම අත්දැකීම්, යෝජනා හා අදහස් හුවමාරු කරගනිමින් මේ සඳහා සක්‍රියව දායකවූ පොදු මහජනතාවට ද අපගේ ස්තුතිය පිරිනැමේ.

ජාත්‍යන්තර හා ජාතික උපදේශකත්වයට විශේෂඥ සහාය ලබාදෙමින් සංවිධාන ශක්තිය ලබාදුන් ශ්‍රී ලංකා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනට හා කාර්ය මණ්ඩලයට මෙන්ම දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම සකස්කිරීමට මුල්‍ය දායකත්වය ලබාදුන් ජපාන රජයට ද කොමිෂන් සභාවේ තුතිය පුදමු.

එසේම දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම 2025-2029 සකස් කිරීමෙහි ලා අප්‍රතිහත සහයෝගය ලබාදුන්, භාෂා පරිවර්තකයන්, පිටු නිර්මාණ ශිල්පීන්, සංස්කාරකවරුන්, තාක්ෂණික නිලධාරීන් මෙන්ම මෙම සැලැස්ම එළිදැක්වීමෙහි ලා සහාය ලබාදුන් සියලු පාර්ශ්වයන් වෙත අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසන් සභාවේ හෘදයාංගම ස්තුතිය පුදකරනු ලැබේ. අවසාන වශයෙන් අල්ලස් දූෂණ නිවාරණ ක්‍රියාවලියට අතීතයේ සිට වත්මන දක්වා සහාය දෙමින් සියලු බර සිය උරමත තබාගන්නා අතීත, වර්තමාන, අනාගත කොමිෂන් සභා සියලු කොමසාරිස්වරු, අධ්‍යක්ෂ ජනරාල්වරු, නිලධාරීන් මෙන්ම කාර්ය මණ්ඩලය කෘතවේදීව සිහිපත් කරමු.

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ (UNDP) ශ්‍රී ලංකා ශාඛාව මඟින් ක්‍රියාත්මක ''දූෂණය වැළැක්වීමේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම තුළින් ආර්ථික යහපාල නතන්ත්‍රය ප්‍රවර්ධනය කිරීම'' යන ව්‍යාපෘතිය හරහා ජපාන රජයෙන් ලැබෙන ආධාර යටතේ මෙම මුද්‍රණය එළිදැක්වේ. තවද දූෂණ විරොධී ජාතික ක්‍රියාකාරී සැලැස්මේ අන්තර්ගතය අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ (CIABOC) වගකීමක් වන අතර එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ හෝ ජපන් රජයේ මතයන් කිසිදු අයුරකින් පිළිඹිබු නොවන බව සැලකිය යුතුය.



මත් කොවුලන් මෙන් අහේතුකව දොඩමළු නොවන, අවැසි බසක් මිස අනිසි බසක් නොදොඩා සිටින හේ, ව්‍යවහාර නාමයෙන් බස්සාය. බොහෝවුන් රාජ කතා චෝර කතාදියෙන් කල් මරන සඳ, නිහඬව ම සිටින්නට රිස්සාය. එසේ වුව, සඳ ඇති නැති සියලු රෑ කල, හාත්පස දැස් දී තීක්ෂණ විපරමට දස්සාය. එහෙයින් ම, අයුත්තක් වේදැයි - සොර සිතක් වේදැයි, මුර වැඩක යෙදෙන්නට කාට කාටත් වඩා හොඳ නිස්සාය. බස් තෙමේ ඇස් වසා, අන්ධකාරයේ අන් කිසිවකට හෝ කිසිවකුට චලනය වනු නොහේ. සුපිළිපන් සුවඳක් දරාගත් කඩුපුල් මලක්, අද හේ මුව දරා සිටියි. අන්ධකාරයෙහි පවා අවැඩක් කළ නොහැකි තරමේ සුපරීක්ෂාකාරීත්වයද, ආරක්ෂණය සහ අඛණ්ඩ නිරීක්ෂණය වෙනුවෙන් ද කැපකෙරෙයි. සුපිළිපන් ක්‍රියාධරයන් ද එබඳුය. පවිත්‍ර දේශයක් වෙනුවෙන් ඔවුහු තුන් තිස් පැයේ කැපවෙති.

ISBN 978-624-5040-21-6

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව
இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களைப் புலனாய்வு செய்வதற்கான ஆணைக்குழு
COMMISSION TO INVESTIGATE ALLEGATIONS OF BRIBERY OR CORRUPTION

CIABOC